# 5

# විදේශීය අංශයේ ප්‍රවණතා සහ ප්‍රතිපත්ති

## 5.1 සමස්ත නිරීක්ෂණ

**2015 වසරේ ශ්‍රී ලංකාවේ විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වය ගෝලීය ආර්ථිකයේ වෙනස්වීම් මෙන්ම දේශීය ආර්ථිකයේ සිදු වූ වෙනස්වීම් ගණනාවක් පිළිබිඹු කළේය.** විදේශීය ප්‍රවණතා සැලකීමේ දී, දියුණු සහ ප්‍රධාන නැගී එන වෙළඳපොළ ආර්ථිකයන්හි මන්දගාමී වර්ධනය, එක්සත් ජනපදයෙහි මූල්‍ය ප්‍රතිපත්තිය ක්‍රමයෙන් දැඩි කිරීම, මූල්‍ය වෙළඳපොළවල තත්ත්වය දැඩි වීම සහ නොසන්සුන් භූ-දේශපාලනික තත්ත්වයන් ආදී ගෝලීය ප්‍රවණතාවල බලපෑම වසර තුළ දී ශ්‍රී ලංකාවේ විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වයට අහිතකර බලපෑමක් ඇති කළේය. දේශීය ප්‍රවණතා සැලකීමේ දී, අධික රාජ්‍ය මූල්‍ය ප්‍රසාරණය හේතුවෙන් පරිභෝජන ඉල්ලුම ඉහළ යෑම, ප්‍රාග්ධන ගෙවීම් සමඟ විදේශීය සෘජු ආයෝජන මන්දගාමී වීම සහ ජාතික මැතිවරණ දෙකක් හමුවේ ප්‍රතිපත්තිවල පැවති අවිනිශ්චිතභාවය ද 2015 වසරේ දී විදේශීය අංශය වෙත පීඩනයක් ඇති කළේය.

**ඉහත දැක්වූ ප්‍රවණතා හමුවේ, ගෙවුම් තුලනයේ ජංගම සහ මූල්‍ය ගිණුම් වෙත වූ ලැබීම් අපේක්ෂිත මට්ටමට වඩා අඩු වීමත්, විදේශීය විනිමය ගෙවීම් ඉහළ යෑමත් හේතුවෙන් 2015 වසරේ දී ශ්‍රී ලංකාවේ විදේශීය අංශය මන්දගාමී ක්‍රියාකාරිත්වයක් පිළිබිඹු කළේය.** ශුද්ධ විදේශීය ලැබීම් අඩු මට්ටමක පැවතිය ද, 2015 වසරේ දී ජංගම ගිණුමේ හිඟය 2014 වසරේ දී වූ එ.ජ. ඩොලර් බිලියන 2.0 ක මට්ටමේ සිට විශාල වශයෙන් වෙනස් නොවී පැවති අතර, ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස සියයට 2.4 ක් දක්වා සුළු වශයෙන් අඩු විය. ඉන්ධන හැර අනෙකුත් භාණ්ඩ ආනයන වියදම වැඩි වීම සහ අපනයන ආදායම අඩු වීම හේතුවෙන් 2015 වසරේ වෙළඳ භාණ්ඩ ගිණුමේ හිඟය තවදුරටත් වැඩි වුවද, ඉන්ධන ආනයන වියදම අඩු වීම හේතුවෙන් විශාල හිඟයක් ඇති වීම වැළකුණි. වසර තුළ දී පොලී ගෙවීම් වැඩි වීමත් සමඟ ප්‍රාථමික ආදායම් ගිණුමේ හිඟය ද ඉහළ ගියේය. කෙසේ නමුත්, සේවා සහ ද්විතීයික ආදායම් ගිණුම්වල අතිරික්තයන් ජංගම ගිණුමේ හිඟය ආසන්න වශයෙන් පසුගිය වසරේ දී පැවති මට්ටමේ ම පැවතීමට හේතු විය. එක්සත් ජනපදයේ පොලී අනුපාතික ඉහළ යනු ඇතැයි වූ අපේක්ෂාව සහ ඉන් අනතුරුව පොලී අනුපාතික ඉහළ යෑම හේතුවෙන් ණය කාණ්ඩයට අයත් නොවන ලැබීම් සහ රජය වෙත වූ ලැබීම් අඩු වීමත්, රජයේ සුරැකුම්පත් වෙළඳපොළ තුළ වූ විදේශීය ආයෝජන ආපසු ලබා ගැනීමත් මූල්‍ය ගිණුම වෙත වූ ලැබීම් කෙරෙහි අහිතකර බලපෑමක් ඇති කළේය. එය 2015 වසරේ දී ගෙවුම් තුලනයේ එ.ජ. ඩොලර් මිලියන 1,489 ක සමස්ත හිඟයක් වාර්තා වීමට හේතු විය. ගෙවුම් තුලනයෙහි මෙම මන්දගාමී ක්‍රියාකාරිත්වය දළ නිල සංචිත පහළ යෑම මගින් ද පිළිබිඹු වූ අතර, 2015 වසර අවසානයේ දී දළ නිල සංචිත ප්‍රමාණය එ.ජ. ඩොලර් බිලියන 7.3 ක් ලෙස මාස 4.6 ක ආනයන පියවා ගැනීමට තරම් ප්‍රමාණවත් විය. මේ අතර, වසරේ පළමු මාස අට තුළ දී එ.ජ. ඩොලරයට සාපේක්ෂව

සියයට 2.42 කින් අවප්‍රමාණය වූ රුපියල, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සැප්තැම්බර් මාසය ආරම්භයේ සිට විනිමය අනුපාතිකය වඩා නම්‍යශීලීව තීරණය වීමට ඉඩහැරීම සඳහා තීරණය කිරීමත් සමඟ වසරේ අවසාන මාස හතරේ දී ඉහළ අගයකින් අවප්‍රමාණය විය. ශ්‍රී ලංකා රුපියල වසර තුළ දී එ.ජ. ඩොලරයට එරෙහිව සියයට 9.03 කින් අවප්‍රමාණය විය. විනිමය අනුපාතිකය වඩා නම්‍යශීලීව තීරණය වීමට ඉඩහැරීම, 2015 වසර අවසාන වනවිට වෙළඳ සහ ජංගම ගිණුමේ හිඟයයන් පුළුල් වීම පාලනය වීමට උපකාරී වූ නමුත් කෙටි කාලීන ප්‍රාග්ධන ගෙවීම් 2016 වසරේදී ද අඛණ්ඩව සිදු විය.

**සැප්තැම්බර් මාසය ආරම්භයේ දී විනිමය අනුපාතික ප්‍රතිපත්තිය වෙනස් කිරීමෙහි මූලික අරමුණු වූයේ ආනයන ඉල්ලුම අඩු කිරීම, දළ නිල සංචිත හිතකර මට්ටමක පවත්වා ගෙන යෑම සහ චීනයේ යුවාන් සහ ඉන්දියානු රුපියල ඇතුළුව ජාත්‍යන්තර මුදල් වර්ග කිහිපයක් සැලකියයුතු ලෙස අවප්‍රමාණය වීම හමුවේ බාහිර තරගකාරිත්වය පවත්වාගෙන යෑමය.** එයට අමතරව, 2015 වසරේ දී රථවාහන ආනයනයේ දී අදාළ වටිනාකම මත අනුපාතය (Loan to value ratio) උපරිමයකට සීමා කිරීම සහ මෝටර් රථ ආනයනය සඳහා ණයවර ලිපි විවෘත කිරීමේ දී අවම ආන්තික මුදල් තැන්පතු අවශ්‍යතාව සියයට 100 ක් දක්වා ඉහළ නැංවීම වැනි ප්‍රතිපත්තිමය තීරණවල අරමුණ වූයේ ද ආනයන සඳහා වූ අධික ඉල්ලුම පාලනය කිරීමය. මෙම ප්‍රතිපත්තිමය තීරණ, 2016 වසර ආරම්භයේ දී මුදල් ප්‍රතිපත්තිය දැඩි කිරීමත් සමඟ වසර තුළ දී විදේශ අංශය ශක්තිමත් වීම සඳහා දායක වනු ඇතැයි අපේක්ෂා කෙරෙයි. අපනයන වැඩි කිරීමත්, රටෙහි පවත්නා අපනයන ශක්‍යතාවය ශක්තිමත් කිරීමත්, විදේශීය සෘජු ආයෝජන වැනි ණය නොවන මූල්‍ය ප්‍රවාහයන් ආකර්ෂණය කර ගැනීමත් සඳහා වන ප්‍රතිපත්තිමය තීරණ ගැනීම මැදි කාලීනව විදේශ අංශයේ තිරසාර වර්ධනයක් ඇති කිරීම සඳහා අත්‍යවශ්‍ය වේ. මේ අතර, රාජ්‍ය මූල්‍ය විශාල වශයෙන් ප්‍රසාරණය වීම හේතුවෙන් ගෙවුම් තුලනය මත ඇති වන කෙටි කාලීන බලපෑම් පාලනය කිරීම සඳහා දැඩි රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තීන් ක්‍රියාත්මක කිරීම අවශ්‍ය වේ. මෙවැනි ක්‍රියාමාර්ග තුළින් විදේශීය අංශය ශක්තිමත් කිරීම සඳහා දිගු කාලීන විදේශීය ප්‍රාග්ධනය ආකර්ෂණය කර ගැනීමට අවශ්‍ය වන ආයෝජකයින්ගේ විශ්වාසය ඉහළ නංවා ගත හැකි වේ.

**5.1 සංඛ්‍යා සටහන**

**ගෙවුම් තුලන විශ්ලේෂණාත්මක ඉදිරිපත් කිරීම**

**(BPM6 සංස්කරණයට අනුව සම්මත ඉදිරිපත් කිරීම)**

| ශීර්ෂය | එ.ජ.ඩොලර් මිලියන | | රුපියල් මිලියන | |
|---|---|---|---|---|
| | 2014 (අ) | 2015 (ආ) | 2014 (අ) | 2015 (ආ) |
| **ජංගම ගිණුම (ශුද්ධ)** | **-1,988** | **-2,009** | **-259,436** | **-274,562** |
| **වෙළඳ ගිණුම** | **-8,287** | **-8,430** | **-1,081,987** | **-1,146,676** |
| අපනයන | 11,130 | 10,505 | 1,453,176 | 1,425,791 |
| ආනයන | 19,417 | 18,935 | 2,535,163 | 2,572,467 |
| **සේවා (ශුද්ධ)** | **1,880** | **2,325** | **245,496** | **316,170** |
| ලැබීම් | 5,605 | 6,397 | 731,863 | 869,634 |
| ගෙවීම් | 3,725 | 4,072 | 486,367 | 553,464 |
| **ප්‍රාථමික ආදායම් (ශුද්ධ)** | **-1,808** | **-2,097** | **-236,073** | **-286,137** |
| ලැබීම් | 155 | 127 | 20,263 | 17,253 |
| ගෙවීම් | 1,963 | 2,224 | 256,336 | 303,390 |
| **ද්විතීයික ආදායම් (ශුද්ධ)** | **6,227** | **6,193** | **813,128** | **842,082** |
| ද්විතීයික ආදායම් : ලැබීම් | 7,046 | 7,007 | 920,035 | 952,568 |
| සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ | 7,018 | 6,980 | 916,344 | 948,957 |
| රජයේ සංක්‍රාම | 28 | 27 | 3,691 | 3,610 |
| ද්විතීයික ආදායම් : ගෙවීම් | 819 | 814 | 106,906 | 110,486 |
| **ප්‍රාග්ධන ගිණුම (ශුද්ධ)** | **58** | **46** | **7,684** | **6,256** |
| ප්‍රාග්ධන ගිණුම : ලැබීම් | 73 | 71 | 9,586 | 9,562 |
| ප්‍රාග්ධන ගිණුම : ගෙවීම් | 15 | 24 | 1,903 | 3,306 |
| **ජංගම සහ ප්‍රාග්ධන ගිණුම (ශුද්ධ)** | **-1,929** | **-1,962** | **-251,752** | **-268,306** |
| **මූල්‍ය ගිණුම (ශුද්ධ)** | **-1,536** | **-2,271** | **-200,261** | **-338,298** |
| **සෘජු ආයෝජන : වත්කම්** | **67** | **53** | **8,725** | **7,236** |
| **සෘජු ආයෝජන : වගකීම්** | **894** | **681** | **116,721** | **93,681** |
| **විවිධ ආයෝජන : වත්කම්** | **-0.2** | **0.02** | **-29** | **3** |
| ණය සුරැකුම්පත් | -0.2 | 0.02 | -29 | 3 |
| **විවිධ ආයෝජන : වගකීම්** | **2,065** | **689** | **269,768** | **102,286** |
| හිමිකම් | 178 | -58 | 23,275 | -7,835 |
| ණය සුරැකුම්පත් | 1,887 | 747 | 246,492 | 110,121 |
| මූල්‍ය ව්‍යුත්පන්න | - | - | - | - |
| **අනෙකුත් ආයෝජන : වත්කම්** | **973** | **553** | **127,197** | **77,021** |
| මුදල් සහ තැන්පතු | 276 | 143 | 36,115 | 21,127 |
| වෙළඳ ණය සහ අත්තිකාරම් | 383 | 166 | 50,000 | 21,866 |
| අනෙකුත් ගිණුම් ලැබිය යුතු | 314 | 244 | 41,082 | 34,028 |
| **අනෙකුත් ආයෝජන : වගකීම්** | **1,165** | **1,857** | **152,107** | **269,228** |
| මුදල් සහ තැන්පතු | -292 | 1,457 | -38,152 | 209,324 |
| ණය | 1,713 | 734 | 223,475 | 99,315 |
| මහ බැංකුව | -719 | -507 | -93,904 | -68,775 |
| තැන්පතු භාරගන්නා ආයතන | 1,358 | 787 | 177,243 | 107,301 |
| රජය | 646 | 470 | 84,199 | 63,951 |
| අනෙකුත් අංශ | 429 | -16 | 55,937 | -3,162 |
| වෙළඳ ණය සහ අත්තිකාරම් | -407 | -376 | -53,145 | -51,067 |
| අනෙකුත් ගිණුම් ගෙවිය යුතු | 151 | 41 | 19,929 | 11,657 |
| විශේෂ ගැනුම් හිමිකම් (වි.ගැ.හි) | - | - | - | - |
| **සංචිත වත්කම්** | **1,548** | **350** | **202,442** | **42,637** |
| මූල්‍ය රත්‍රන් | 9 | -39 | 1,154 | -5,156 |
| විශේෂ ගැනුම් හිමිකම් | -6 | -2 | -748 | 16 |
| ජා.මූ.අරමුදලේ සංචිත මට්ටම | - | - | - | - |
| අනෙකුත් සංචිත වත්කම් | 1,545 | 391 | 202,036 | 47,777 |
| මුදල් සහ තැන්පතු | 496 | 116 | 64,720 | 12,566 |
| සුරැකුම්පත් | 1,049 | 275 | 137,316 | 35,183 |
| **ශුද්ධ වැරදීම් හා අත්හැරීම්** | **393** | **-308** | **51,492** | **-69,993** |
| **සමස්ත ශේෂය (ඇ)** | **1,369** | **-1,489** | **180,904** | **-129,654** |
| **ද.දේ.නි. යේ ප්‍රතිශතයක් ලෙස** | | | | |
| වෙළඳ ගිණුම | -10.4 | -10.2 | | |
| භාණ්ඩ හා සේවා | -8.0 | -7.4 | | |
| ජංගම ගිණුම | -2.5 | -2.4 | | |
| ජංගම හා ප්‍රාග්ධන ගිණුම | -2.4 | -2.4 | | |

(අ) සංශෝධිත

(ආ) තාවකාලික

(ඇ) සමස්ත ශේෂය ගණනය කිරීම සඳහා 5.11 සංඛ්‍යා සටහන පරිශීලනය කරන්න.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## 5.2 විදේශ වෙළඳ ප්‍රතිපත්තිය සහ ආයතනික සහය

**ගෝලීය ආර්ථිකය හා ශ්‍රී ලංකාව අතර ඇති සබඳතාවය වැඩිදියුණු කිරීම කෙරෙහි යොමු වූ විදේශ වෙළඳ ප්‍රතිපත්තිය 2015 වසරේදී ද අඛණ්ඩව ක්‍රියාත්මක විය.** විදේශීය අංශයේ අපේක්ෂාවන් හා ක්‍රියාකාරීත්වය වැඩිදියුණු කිරීම උදෙසා විදේශ වෙළඳ ප්‍රතිපත්ති රාමුවක් ඇති කිරීම සඳහා රජය විසින් පුළුල් ව්‍යුහාත්මක වෙනස්කම් යෝජනා කළ වසරක් බවට 2015 වසර හැඳින්විය හැකිය. වෙළඳාම තීරණය වන නීති හා රෙගුලාසි වෙනස් කිරීමට ප්‍රයත්න දැරීම, වෙළඳ ගිවිසුම් ඇති කිරීම මගින් විදේශ වෙළඳපොළ වෙත ශක්තිමත් ප්‍රවේශයක් ඇති කිරීම, උපායමාර්ගික වෙළඳ ප්‍රවර්ධනය, වෙළඳ හා තීරුබදු ප්‍රතිපත්තිය තවදුරටත් තාර්කීකරණය කිරීම සහ ජාත්‍යන්තර ආයෝජන හා විදේශ වෙළඳාම ධෛර්යමත් කිරීම අරමුණු කරමින් නොබැඳි විදේශ ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම මෙසේ ගන්නා ලද ක්‍රියාමාර්ග අතර ප්‍රධාන විය. විදේශ වෙළඳ ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීමේ දී ප්‍රධාන වශයෙන් අපනයන ප්‍රවර්ධනය සඳහා ප්‍රමුඛත්වය ලබා දුන් අතර, ආනයන තාර්කීකරණය සඳහා ද ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ගන්නා ලදී.

**පවතින වෙළඳ ගිවිසුම් ඵලදායී ලෙස උපයෝජනය ශක්තිමත් කිරීම, නව වෙළඳ ගිවිසුම්වලට එළඹීමට ඇති හැකියාව සොයා බැලීම, වෙළඳපොළ පිළිබඳ පර්යේෂණ ක්‍රියාකාරකම් ශක්තිමත් කිරීම සහ විදේශ වෙළඳපොළවල සිදු කරන අලෙවිකරණ හා ප්‍රවර්ධන වැඩසටහන් ඉහළ නැංවීම යනාදිය, ශ්‍රී ලංකාවේ නිෂ්පාදන විදේශ වෙළඳපොළ වෙත යොමු කිරීම සඳහා වසර තුළ දී ගත් ක්‍රියාමාර්ග කිහිපයකි.** විශාල ආර්ථික වෙත වරණීය ප්‍රවේශ ලබා ගැනීමට හා ආයෝජන ප්‍රවර්ධනය සඳහා උපකාරී වන ද්විපාර්ශ්වික ගිවිසුම්වලට එළඹීම, ශ්‍රී ලංකාව වැනි කුඩා, විවෘත ආර්ථිකයක් ඇති රටකට තීරණාත්මක සාධකයක් වේ. එබැවින්, සමීපත්වය මත ඇති වී ඇති ඉහළ තරගකාරීත්ව වාසි සලකා බලා ශ්‍රී ලංකාව ඉන්දියාව සමඟ ඇති කර ගෙන ඇති නිදහස් වෙළඳ ගිවිසුමෙහි පරාසය වඩා පුළුල් හා බලවත් කරගත යුතු වන අතර, පාකිස්ථානය සමඟ පවතින නිදහස් වෙළඳ ගිවිසුමෙන් ද වැඩි ප්‍රයෝජනයක් ලබා ගැනීමට කටයුතු කළ යුතුය. ශ්‍රී ලංකාව තහනම් මසුන් ඇල්ලීමේ ක්‍රම භාවිතය පිළිබඳ ජාත්‍යන්තර නීතිවලට අනුගත නොවීම සහ ධීවර කර්මාන්තයෙහි යොදා ගන්නා පාලන ක්‍රම ප්‍රමාණවත් නොවීම යන සැකය මත, යුරෝපා සංගමය මගින් 2015 ජනවාරි මස මැද සිට ශ්‍රී ලංකාවෙන් ආනයනය කරන මත්ස්‍ය නිෂ්පාදිත තහනම් කිරීම, යුරෝපා සංගමය (EU) මගින් 2010 වසරේ දී 'විශේෂ ප්‍රතිලාභ සහිත වෙළඳ වරණයන් පිළිබඳ පොදු ක්‍රමය' (GSP+) ශ්‍රී ලංකාවට අත්හිටුවීමෙන් අනතුරුව ශ්‍රී ලංකාවේ විදේශ වෙළඳ අංශයෙහි ඇති වූ ප්‍රධානතම අවහිරතාවය වශයෙන් දැක්විය හැකිය. කෙසේ වුවද, නව රජය EU-GSP+ පහසුකම මගින් ලැබිය හැකි ඉහළ ආර්ථික ප්‍රතිලාභ සලකා බලා එම පහසුකම නැවත ලබා ගැනීම සඳහා අයදුම් කිරීමට තීරණය කරන ලදී. ඒ අනුව, EU-GSP+ නැවත ලබා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සැකසීම සඳහා වාණිජ දෙපාර්තමේන්තුවේ සම්බන්ධීකරණයෙන් යුතු අනුකාරක සභාවක් 2015 මාර්තු මාසයේ දී පත්කරන ලදී. වසර තුළ දී, එක්සත් ජාතීන්ගේ 27 වන ජාත්‍යන්තර සම්මුතිය ක්‍රියාත්මක කිරීමට අදාළ රේඛීය ආයතන සහ අමාත්‍යාංශවලින් තොරතුරු විමසීමේ සාකච්ඡා මාලාවක් පැවැත්වූ අතර, යුරෝපා සංගමය මගින් මතු කරන ලද ගැටලු පිළිබඳ විස්තර සහිත වාර්තාවක් ද ඇතුළත් කෙටුම්පත් අයදුම්පතක් සකස් කරන ලදී. තවද, යුරෝපා සංගමය ශ්‍රී ලංකා මත්ස්‍ය නිෂ්පාදිත සඳහා පැනවූ තහනම ඉවත් කර ගැනීම සඳහා සාකච්ඡා පවත්වන ලදී. 2015 වසර තුළ දී ඉහත දෙඅංශයෙහිම විශාල ප්‍රගතියක් ලබාගෙන ඇති අතර, EU-GSP+ යටතේ යුරෝපා වෙළඳපොළ වෙත නැවත පිවිසීම සඳහා අත්‍යවශ්‍ය ප්‍රධානතම කටයුත්තක් වන මානව හිමිකම් ගැටලු නිරාකරණයේ දී පෙන්නුම් කරන ලද කැප කිරීම සලකා බැලීමේ දී, 2016 වසර අවසානයේ දී GSP+ සහනය නැවත ලබාගත හැකි වනු ඇතැයි අපේක්ෂා කෙරේ. තවද, යුරෝපා සංගමය නිශ්චිතව දක්වා ඇති අවශ්‍යතාවයන්ට සහ ජාත්‍යන්තර නීතිවලට අනුකූල වන පරිදි ශ්‍රී ලංකාවේ ධීවර කර්මාන්තය වැඩිදියුණු කිරීමට අවශ්‍ය ඉදිරි පියවර රැසක් තබා ඇති අතර, ඒ යටතේ ශ්‍රී ලංකා යාත්‍රා ජාත්‍යන්තර මුහුදේ මසුන් ඇල්ලීමේ දී තහනම් ප්‍රදේශවල මසුන් ඇල්ලීමෙන් වැළකී සිටීමට උපකාරී වන යාත්‍රා අධීක්ෂණ පද්ධතියක් (Vessel Monitoring System) ඇති කිරීම සඳහන් කළ හැකිය. මෙවැනි ප්‍රයත්න සමඟ, යුරෝපා වෙළඳපොළ වෙත මත්ස්‍ය අපනයනය සඳහා ඇති තහනම 2016 වසර මැද වන විට ඉවත් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මේ අතර, ඇමෙරිකා එක්සත් ජනපදය ඔවුන්ගේ GSP වැඩසටහනෙහි කාලය ඉකුත් වී වසර 2 කට ආසන්න වන 2015 ජුනි මස දී 'වරණීය වෙළඳාම දීර්ඝ කිරීමේ පනත' (Trade Preferences Extension Act) අතීතයේ සිට බලපැවැත්වෙන පරිදි අත්සන් කිරීමෙන් නැවත බලගන්වන ලදී. තවද, අපනයන වෙළඳපොළ ලෝකයේ දක්ෂිණ ආර්ථික (දියුණු වෙමින් පවතින රටවල්) වෙත විවිධාංගීකරණයට ලක් කරමින් 'ගෝලීය වරණීය වෙළඳාම් ක්‍රමය'[1] (Global System of

1 ගෝලීය වරණීය වෙළඳාම් ක්‍රමය දියුණු වෙමින් පවතින රටවල් අතර 1989 දී ඇතිකර ගත් ගිවිසුමකි. එම ගිවිසුම වෙළඳාම සහ සංවර්ධනය සඳහා වූ එක්සත් ජාතීන්ගේ සමුළුව (UNCTAD) හි අනුබලය මත දකුණු-දකුණු රටවල් (දියුණු වෙමින් පවතින රටවල්) අතර ආර්ථික සහයෝගීතාවය සහ වෙළඳාම ඉහළ නැංවීම අරමුණු කරගත් වරණීය තීරු බදු ගිවිසුමකි.

Trade Preferences) යටතේ සිදු කළ අපනයන 2015 වසරේ දී සැලකියයුතු ලෙස ඉහළ ගියේය. මෙම ක්‍රමය යටතේ ශ්‍රී ලංකාව විසින් ප්‍රධාන වශයෙන් මෙක්සිකෝව සහ පේරු යන රටවලට කළ අපනයන 2014 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 19 සිට 2015 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 50 ක් දක්වා ඉහළ ගියේය.

**ද්විපාර්ශ්වික වෙළඳ ගිවිසුම් උපයෝජනය කිරීම සම්බන්ධයෙන් 2015 වසරේ දී සතුටුදායක ප්‍රගතියක් දක්නට ලැබුණි.** ශ්‍රී ලංකා වාණිජ දෙපාර්තමේන්තුව විසින් ප්‍රධාන වශයෙන් ශ්‍රී ලංකාවේ වෙළඳාම සඳහා බලපෑම් ඇති කළ හැකි රටවල් සමඟ පවතින නිදහස් වෙළඳ ගිවිසුම් (FTA), වරණීය වෙළඳ ගිවිසුම් (PTA), සහ විස්තීරණ ආර්ථික සහයෝගිතා ගිවිසුම්වල (CEPA) ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් අඛණ්ඩව ඇගයීම් කටයුතු සිදු කරන ලදී. තවද, FTA, PTA සහ CEPA පිළිබඳ ඇති වන ගැටලු සමාලෝචනය කිරීමේ රැස්වීම් පැවැත්වූ අතර, චීනය, ඊජිප්තුව, රුසියාව, මැලේසියාව, තුර්කිය හා කුවේට් යන රටවල් සමඟ ඒකාබද්ධ කොමිෂන් (Joint Commissions) පවත්වන ලදී. එසේම, 2015 වසරේ දී ශ්‍රී ලංකා වාණිජ දෙපාර්තමේන්තුව විසින් සිදු කළ අනෙකුත් වැදගත් කාර්යයන් ලෙස ඇමෙරිකා එක්සත් ජනපදය සමඟ වෙළඳ හා ආයෝජන රාමුව පිළිබඳ ගිවිසුම (TIFA) පිළිබඳ කටයුතු කිරීම, යුරෝපා සංගමය සමඟ සහයෝගීතාවය වර්ධනය කර ගැනීමට කටයුතු කිරීම සහ වෙළඳ ප්‍රජාව දැනුම්වත් කිරීමේ වැඩමුළු පැවැත්වීම යනාදිය සඳහන් කළ හැකිය. පවතින නිදහස් වෙළඳ ගිවිසුම්වල කොන්දේසි පිළිබඳව අඛණ්ඩව සාකච්ඡා පැවැත්වීම ද වාණිජ දෙපාර්තමේන්තුව වෙත පැවරුණු අතර, එහි ප්‍රතිඵලයක් ලෙස ඉන්දු-ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (ISFTA) යටතේ ශ්‍රී ලංකාව විසින් ඉන්දියාව වෙත කරනු ලැබූ අපනයන 2014 වසරේ පැවති එ.ජ. ඩොලර් මිලියන 354 සිට 2015 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 406 ක් දක්වා වර්ධනය වූ බවට ඇස්තමේන්තු කර ඇත. 2015 වසරේ දී ශ්‍රී ලංකාව විසින් ඉන්දියාව වෙත සිදු කළ මුළු අපනයනවලින් සියයට 63 ක් පමණ ඉන්දු - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම යටතේ සිදු කර තිබේ. රජය විසින් සැලසුම්කර ඇති ඉන්දු-ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුමෙහි තවත් කොටසක් ලෙස ඉන්දියාව සමඟ ඇතිකර ගැනීමට යෝජිත ආර්ථික හා තාක්ෂණික සහයෝගීතා ගිවිසුම (ETCA) දෙරට අතර ආර්ථික සහයෝගීතාවය පුළුල් කර ගැනීම සඳහා ඉදිරිපත් කර ඇති තීරණාත්මක ආර්ථික ප්‍රතිසංස්කරණයක් ලෙස දැක්විය හැකිය. පාකිස්ථාන-ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (PSFTA) යටතේ 2015 වසරේ දී ශ්‍රී ලංකාව විසින් එ.ජ. ඩොලර් මිලියන 59 ක වටිනාකමින් යුතු භාණ්ඩ පාකිස්ථානය වෙත අපනයනය කළ බවට ඇස්තමේන්තු කර ඇති අතර එය ශ්‍රී ලංකාව විසින් පාකිස්ථානය වෙත සිදු කළ මුළු අපනයනවලින් සියයට 81 ක් පමණ විය. තවද, දැනට සාකච්ඡා මට්ටමට පැමිණ ඇති යෝජිත චීන-ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (CSFTA) හරහා චීනය සමඟ ඇති ද්විපාර්ශ්වික වෙළඳ සබඳතා පුළුල් කර ගැනීම සඳහා ශ්‍රී ලංකාව අඛණ්ඩව ප්‍රයත්න දරන ලදී. ඒ අනුව, යෝජිත චීන-ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුමෙහි සාකච්ඡා වටයක් 2015 දෙසැම්බර් මාසයේ දී පැවැත්වූ අතර, එහිදී දෙරට විසින් 'ඉතා සංවේදී නිෂ්පාදිත', 'සාමාන්‍ය වශයෙන් සංවේදී නිෂ්පාදිත' සහ 'සාමාන්‍ය නිෂ්පාදිත' යනාදී ලෙස ගිවිසුමට ඇතුළත් කළ යුතු නිෂ්පාදන ලැයිස්තුව පිළිබඳ සාකච්ඡා කරන ලදී. යෝජිත චීන-ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම යටතේ ප්‍රධාන වශයෙන් නිෂ්පාදිත රට පිළිබඳව වූ කොන්දේසි (rules of origin) සහ ඇතුළත් කළ යුතු භාණ්ඩ ලැයිස්තුව පිළිබඳව තවදුරටත් සාකච්ඡා සිදු කළ යුතුව ඇත.

**2015 වසරේ දී කලාපීය සහ බහුපාර්ශ්වීය ගිවිසුම් යටතේ වූ වෙළඳාම ද අඛණ්ඩව සිදු කරන ලදී.** දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම (SAFTA) යටතේ 2014 වසරේ දී සිදු කරන ලද එ.ජ. ඩොලර් මිලියන 13 ක අපනයන සමඟ සැසඳීමේ දී, ප්‍රධාන වශයෙන් ඉන්දියාව වෙත සිදු කළ කළු ගම්මිරිස් අපනයනය ඉහළ යෑම හේතුවෙන් 2015 වසරේ දී එය එ.ජ. ඩොලර් මිලියන 15 ක් දක්වා ඉහළ ගොස් ඇති බවට ඇස්තමේන්තු කර ඇත. නිෂ්පාදිත රට තහවුරු කර ගැනීම පිළිබඳව යාන්ත්‍රණයක් සකස් කිරීම, තීරුබදු අයිතම 100 ක් දක්වා සංවේදී භාණ්ඩ ලැයිස්තුව අඩු කිරීම මගින් තවදුරටත් වෙළඳ බාධක ලිහිල් කිරීම සහ දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුමෙහි අවසන් දැක්ම යනාදී කරුණු සාකච්ඡා කිරීම සඳහා 2015 වසරේ දී දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුමට අදාළ නිළ මට්ටමේ සාකච්ඡා තුනක් පැවැත්විණි. 2015 වසර තුළ දී, ආසියා-ශාන්තිකර වෙළඳ ගිවිසුම (Asia-Pacific Trade Agreement-APTA) යටතේ ස්ථාවර කමිටු රැස්වීම් (Standing Committee Meetings) වාර තුනකට ශ්‍රී ලංකාව සාර්ථක ලෙස සහභාගී වූ අතර, එහිදී තීරු බදු සහන වැඩි කිරීම, නිෂ්පාදිත රට පිළිබඳව වූ කොන්දේසි ලිහිල් කිරීම හා වෙළඳාම සඳහා පහසුකම් සැලසීම, ආයෝජනය සහ සේවා සඳහා වන එකඟතා රාමුව ක්‍රියාත්මක කිරීමේ පෙර දැක්ම යන කරුණු සාකච්ඡා කරන ලදී. මෙම ගිවිසුම යටතේ ශ්‍රී ලංකාව විසින් 2014 වසරේ දී සිදු කළ එ.ජ. ඩොලර් මිලියන 120 ක අපනයන හා සැසඳීමේ දී එය 2015 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 119 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. ආසියා-ශාන්තිකර කලාපයේ සංවර්ධනය වෙමින්

පවතින රටවල් අතර වරණීය වෙළඳාම වෙනුවෙන් ඇතිකර ගත් පැරණිතම වෙළඳ ගිවිසුම ආසියා-ශාන්තිකර වෙළඳ ගිවිසුම වන අතර, වර්තමානයේ බංගලාදේශය, චීනය, ඉන්දියාව, ලාඕසය, දකුණු කොරියාව, මොන්ගෝලියාව සහ ශ්‍රී ලංකාව සාමාජිකත්වය දරනු ලබයි. ආසියා-ශාන්තිකර වෙළඳ ගිවිසුමේ සිටින සාමාජිකයින් අතුරින් ශ්‍රී ලංකාවේ අපනයන සඳහා වන ප්‍රධාන වෙළඳපොළ චීනය වන අතර, ගිවිසුම යටතේ සිදු කළ මුළු අපනයනවලින් සියයට 76 ක් පමණ චීනය වෙත සිදු කළ අපනයන විය. තවද, 2010 වසරේ දී, පැවති 16 වන සාක් සමුළුවේ දී සාක් කලාපීය වෙළඳාම සේවා අංශය වෙත තවදුරටත් පුළුල් කිරීමේ පියවරක් ලෙස සේවා වෙළඳාම පිළිබඳ සාක් ගිවිසුම (SAARC Agreement on Trade in Services-SATIS) අත්සන් කළ අතර, 2015 වසරේ දී පැවති 11 වන විශේෂඥ මණ්ඩල හමුවීමේ දී සාමාජික රටවල් විසින් ගිවිසුමේ බැඳීම් පිළිබඳ උපලේඛන (National Schedules of Committments) සැකසීම අවසන් කිරීමේ කටයුතු සාකච්ඡා කරන ලදී.

**බෲනායි, චිලී, නවසීලන්තය, සිංගප්පූරුව, ඕස්ට්‍රේලියාව, කැනඩාව, ජපානය, මැලේසියාව, මෙක්සිකෝව, පේරු, වියට්නාමය සහ ඇමෙරිකා එක්සත් ජනපදය යන පැසිෆික් කලාපයේ පිහිටි රටවල් 12 ක නායකයන්ගේ එකඟතාවයෙන් යුතුව 2015 ඔක්තෝබර් මාසයේ දී එළඹි පැසිෆික් කලාපීය හවුල්කාර ගිවිසුම (Trans-Pacific Partnership-TPP), පසුගිය වසර 20 තුළ එළඹි ප්‍රබලතම වෙළඳ ගිවිසුමක් ලෙස ගෝලීය වෙළඳාමට නව පණක් ලබා දෙන ලදී.** පැසිෆික් කලාපීය හවුල්කාර ගිවිසුම යනු කාර්මික, කෘෂිකාර්මික, සේවා, ආයෝජන, පාරිසරික සහ කම්කරු ගැටලු යනාදී ක්ෂේත්‍රවල වෙළඳාම සම්බන්ධ කරුණු ආවරණය වන්නා වූ, ගෝලීය ද.දේ.නි.යෙන් සියයට 40 ක් හෙවත් එ.ජ. ඩොලර් ට්‍රිලියන 28 ක් ඉක්මවූ අතිවිශාල කලාපීය එකඟතාවයකි. ශ්‍රී ලංකාවට පැසිෆික් කලාපීය හවුල්කාර ගිවිසුමේ සාමාජික රටවල් සමඟ මෙවැනි ආර්ථික හවුල්කාරිත්වයකින් ලබාගත හැකි වාසි ලෙස ශ්‍රී ලාංකික නිෂ්පාදන සඳහා නව වෙළඳපොළවල් විවෘත වීම, කලාපීය නිෂ්පාදනයට හා සැපයුම් දාමයන්ට දායක වීම සහ බදු නොවන වෙළඳ බාධක ඉවත් වීමෙන් ශ්‍රී ලංකාවේ ආර්ථිකය ලෝකය සමඟ බද්ධ වීම මගින් ශ්‍රී ලංකාවේ සුළු හා මධ්‍යම පරිමාණ අංශයන්ගේ දියුණු වීම යනාදිය හඳුනා ගෙන ඇත.

**නව අපනයන වෙළඳපොළ ආකර්ෂණය කර ගැනීම, දැනට පවතින වෙළඳපොළවල් තවදුරටත් පුළුල් කර ගැනීම සහ අපනයන භාණ්ඩ විවිධාංගීකරණය කිරීම සඳහා අපනයන කෙරෙහි යොමු වූ කර්මාන්තවල ආයෝජන ප්‍රවර්ධනය කරන අතරතුර, ආනයන තාර්කීකරණය කිරීම සඳහා 2015 වසරේ දී ක්‍රියාමාර්ග ගණනාවක් හඳුන්වා දෙන ලදී.** මේ සඳහා 2015 වසරේ දී ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය (EDB) ශ්‍රී ලංකාවේ අපනයන ප්‍රවර්ධනය සඳහාත්, 2020 දී අපනයන ආදායම එ.ජ. ඩොලර් බිලියන 20 ක ඉලක්කයක් සපුරා ගැනීමත් එමගින් රජයේ සංවර්ධන අරමුණු කරා ළඟා වීම සඳහා දායක වීමත් අරමුණු කරගත් නව උපායමාර්ගික ප්‍රවේශයක් ඇති කර ගන්නා ලදී. මෙම ඉලක්කය සපුරා ගැනීම සඳහා අපනයන සංවර්ධන මණ්ඩලය සිය නව 2015-2020 උපායමාර්ගික සැලසුමට සමගාමීව, හිතකර ව්‍යාපාරික පරිසරයක් නිර්මාණය කිරීම, භාණ්ඩ හා සේවා ජාත්‍යන්තර වෙළඳපොළ අවශ්‍යතාවයන්ට අනුගත කිරීම සහ වැඩිදියුණු කිරීම, අපනයන වෙළඳපොළ හඳුනා ගැනීම, ඇතුළු වීම, වැඩිදියුණු කිරීම සහ විවිධාංගීකරණය සඳහා අපනයනකරුවන්ට විශේෂිත සේවා සැපයීම, සැපයුම් දාම කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම සඳහා පහසුකම් සැලසීම, මෙන්ම විශේෂයෙන්ම පිට පළාත්වල ඇති අපනයන කෙරෙහි යොමු වූ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ප්‍රවර්ධනය ඉලක්ක කරගත් වැඩසටහන් කිහිපයක් ක්‍රියාවට නංවන ලදී. 'Pure Ceylon Cinnamon' සන්නාමය ප්‍රවර්ධනය පුළුල් කිරීමේ අරමුණින් යුතුව, සුදුසුකම් ලත් අපනයනකරුවන්ට ඔවුන්ගේ අගය එකතු කළ කුරුඳු නිෂ්පාදිත අපනයන සඳහා 'Pure Ceylon Cinnamon' ලාංඡනය යොදා ගැනීමට අවශ්‍ය බලපත්‍ර අපනයන සංවර්ධන මණ්ඩලය මගින් නිකුත් කරන ලදී. එසේම, 2015 අගෝස්තු මාසයේ දී ආසියානු වෙළඳ ප්‍රවර්ධන සමුළුවෙහි සත්කාරකත්වය ප්‍රථම වරට ශ්‍රී ලංකාවට ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයට හැකි විය. මේ අතර, කෘෂිකාර්මික, ධීවර කර්මාන්ත යන අංශ සහ සේවා අපනයන සංවර්ධනය සඳහා වැඩසටහන් මාලාවක් 2015 වසරේ දී ක්‍රියාත්මක කරන ලදී. ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව (SLECIC) අපනයනකරුවන් උදෙසා රටවල් 160 ක වාණිජමය සහ දේශපාලනික අවදානම් ආවරණය වන පරිදි ණය රක්ෂණ පහසුකම් සැලසීම සඳහා අඛණ්ඩව කටයුතු කරන ලදී. ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව මගින් ලබාදුන් රක්ෂණ ආවරණවල මුළු වටිනාකම 2015 වසරේ දී රුපියල් බිලියන 27.8 ක් වූ අතර, එය 2014 වසරේ දී ලබාදුන් රුපියල් බිලියන 25.5 සිට සියයට 9 ක වර්ධනයකි. 2015 වසරේ දී ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව සපයන ලද මුළු රක්ෂණ පහසුකම්වලින් සියයට 47 ක් එක්සත් අරාබි එමීර් රාජ්‍යය, ඇමෙරිකා එක්සත් ජනපදය, එක්සත් රාජධානිය, ඉරානය සහ රුසියාව වැනි රටවල් සඳහා ලබා දී ඇත. ඒකාබද්ධ

ඇඟලුම් සංගමය (JAAF), ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය සමඟ එක්ව 2015 මැයි මාසයේ දී බ්‍රසීලයේ සාවෝ පවුලෝ නගරයේ පැවති Brazil International Apparel Sourcing Show-2015 සඳහා නියෝජිත පිරිසක් සහභාගී කරවූ අතර, එය විශේෂයෙන්ම ඇමෙරිකා එක්සත් ජනපදය, යුරෝපා සංගමය, නැගෙනහිර ආසියාව, ඕස්ට්‍රේලියාව සහ නවසීලන්තය වැනි ශ්‍රී ලංකාවේ ප්‍රධාන අපනයන ගමනාන්තයන්හි ඇඟලුම් සම්බන්ධ නිෂ්පාදකයන් හා ඉල්ලුම්කරුවන් සහභාගී වන විශාල හමුවක් ලෙස සැලකෙයි. දේශීය වශයෙන්, ශ්‍රී ලංකා නිර්මාණ ඇකඩමිය (Acadamy of Design) විසින් ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ සහ ඒකාබද්ධ ඇඟලුම් සංගමයේ සහය ඇතිව සංවිධානය කරන ලද ශ්‍රී ලංකා මෝස්තර ප්‍රදර්ශනය-2015 (Sri Lanka Design Festival-2015) හත් වැනි වරටත් 2015 නොවැම්බර් මාසයේ දී පැවැත් වූ අතර, එය මෙවර 'Design & Source Sri Lanka' යන තේමාව යටතේ, දකුණු ආසියානු කලාපයේ මෝස්තර හා නිර්මාණ කේන්ද්‍රස්ථානයක් ලෙස ශ්‍රී ලංකාවට හිමි තැන ළඟා කර ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ ඇඟලුම් කර්මාන්තයේ ඇති ශක්තිය හා නිර්මාණ හැකියාවන් ඉස්මතු වන ආකාරයට පවත්වන ලදී. ඒ අතරම, "ශ්‍රී ලංකා මෝස්තර ප්‍රදර්ශනය" සඳහා විශේෂයෙන්ම යුරෝපයේ සහ දකුණු ඇමෙරිකාවේ ගැනුම්කරුවන්ගෙන් සමන්විත දූත පිරිසකගේ සහභාගීත්වය වෙනුවෙන් ඒකාබද්ධ ඇඟලුම් සංගමය සහ ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය සත්කාරකත්වය දරන ලද අතර, එමගින් මෙම විදේශ දූත පිරිස ශ්‍රී ලංකා මෝස්තර හා නිර්මාණ කර්මාන්තයේ ව්‍යාපාර සමඟ නව සම්බන්ධතා ඇති කර ගැනීමට ඉලක්ක කර ඇත.

**ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලය (Ceylon Chamber of Commerce) විසින් සංවිධානය කරන ලද 'ශ්‍රී ලංකා ආර්ථික සමුළුව 2015' ප්‍රධාන ප්‍රතිපත්ති සම්පාදකයන්ගේ සහ ව්‍යාපාරික ප්‍රජාවගේ සහභාගිත්වයෙන් 'එ.ජ ඩොලර් බිලියන 50 ක අපනයන ඉලක්කයක් කරා' යන තේමාව යටතේ 2015 අගෝස්තු මාසයේ දී පවත්වන ලදී.** ශ්‍රී ලංකාවේ ව්‍යාපාර පවත්වාගෙන යෑමට ඇති පහසුව පිළිබඳ අන්තර්ජාතික දර්ශකය වන 'Ease of Doing Business' හි මතුවන ගැටලු නිරාකරණය කර ගැනීම සඳහා ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලය, ව්‍යාපාරික ප්‍රජාව සහ මුදල් අමාත්‍යාංශය සමඟ ඉතා සමීපව කටයුතු කරනු ලැබීය. මේ අතර, ශ්‍රී ලංකා ජාතික වාණිජ මණ්ඩලය (National Chamber of Commerce of Sri Lanka), 2015 ජුලි මාසයේ දී පස්වන වරටත් පවත්වන ලද 'Ayurveda Expo 2015' ප්‍රදර්ශනය සහ සම්මන්ත්‍රණය ඇතුළුව දේශීය සහ විදේශීය වශයෙන් පැවති වෙළඳාම සඳහා පහසුකම් සැලසීමේ වැඩසටහන් රාශියකට සහභාගී විය.

**අපනයන කෙරෙහි යොමු වූ කර්මාන්ත ප්‍රවර්ධනය සඳහා අවශ්‍ය ආයතනික සහය ශක්තිමත් කිරීමේ අවශ්‍යතාවය සලකා බලමින් රජය විසින් ක්‍රියාමාර්ග කිහිපයක් යෝජනා කරන ලදී.** ඒ අනුව, මෙහෙයුම් කාර්යක්ෂමතාවය ඉහළ දැමීමත්, ආයෝජන සඳහා පහසුකම් සැලසීමත් අරමුණු කරගෙන 2016 අයවැය මගින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය සහ ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන මණ්ඩලය ප්‍රතිව්‍යුහගත කිරීමට යෝජනා කර ඇති අතර, එම ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය අවසන් වන තෙක් අන්තර්කාලීන පියවරක් ලෙස 'සංවර්ධනය සඳහා ඒජන්සියක්' (Agency for Development) ස්ථාපිත කිරීමටත් යෝජනා කරන ලදී. අපනයන විවිධාංගීකරණය සහ තිරසාර අපනයන වර්ධනය මගින් අපනයන සඳහා ඇති ඉහළ හැකියාවන් උකහා ගැනීමත්, සාපේක්ෂව අපනයන වෙළඳපොළ තුළ රටට හිමි තැන ඉහළ නංවා ගැනීමත් සඳහා, ඉහළ මට්ටමේ ප්‍රතිපත්තිමය තීරණ ගත හැකි අමාත්‍යවරුන්ගෙන් සැදුම්ලත් අපනයන සංවර්ධනය සඳහා කවුන්සිලයක් පිහිටුවීමටත්, විදේශීය අංශයට පහසුකම් සැලසීම සඳහා ආනයන අපනයන බැංකුවක් (EXIM Bank) පිහිටුවීමටත්, ශ්‍රී ලංකා විදේශීය තානාපති කාර්යාලවල වෙළඳ අංශය ශක්තිමත් කිරීම පිණිස එම අංශ ප්‍රතිව්‍යුහගත කිරීමටත්, අපනයන ප්‍රවර්ධනය පුළුල් කිරීම සඳහා ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය ශක්තිමත් කිරීමටත් සහ අපනයන රක්ෂණ ආවරණ වැඩිදියුණු කිරීම සඳහා ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ මණ්ඩලය පුළුල් කිරීමටත් අදාළ යෝජනා 2016 අයවැය මගින් ඉදිරිපත් කර ඇත. එසේම, කළමනාකරණ වගකීම පෞද්ගලික අංශයේ කළමනාකරණ සමාගම් වෙත පැවරූ නව අපනයන කලාප කිහිපයක් ස්ථාපනය කිරීමටත්, නව විශේෂිත කෘෂිකාර්මික හා ධීවර කලාප රට තුළ ස්ථාපනය කිරීමටත්, යෝජනා කර ඇත. තවද, ඉහළ සංචාරක වර්ධනයේ ප්‍රතිලාභ මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය වෙත ලබා ගැනීම සඳහා මැණික් වෙළඳ මධ්‍යස්ථානයක් (Gem Emporium) සහ ගුවන් තොටුපලේ තීරුබදු රහිත මැණික් හා ස්වර්ණාභරණ වෙළඳ සැල් ස්ථාපනය කිරීම සඳහා පෞද්ගලික අංශය දිරිමත් කිරීම සඳහා අදාළ යෝජනා ඉදිරිපත් කර ඇත. ජාත්‍යන්තර වෙළඳ ප්‍රතිපත්ති රාමුව ශක්තිමත් කිරීම සඳහා ජාත්‍යන්තර වෙළඳ ඒජන්සියක් (International Trade Agency) ස්ථාපිත කිරීම සඳහා රජය සැලසුම් කර ඇත. ඇමෙරිකා එක්සත් ජනපදය, දකුණු කොරියාව, සිංගප්පූරුව, ඕස්ට්‍රේලියාව, දකුණු අප්‍රිකාව සහ ජපානය වැනි රටවල් සමඟ නිදහස් වෙළඳ ගිවිසුම්වලට එළඹීමට ඇති හැකියාව ගවේෂණය කිරීමට ද යෝජනා කර ඇත.

**ජාතික සංවර්ධන රාමුව සමග වෙළඳ ප්‍රවර්ධනයෙහි ඇති බැඳීම ශක්තිමත් කිරීම මෙන්ම තාර්කිකරණය සඳහා 2015 වසරේ වෙළඳ හා තීරුබදු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට යෝජනා කර ඇත.** ඒ අනුව, අගය එකතු කිරීම දිරිමත් කිරීම සඳහා තේ, රබර්, පොල් හා කුරුඳු නිෂ්පාදිතයන්හි අගය එකතු නොකළ අපනයන සඳහා වන සෙස් (Cess) බද්ද, තවදුරටත් පවත්වා ගෙන යෑමටත්, ගම්මිරිස්, කරාබු නැටි සහ සාදික්කා සඳහා වන සෙස් බද්ද ඉවත් කිරීමටත් යෝජනා කර ඇත. තවද, 2016 වසර සඳහා වූ අයවැය මගින් සහනදායී කොන්දේසි යටතේ කුළුබඩු වගා කටයුතු සඳහා ණය පහසුකම් සැලසීමටත්, කුළුබඩු වගා කටයුතු සඳහා බදු පදනම මත රජයේ ඉඩම් නිදහස් කිරීමටත්, කෘෂිකාර්මික පර්යේෂණ පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා මුදල් වෙන්කිරීමටත්, ශ්‍රී ලංකාව තේ සඳහා කේන්ද්‍රස්ථානයක් (Tea Hub) ලෙස සංවර්ධනය කිරීමේ අරමුණින් යුතුව ප්‍රති අපනයන දිරිමත් කිරීම සඳහා නියාමන රාමුවක් තුළ තේ ඇතුළු ආනයන ලිහිල් කිරීමටත් යෝජනා කර ඇත.

**ආනයන තාර්කිකරණය කිරීම සඳහා 2016 අයවැය මගින් ක්‍රියාමාර්ග කිහිපයක් හඳුන්වා දෙන ලදී.** දේශීය රන්කරුවන් ආරක්ෂා කිරීම සඳහා ආනයනික රන් ආභරණ සඳහා සෙස් බදු හඳුන්වා දීම, ඉදිකිරීම් කර්මාන්ත අංශයේ අභිවෘද්ධිය සඳහා ඉදිකිරීම් සම්බන්ධ යන්ත්‍රසූත්‍ර සහ උපකරණ මත වූ ආනයන තීරු බදු අඩු කිරීම සඳහා ක්‍රියාමාර්ග ගැනීම සහ ශ්‍රී ලංකාව සංචාරකයින් සඳහා සාප්පු සවාරි පාරාදීසයක් බවට පත් කිරීම සඳහා ඇඟලුම්, පාවහන්, විද්‍යුත් උපාංග මත වූ ආනයන බදු සංශෝධනය කිරීම යනාදිය එමගින් යෝජනා කෙරුණි. ආනයන සහ අපනයන දෙපාර්තමේන්තුව මගින් 2015 වසරේ දී නිකුත් කළ ඉතා වැදගත් නියාමනයක් ලෙස පරිසරයට අහිතකර බලපෑම් ඇති කිරීමට හේතු වූ ග්ලයිෆොසේට් (Glyphosate) ආනයනය තහනම් කිරීම හැඳින්විය හැකිය. වඩා කාර්යක්ෂම ආනයන අපනයන ක්‍රමවේදයක් සහතික කිරීම සඳහා ආනයන හා අපනයන පාලන පනත ද ඇතුළුව වෙළඳාම සම්බන්ධ නීති හා රෙගුලාසි ගණනාවක් සංශෝධනය කිරීමට ද යෝජනා කෙරුණි. අමුද්‍රව්‍ය, උපකරණ සහ අනෙකුත් භාණ්ඩ ආනයනය කරන අවස්ථාවේ දී ආයෝජකයන් විසින් මුහුණ දෙන විවිධාකාර වූ ගැටළු සලකා බලා, අවශ්‍ය කරන්නා වූ අවසර ලබාදීම, නිදහස් කිරීම සහ අනුමැතිය ලබාදීම යන සියල්ලක්ම ශ්‍රී ලංකා රේගුවේ පිහිටි එකම ස්ථානයක දී ඉටුකර ගැනීමට අවකාශ සලසා දෙන "one-stop-shop" සංකල්පය හඳුන්වා දීමට යෝජනා කර තිබේ. ඒ අනුව, ශ්‍රී ලංකා රේගුව විසින් නියාමන ආයතන 15 ක් සම්බන්ධ කර ගනිමින් පහසුවෙන් අනුමැතීන් ලබාදීමේ පහසුකම් සහිත තනි කවුළු පද්ධතියේ (Single Window System) මෙහෙයුම් කටයුතු 2016 වසරේ ජනවාරි මාසයේ දී ආරම්භ කරන ලදී.

**2015 වසර තුළදීත් ශ්‍රී ලංකාව ලෝක වෙළඳ සංවිධානයේ (WTO) බහු පාර්ශ්වීය ක්‍රියාමාර්ග සඳහා තවදුරටත් සහභාගී විය.** 2015 වසරේ දෙසැම්බර් මාසයේදී කෙන්යාවේ දී පැවැත්වූ 10 වන අමාත්‍ය සමුළුවේදී, නීති මත පදනම් වූ බහුපාර්ශ්වීය වෙළඳ ක්‍රමය නිර්මාණය කිරීම, ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය කිරීම සම්බන්ධයෙන් වගකිව යුතු ආයතනය ලෙස ලෝක වෙළඳ සංවිධානයෙහි කාර්යභාරය පිළිබඳව දැඩි ලෙස අවධානය යොමු විය. ශ්‍රී ලංකාව අනෙකුත් සංවර්ධනය වෙමින් පවතින රටවල කණ්ඩායම් සමඟ එක්ව විශේෂයෙන්ම කුඩා ආර්ථිකයක් ලෙස වෙළඳාම හා සම්බන්ධ සංවර්ධනයන් සඳහා අවශ්‍ය වන්නා වූ කරුණු නිරාකරණය කර ගැනීම සඳහා ක්‍රියාකාරී කාර්යභාරයක් ඉටු කළේය. දෝහා සංවර්ධන න්‍යාය පත්‍රයේ ඉතිරි ගැටලු පිළිබඳව සාකච්ඡා දිගටම පවත්වා ගෙන යෑම සඳහා කිසිදු සම්මුතියක් ඇති කර ගෙන නොමැති නමුත්, දෝහා සංවර්ධන න්‍යාය පත්‍රය යටතේ සිදුකරන සාකච්ඡාවන් තවදුරටත් ඉදිරියට කරගෙන යෑමේ වැදගත්කම පිළිබඳව සංවර්ධනය වෙමින් පවතින රටවල් බහුතරයක් අවධාරණය කරන ලදී. මෙහි ප්‍රතිඵලයක් ලෙස, අමාත්‍ය තීරණය සම්මත කළ දින සිට පවතින කෘෂිකාර්මික අපනයන සහනාධාර ඉවත් කිරීමට සංවර්ධිත රටවල් අපේක්ෂා කරන අතර, සංවර්ධනය වෙමින් පවතින රටවල් 2018 වසර අවසානයේ දී අපනයන සහනාධාර ඉවත් කිරීමට අපේක්ෂිතය. අමාත්‍ය ප්‍රකාශනයේ 27 වන වගන්තියට අනුව කුඩා සහ අවදානමට ලක්විය හැකි ආර්ථිකයක් ලෙස ශ්‍රී ලංකාවට තම වෙළඳාම හා සම්බන්ධ වැඩසටහන් සඳහා ලෝක වෙළඳ සංවිධානය හරහා තාක්ෂණික හා ශක්‍යතා සංවර්ධන ආධාර ගැනීමේ අවස්ථාව උදා වී ඇත. තවද, 2013 වසරේ දී බාලිහි දී පැවති නව වැනි අමාත්‍ය සමුළුවේ දී ගත් තීරණයට අනුව ලෝක වෙළඳ සංවිධානයේ සාමාජිකයන් විසින් වෙළඳ පහසුකම් සැලසීමේ ගිවිසුම (Trade Facilitation Agreement-TFA) පිළිගැනීම තවදුරටත් සිදු වෙමින් පවතින අතර 2015 වසරේ දෙසැම්බර් මාසය වන විට රටවල් 68 ක් ගිවිසුම සඳහා අනුමැතිය පල කර ඇත. මුළු සාමාජිකයන් ගණන වන 108 න් තුනෙන් දෙකක් තම අනුමැතිය සනාථ කිරීමෙන් පසු එය නීත්‍යානුකූලව ක්‍රියාත්මක වනු ඇත. ශ්‍රී ලංකාව වෙළඳ පහසුකම් සැලසීමේ සාකච්ඡාවන් ක්‍රියාශීලීව පවත්වා ගෙන ගිය අතර, ගිවිසුම් කෙටුම්පත කැබිනට් අමාත්‍යවරුන්ගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත. වෙළඳ පහසුකම් සැලසීමේ ගිවිසුම සම්පූර්ණයෙන් ක්‍රියාත්මක වීමෙන්

5

පසු වෙළඳ ගනුදෙනු වියදම් විශාල ලෙස අඩු වනු ඇතැයි අපේක්ෂිත අතර, එමගින් අපනයන හා ආනයන දෙකෙහිම තරගකාරිත්වය වැඩි වීම කෙරෙහි පහසුකම් සැලසෙනු ඇත.

**විශේෂයෙන්ම චීනයේ ආර්ථිකය මන්දගාමී වීමත් සමඟ විදේශ වෙළඳාම මත ඇති වන ගෝලීය හා දේශීය අභියෝග 2015 වසරේ දී ද අඛණ්ඩව පැවති අතර එය 2016 වසරේ දී ද තවදුරටත් පවතිනු ඇත.** ඒක පුද්ගල ආදායම ඉහළ යෑමත් සමඟ ශ්‍රී ලංකාව ඉහළ මැදි ආදායම් ලබන රටක් බවට පත්වෙමින් සිටින බැවින් බොහෝ වෙළඳපොළ වෙත සහනදායි කොන්දේසි යටතේ ප්‍රවේශ වීමට ඇති හැකියාව සීමා වනු ඇත. මේ නිසා දැනට පවතින වෙළඳපොළවල තරගකාරිත්වය පවත්වා ගනිමින් නව වෙළඳපොළවල සහ නව තාක්ෂණයන්ට ප්‍රවේශ වීමට සහ ශීඝ්‍රයෙන් වැඩි වෙමින් පවතින ගෝලීය තරගකාරිත්වය හමුවේ නොසැලී සිටීමට අපනයනකරුවන්ට ශක්තිය ලබාදීම සඳහා ආයතනික සහයෝගය ඉතා වැදගත් වනු ඇත. එබැවින් සාම්ප්‍රදායික අපනයනවලට සීමා නොවී විශේෂයෙන්ම ඉහළ තාක්ෂණයකින් යුතු නිෂ්පාදිත වැනි කර්මාන්ත කෙරෙහි විවිධාංගීකරණයන් ඇති කිරීමට මෙන්ම තම අපනයන භාණ්ඩ පැස පිළිබඳව නැවත සිතා බැලීමට ශ්‍රී ලංකාවට කාලය පැමිණ තිබෙන බැවින්, ඉහළ එකතු කළ අගයක් සහිත නිෂ්පාදිත දිරිගැන්වීම සඳහා විදේශීය වෙළඳ ප්‍රතිපත්තිය තවදුරටත් යොමු විය යුතුය. සුදුසු උපායමාර්ග සහ ආයතනික සහයෝගය ද සහිතව, සංචාරක කර්මාන්තය සහ දැනුම පදනම් කරගත් සේවා අංශය ද සමඟ එක්වීම තුළින් සේවා අංශයට ද යහපත් ක්‍රියාකාරිත්වයක් පවත්වා ගත හැකි වනු ඇත. තවද, ප්‍රධාන ජාත්‍යන්තර වෙළඳපොළවල් කිහිපයක පවතින භූ-දේශපාලනික ගැටලු ශ්‍රී ලංකාවේ අපනයන අංශයට අභියෝගයක් වී ඇති බැවින් අනෙකුත් වෙළඳපොළ වෙත පිවිසීම සඳහා කාලීනව ක්‍රමෝපාය ගැනීම අවශ්‍ය වේ.


## 5.3 භාණ්ඩ වෙළඳාම, වෙළඳ ශේෂය, වෙළඳ මිල අනුපාතය සහ වෙළඳ දිශාව

### 5.3.1 අපනයන ක්‍රියාකාරිත්වය

**ජාත්‍යන්තර භාණ්ඩ මිල ගණන්වල පහළයෑම සහ විශාල ආර්ථිකවල හා ශ්‍රී ලංකාවේ ප්‍රධාන අපනයන වෙළඳපොළවල වර්ධනය මන්දගාමී වීම පිළිබිඹු කරමින් 2015 වසර තුළ දී අපනයන ආදායම අඩු විය.** මේ අනුව, 2014 වසරේ දී සියයට 7.1 කින් වර්ධනය වූ අපනයන ආදායම 2015 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 10,505 ක් දක්වා සියයට 5.6 කින් අඩු වූ අතර, කෘෂිකාර්මික සහ කාර්මික යන දෙඅංශයෙහිම අපනයන අඩු වීම මේ සඳහා හේතු විය.

**5.1 රූප සටහන**

**භාණ්ඩ අනුව අපනයන - 2015**




**කුළුබඩු සහ පොල් මද ආශ්‍රිත නිෂ්පාදිත හැර කෘෂිකාර්මික නිෂ්පාදිත යටතේ වර්ග කර ඇති අනෙකුත් ප්‍රධාන කාණ්ඩ සියල්ලකම අපනයන ආදායම් විශාල වශයෙන් අඩු වූ අතර, ඉල්ලුම අඩු වීම සහ ගෝලීය මිල ගණන් පහත වැටීම මෙමගින් පිළිබිඹු විය.** මේ අනුව, 2015 වසරේ දී මුළු අපනයනයෙන් සියයට 23.6 ක් වූ කෘෂිකාර්මික අපනයන ආදායම එ.ජ. ඩොලර් මිලියන 2,481 ක් දක්වා සියයට 11.2 කින් කැපී පෙනෙන ලෙස අඩු වූ අතර, තේ සහ මුහුදු ආහාර අපනයන ආදායම් පහළ යෑම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. මුළු අපනයන ආදායමෙන් සියයට 13 ක් පමණ වූ, ශ්‍රී ලංකාවේ දෙවන විශාලතම අපනයන වෙළඳ භාණ්ඩය වන තේ අපනයන ආදායම, පසුගිය වසර පහ තුළ දී වූ අවම අගය වාර්තා කරමින් එ.ජ. ඩොලර් මිලියන 1,340 ක් දක්වා සියයට 17.7 කින් සැලකියයුතු ලෙස අඩු විය. ශ්‍රී ලංකාවේ තේවල ප්‍රධාන ගැනුම්කරුවන් වන රුසියාව සහ ඇතැම් මැදපෙරදිග රටවලින් ශ්‍රී ලංකාවේ තේ සඳහා වූ ඉල්ලුම විශාල ලෙස අඩු වූ අතර, භූ-දේශපාලනික වර්ධනයන්, ආනයනය කරන රටවල මුදල් අවප්‍රමාණය වීම් සහ ඛනිජතෙල් මගින් ලද ආදායම විශාල ලෙස අඩු වීම මේ සඳහා හේතු විය. මේ අනුව, තේ කිලෝ ග්‍රෑමයක සාමාන්‍ය අපනයන මිල 2014 වසරේ පැවති කිලෝ ග්‍රෑමයට එ.ජ. ඩොලර් 4.97 හි සිට 2015 වසරේ දී කිලෝ ග්‍රෑමයට එ.ජ. ඩොලර් 4.37 ක් දක්වා සියයට 12.2 කින් කැපී පෙනෙන ලෙස අඩු වූ අතර, අපනයන පරිමාව ද කිලෝ ග්‍රෑම් මිලියන 307 ක් දක්වා සියයට 6.2 කින් අඩු විය. මේ අතර, 2015 වසරේ දී මුහුදු ආහාර අපනයනය පෙර වසරට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 163 ක් දක්වා සියයට 35.5 කින් අඩු වූ අතර, 2015 ජනවාරි මැද භාගයේ සිට යුරෝපා වෙළඳපොළ වෙත මුහුදු ආහාර අපනයනය කිරීම තහනමට ලක්වීමත් සමඟ එම වෙළඳපොළ වෙත සිදු කළ

**5.2 සංඛ්‍යා සටහන**

**අපනයන සංයුතිය**

| කාණ්ඩය | 2014 | | 2015 (අ) | | වටිනාකමේ වෙනස එ.ජ.ඩොලර් මිලියන | වාර්ෂික වෙනස්වීම % | වෙනස් වීමට වූ දායකත්වය % |
|---|---|---|---|---|---|---|---|
| | වටිනාකම එ.ජ.ඩොලර් මිලියන | දායකත්වය % | වටිනාකම එ.ජ.ඩොලර් මිලියන | දායකත්වය % | | | |
| **කෘෂිකාර්මික අපනයන** | **2,793.9** | **25.1** | **2,481.5** | **23.6** | **-312.4** | **-11.2** | **50.0** |
| තේ | 1,628.3 | 14.6 | 1,340.5 | 12.8 | -287.8 | -17.7 | 46.0 |
| රබර් | 45.3 | 0.4 | 26.1 | 0.2 | -19.2 | -42.3 | 3.1 |
| පොල් | 356.4 | 3.2 | 351.7 | 3.3 | -4.6 | -1.3 | 0.7 |
| කුළු බඩු | 264.6 | 2.4 | 377.4 | 3.6 | 112.9 | 42.7 | -18.1 |
| එළවළු | 40.1 | 0.4 | 30.5 | 0.3 | -9.6 | -24.0 | 1.5 |
| සකස් නොකළ දුම්කොළ | 41.3 | 0.4 | 31.8 | 0.3 | -9.5 | -23.1 | 1.5 |
| සුළු කෘෂිකාර්මික අපනයන | 165.2 | 1.5 | 160.4 | 1.5 | -4.9 | -2.9 | 0.8 |
| මුහුදු ආහාර | 252.7 | 2.3 | 163.1 | 1.6 | -89.7 | -35.5 | 14.3 |
| **කාර්මික අපනයන** | **8,262.0** | **74.2** | **7,975.6** | **75.9** | **-286.5** | **-3.5** | **45.8** |
| රෙදිපිළි හා ඇඟලුම් | 4,929.9 | 44.3 | 4,820.2 | 45.9 | -109.8 | -2.2 | 17.6 |
| රබර් නිෂ්පාදිත | 889.8 | 8.0 | 761.2 | 7.2 | -128.6 | -14.5 | 20.6 |
| ඛනිජ තෙල් නිෂ්පාදිත | 338.0 | 3.0 | 373.9 | 3.6 | 35.9 | 10.6 | -5.8 |
| මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ | 393.6 | 3.5 | 331.7 | 3.2 | -61.9 | -15.7 | 9.9 |
| ආහාර, පාන වර්ග හා දුම්කොළ | 289.3 | 2.6 | 265.2 | 2.5 | -24.0 | -8.3 | 3.8 |
| යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 342.9 | 3.1 | 293.8 | 2.8 | -49.1 | -14.3 | 7.9 |
| මුද්‍රණ කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 52.4 | 0.5 | 45.7 | 0.4 | -6.7 | -12.8 | 1.1 |
| ප්‍රවාහන උපකරණ | 151.8 | 1.4 | 243.7 | 2.3 | 91.9 | 60.5 | -14.7 |
| සම් භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් | 138.9 | 1.2 | 135.7 | 1.3 | -3.2 | -2.3 | 0.5 |
| පිඟන් මැටි නිෂ්පාදිත | 41.3 | 0.4 | 35.2 | 0.3 | -6.2 | -14.9 | 1.0 |
| අනෙකුත් කාර්මික අපනයන | 694.1 | 6.2 | 669.4 | 6.4 | -24.7 | -3.6 | 4.0 |
| **ඛනිජ අපනයන** | **59.5** | **0.5** | **28.4** | **0.3** | **-31.1** | **-52.3** | **5.0** |
| **වර්ග නොකළ අපනයන** | **14.7** | **0.1** | **19.5** | **0.2** | **4.8** | **32.4** | **-0.8** |
| **මුළු අපනයන (ආ) (ඇ)** | **11,130.1** | **100.0** | **10,504.9** | **100.0** | **-625.1** | **-5.6** | **100.0** |
| **වාර්ෂික සාමාන්‍ය විනිමය අනුපාතය (ඈ)** | **130.56** | | **135.94** | | | | |

(අ) තාවකාලික
(ආ) ගලපන ලද
(ඇ) ප්‍රති අපනයන ඇතුළත් නොවේ
(ඈ) විනිමය අනුපාතය: එ.ජ. ඩොලරයට රුපියල්

මූලයන්: ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා වෙනත් ඛනිජ තෙල් නිෂ්පාදිත අපනයනකරුවන්
ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය
ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

මුහුදු ආහාර අපනයනය සියයට 75.0 කින් සැලකියයුතු ලෙස අඩු වීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. කෙසේ වෙතත්, පොල් නිෂ්පාදිත අපනයන ආදායමෙහි අඩු වීමක් වාර්තා වුවද, පොල් තෙල් අපනයනය සියයට සියයටත් වඩා වැඩි වර්ධනයක් වාර්තා කිරීම හේතුවෙන් පොල් මද ආශ්‍රිත නිෂ්පාදිත අපනයන ආදායම සියයට 3.5 කින් වර්ධනය විය. ගම්මිරිස් සහ කරාබු නැටි වැනි ප්‍රධාන අපනයන බෝග ඵලදාව ඉහළ මට්ටමක පැවතීම හේතුවෙන් 2015 වසරේ දී කුළුබඩු අපනයන ආදායම එ.ජ. ඩොලර් මිලියන 377 ක් දක්වා සියයට 42.7 කින් කැපී පෙනෙන ලෙස වර්ධනය විය. කෙසේ වුවද, කුරුඳු අපනයන ආදායම සියයට 0.2 කින් සුළු වශයෙන් අඩු වූ අතර, අපනයන මිල ගණන් වර්ධනය වුවද අපනයන පරිමාවන් අඩු වීම මේ සඳහා හේතු විය.

**වසර තුළ දී කෘෂිකාර්මික අපනයන ආදායම අඩු වීම සඳහා රබර්, පොල් මද ආශ්‍රිත නොවන නිෂ්පාදිත, එළවළු සහ සකස් නොකළ දුම්කොළ අපනයන සැලකියයුතු ලෙස දායක විය.** ගෝලීය ඉල්ලුම පහළ යෑමත් සමඟ ගෝලීය මිල ගණන් අඛණ්ඩව අඩු වීමෙහි බලපෑම පිළිබිඹු කරමින් 2012 වසරේ සිට අඛණ්ඩව අඩු වූ රබර් අපනයන ආදායම 2015 වසරේ දී තවදුරටත් දුර්වල විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස, රබර් අපනයන පරිමාව සහ මිල ගණන් යන දෙකම අඩු වූ අතර, 2015 වසරේ දී රබර් අපනයන ආදායම එ.ජ. ඩොලර් මිලියන 26 ක් දක්වා සියයට 42.3 කින් අඩු විය. අපනයන පරිමාව සියයට 36.4 කින් අඩු වන අතරතුර රබර් කිලෝ ග්‍රෑමයක සාමාන්‍ය අපනයන මිල ද 2014 වසරේ පැවති කිලෝ ග්‍රෑමයට එ.ජ. ඩොලර් 2.78 හි සිට 2015 වසරේ දී කිලෝ ග්‍රෑමයට එ.ජ. ඩොලර් 2.52 ක් දක්වා සැලකියයුතු

ලෙස අඩු විය. 2015 වසරේ දී පොල් ආශ්‍රිත නිෂ්පාදිත අපනයන ආදායම එ.ජ. ඩොලර් මිලියන 352 ක් දක්වා සියයට 1.3 කින් සුළු වශයෙන් අඩු වූ අතර, පොල් කෙඳි සහ ලණු වැනි පොල් මද ආශ්‍රිත නොවන නිෂ්පාදිත අපනයනවල අඩු ක්‍රියාකාරිත්වයක් පැවතීම මේ සඳහා හේතු විය. තවද, එළවළු, සකස් නොකළ දුම්කොළ සහ සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත අපනයන ආදායම් පිළිවෙළින් සියයට 24.0 කින්, සියයට 23.1 කින් සහ සියයට 2.9 කින් අඩු විය.


**ජාත්‍යන්තර වෙළඳපොළෙහි භාණ්ඩ මිල ගණන් අඩු වීම සහ ගෝලීය ඉල්ලුම පහළ යෑම සමඟ 2015 වසරේ දී කාර්මික අපනයන ආදායම එ.ජ. ඩොලර් මිලියන 7,976 ක් දක්වා සියයට 3.5 කින් අඩු විය.** රෙදිපිළි හා ඇඟලුම්, රබර් නිෂ්පාදිත, මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ සහ යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ අපනයනවල අඩු ක්‍රියාකාරිත්වය මෙම අඩු වීම සඳහා ප්‍රධාන වශයෙන් දායක විය. මුළු අපනයනයෙන් සියයට 46 ක් පමණ වන රෙදිපිළි හා ඇඟලුම් අපනයන ආදායම සියයට 2.2 කින් අඩු වූ අතර, රෙදිපිළි හා අනෙකුත් නිම කළ රෙදිපිළි ද්‍රව්‍ය අපනයන පිළිවෙළින් සියයට 4.5 කින් සහ 13.4 කින් වර්ධනය වුවද, ඇඟලුම් අපනයනය සියයට 2.7 කින් අඩු වීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. ඇමෙරිකා එක්සත් ජනපදය සහ සාම්ප්‍රදායික නොවන වෙළඳපොළ වෙත සිදු කළ ඇඟලුම් අපනයන ආදායම් පිළිවෙළින් සියයට 6.0 කින් සහ සියයට 4.6 කින් වර්ධනය වුවද, යුරෝපා වෙළඳපොළ වෙත සිදු කළ ඇඟලුම් අපනයන ආදායම සියයට 12.5 කින් කැපී පෙනෙන ලෙස අඩු වීම, ඇඟලුම් අපනයන ආදායම අඩු වීම සඳහා ප්‍රධාන වශයෙන් දායක විය. 2015 වසරේ දී ජාත්‍යන්තර රබර් මිල ගණන්වල සිදු වූ කැපී පෙනෙන පහළ යෑමට සමගාමීව රබර් නිෂ්පාදිත අපනයන ආදායම ද එ.ජ. ඩොලර් මිලියන 761 ක් දක්වා සියයට 14.5 කින් අඩු වූ අතර, රබර් නිෂ්පාදිත යටතෙහි ඇති රබර් ටයර් සහ ශල්‍ය අත්වැසුම් හා අනෙකුත් අත්වැසුම් වැනි සියලුම උප කාණ්ඩවල ආදායම් අඩු වීම ඉන් පිළිබිඹු විය. 2015 වසරේ දී මැණික්, දියමන්ති සහ ස්වර්ණාභරණ යන කාණ්ඩ තුනෙහිම අපනයන අඩු වීමත් සමඟ මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ අපනයන ආදායම එ.ජ. ඩොලර් මිලියන 332 ක් දක්වා සියයට 15.7 කින් අඩු විය. මේ අනුව, මැණික් අපනයන ආදායම සියයට 5.2 කින් අඩු වූ අතර, දියමන්ති සහ ස්වර්ණාභරණ අපනයන ආදායම් පිළිවෙළින් සියයට 25.2 කින් සහ සියයට 13.7 කින් අඩු විය. මේ අතර, යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ, ආහාර, පාන හා දුම්කොළ, රසායනික නිෂ්පාදිත, ඇව හා කඩදාසි නිෂ්පාදිත, මුද්‍රණ කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත, සම්භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන්, ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත, මූල ලෝහ හා මූල ලෝහ නිෂ්පාදිත සහ පිඟන් මැටි නිෂ්පාදිත යනාදියෙහි අපනයන ආදායම්වල අඩු ක්‍රියාකාරිත්වය කාර්මික අපනයනවල සමස්ත අඩු වීම සඳහා දායක විය.

**වසර තුළ දී, කාර්මික අපනයන යටතේ ඇති ප්‍රවාහන උපකරණ, ඛනිජතෙල් නිෂ්පාදිත සහ සත්ත්ව ආහාර අපනයන ආදායම් වර්ධනය විය.** නැව්, බෝට්ටු හා පාවෙන ආකෘතීන් මෙන්ම රථවාහන අපනයන ආදායම් හේතුවෙන් 2015 වසරේ ප්‍රවාහන උපකරණ ආදායම එ.ජ. ඩොලර් මිලියන 244 ක් දක්වා සියයට 60.5 කින් කැපී පෙනෙන ලෙස වර්ධනය විය. ඉන්දියාව සහ සිංගප්පූරුව වැනි කලාපයේ අනෙකුත් වෙළඳපොළවල තරගකාරිත්වය මධ්‍යයේ, නැව් හා ගුවන්යානා ඉන්ධනවලින් සමන්විත වූ ඛනිජ තෙල් නිෂ්පාදිත අපනයන ආදායම ද සියයට 10.6 කින් වර්ධනය වූ අතර, අපනයන මිල ගණන් සියයට 51.6 කින් අඩු වුවද, අපනයන පරිමාව ඉතා විශාල ලෙස වර්ධනය වීම මෙයට හේතු විය. 2015 වසරේ දී සත්ත්ව ආහාර අපනයන ආදායම ද සියයට 16.5 කින් වර්ධනය විය.

### 5.3.2 ආනයන ක්‍රියාකාරිත්වය

**2015 වසරේ දී ආනයන වියදම අඩු වූ අතර, විශේෂයෙන්ම බොරතෙල් වැනි ජාත්‍යන්තර භාණ්ඩ මිල ගණන් පහළ යෑම සහ ශ්‍රී ලංකා රජය හා මහ බැංකුව විසින් ආනයන තාර්කීකරණය කිරීම සඳහා හඳුන්වාදුන් උපායමාර්ග මේ සඳහා විශාල ලෙස හේතු විය.** මේ අනුව, 2015 වසරේ දී ආනයන වියදම 2014 වසරේ තිබූ එ.ජ. ඩොලර් මිලියන 19,417 ට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 18,935 ක් දක්වා සියයට 2.5 කින් සුළු වශයෙන් අඩු විය. මේ අතර, ගෝලීය තෙල් මිල ගණන් අඩු වීමෙහි බලපෑම පිළිබිඹු කරමින්, ඉන්ධන නොවන ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 16,235 ක්

**5.2 රූප සටහන — භාණ්ඩ අනුව ආනයන - 2015**



**5.3 සංඛ්‍යා සටහන**

**ආනයන සංයුතිය**

| කාණ්ඩය | 2014 | | 2015 (අ) | | වටිනාකමේ වෙනස එ.ජ.ඩොලර් මිලියන | වාර්ෂික වෙනස්වීම % | වෙනස්වීමට වූ දායකත්වය % |
|---|---|---|---|---|---|---|---|
| | වටිනාකම එ.ජ.ඩොලර් මිලියන | දායකත්වය % | වටිනාකම එ.ජ.ඩොලර් මිලියන | දායකත්වය % | | | |
| **පාරිභෝගික භාණ්ඩ** | **3,852.5** | **19.8** | **4,713.5** | **24.9** | **861.0** | **22.3** | **-178.6** |
| ආහාර හා පාන වර්ග | 1,633.7 | 8.4 | 1,627.8 | 8.6 | -5.9 | -0.4 | 1.2 |
| සහල් | 281.7 | 1.5 | 135.1 | 0.7 | -146.5 | -52.0 | 30.4 |
| සීනි සහ රසකැවිලි | 257.1 | 1.3 | 254.4 | 1.3 | -2.7 | -1.1 | 0.6 |
| කිරි නිෂ්පාදිත | 339.4 | 1.7 | 250.9 | 1.3 | -88.5 | -26.1 | 18.3 |
| පරිප්පු | 121.2 | 0.6 | 148.0 | 0.8 | 26.8 | 22.1 | -5.6 |
| වෙනත් | 634.4 | 3.3 | 839.4 | 4.4 | 205.0 | 32.3 | -42.5 |
| ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ | 2,218.8 | 11.4 | 3,085.7 | 16.3 | 866.9 | 39.1 | -179.8 |
| රථවාහන | 896.7 | 4.6 | 1,359.6 | 7.2 | 463.0 | 51.6 | -96.0 |
| බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත | 380.5 | 2.0 | 459.8 | 2.4 | 79.3 | 20.8 | -16.4 |
| ගෘහ උපකරණ | 156.4 | 0.8 | 221.0 | 1.2 | 64.6 | 41.3 | -13.4 |
| රෙදිපිළි සහ උපාංග | 282.7 | 1.5 | 390.1 | 2.1 | 107.4 | 38.0 | -22.3 |
| වෙනත් | 502.5 | 2.6 | 655.0 | 3.5 | 152.5 | 30.4 | -31.6 |
| **අන්තර් භාණ්ඩ** | **11,397.7** | **58.7** | **9,638.2** | **50.9** | **-1,759.5** | **-15.4** | **364.9** |
| ඉන්ධන | 4,597.3 | 23.7 | 2,699.6 | 14.3 | -1,897.7 | -41.3 | 393.6 |
| රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 2,327.6 | 12.0 | 2,296.2 | 12.1 | -31.3 | -1.3 | 6.5 |
| දියමන්ති සහ අගනා ගල් වර්ග හා ලෝහ | 175.4 | 0.9 | 161.5 | 0.9 | -13.9 | -7.9 | 2.9 |
| රසායනික නිෂ්පාදිත | 808.2 | 4.2 | 870.3 | 4.6 | 62.1 | 7.7 | -12.9 |
| තිරිඟු සහ ඉරිඟු | 404.7 | 2.1 | 357.2 | 1.9 | -47.5 | -11.7 | 9.9 |
| පොහොර | 272.4 | 1.4 | 289.6 | 1.5 | 17.2 | 6.3 | -3.6 |
| අනෙකුත් අන්තර් භාණ්ඩ | 2,812.0 | 14.5 | 2,963.7 | 15.7 | 151.7 | 5.4 | -31.5 |
| **ආයෝජන භාණ්ඩ** | **4,152.2** | **21.4** | **4,567.0** | **24.1** | **414.8** | **10.0** | **-86.0** |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 1,308.9 | 6.7 | 1,352.0 | 7.1 | 43.1 | 3.3 | -8.9 |
| ප්‍රවාහන උපකරණ | 707.3 | 3.6 | 930.9 | 4.9 | 223.7 | 31.6 | -46.4 |
| යන්ත්‍රසූත්‍ර සහ උපකරණ | 2,131.0 | 11.0 | 2,278.1 | 12.0 | 147.1 | 6.9 | -30.5 |
| අනෙකුත් ආයෝජන භාණ්ඩ | 4.9 | … | 5.9 | … | 1.0 | 20.6 | -0.2 |
| **වර්ග නොකළ ආනයන** | **14.4** | **0.1** | **15.9** | **0.1** | **1.5** | **10.3** | **-0.3** |
| **මුළු ආනයන (ආ) (ඇ)** | **19,416.8** | **100.0** | **18,934.6** | **100.0** | **-482.2** | **-2.5** | **100.0** |
| **වාර්ෂික සාමාන්‍ය විනිමය අනුපාතය (ඈ)** | **130.56** | | **135.94** | | | | |

(අ) තාවකාලික
(ආ) ගළපන ලද
(ඇ) ප්‍රති ආනයන ඇතුළත් නොවේ.
(ඈ) විනිමය අනුපාතය: එ.ජ. ඩොලරයට රුපියල්

මූලයන්: ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව
ලංකා අයි.ඕ.සී. සමාගම
ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

දක්වා සියයට 9.6 කින් සැලකියයුතු ලෙස වර්ධනය විය. ජපාන 'යෙන්' අගය අවප්‍රමාණය වීම සහ තෝරාගත් රථවාහන සඳහා වූ ආනයන තීරු බදු අඩු වීමත් සමඟ පෞද්ගලික රථවාහන ආනයනය විශාල ලෙස ඉහළ යෑම හේතුවෙන් ඉන්ධන නොවන ආනයන වියදම වර්ධනය විය.

**අන්තර් භාණ්ඩ ආනයන වියදම 2014 වසරේ පැවති එ.ජ. ඩොලර් මිලියන 11,398 ට සාපේක්ෂව 2015 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 9,638 ක් දක්වා සියයට 15.4 කින් සැලකියයුතු ලෙස අඩු වූ අතර, ඉන්ධන ආනයන වියදමෙහි සැලකියයුතු අඩු වීම ඉන් පිළිබිඹු විය.** ඉන්ධන ආනයන පරිමාව සහ මිල ගණන් යන දෙකෙහිම අඩු වීම හේතුවෙන් 2015 වසරේ දී ඉන්ධන ආනයන වියදම පෙර වසරට සාපේක්ෂව සියයට 41.3 ක අඩු වීමක් වාර්තා කරමින් එ.ජ. ඩොලර් මිලියන 2,700 ක් දක්වා එ.ජ. ඩොලර් මිලියන 1,898 කින් අඩු විය. ජාත්‍යන්තර තෙල් මිලෙහි විශාල අඩුවීමට සමගාමීව, 2014 වසරේ දී බැරලයට එ.ජ. ඩොලර් 104.53 ක්ව පැවති බොරතෙල් බැරලයක සාමාන්‍ය ආනයන මිල, 2015 වසරේ දී බැරලයට එ.ජ. ඩොලර් 54.80 ක් දක්වා සියයට 47.6 කින් අඩු විය. මේ අතර, 2015 මාර්තු හා අප්‍රේල් මාස තුළ දී තෙල් පිරිපහදුව අලුත්වැඩියා කටයුතු සඳහා වසා දැමීම සහ වසර තුළ දී තාප බල උත්පාදනය සැලකියයුතු ලෙස අඩුවීම හේතුවෙන්, බොරතෙල් සහ පිරිපහදු කරන

**5.4 සංඛ්‍යා සටහන** — **ප්‍රධාන ආනයන පරිමාවන්**

මෙට්‍රික් ටොන් දහස්

| ශීර්ෂය | 2011 | 2012 | 2013 | 2014 | 2015 (අ) |
|---|---|---|---|---|---|
| **සහල්** | **28** | **36** | **23** | **600** | **286** |
| පළමු කාර්තුව | 8 | 15 | 9 | 6 | 176 |
| දෙවන කාර්තුව | 2 | 7 | 6 | 102 | 91 |
| තෙවන කාර්තුව | 9 | 10 | 4 | 145 | 9 |
| සිව්වන කාර්තුව | 9 | 4 | 4 | 348 | 9 |
| **තිරිඟු (ආ)** | **1,242** | **1,084** | **895** | **1,179** | **1,208** |
| පළමු කාර්තුව | 322 | 353 | 197 | 271 | 242 |
| දෙවන කාර්තුව | 455 | 235 | 326 | 324 | 342 |
| තෙවන කාර්තුව | 254 | 291 | 170 | 291 | 373 |
| සිව්වන කාර්තුව | 211 | 205 | 201 | 292 | 251 |
| **සීනි** | **606** | **569** | **548** | **520** | **624** |
| පළමු කාර්තුව | 163 | 158 | 126 | 131 | 169 |
| දෙවන කාර්තුව | 170 | 135 | 175 | 162 | 161 |
| තෙවන කාර්තුව | 124 | 114 | 118 | 152 | 156 |
| සිව්වන කාර්තුව | 149 | 162 | 129 | 75 | 137 |
| **බොර තෙල් (ආ)** | **2,070** | **1,486** | **1,743** | **1,824** | **1,763** |
| පළමු කාර්තුව | 557 | 558 | 482 | 548 | 369 |
| දෙවන කාර්තුව | 555 | 413 | 545 | 365 | 355 |
| තෙවන කාර්තුව | 410 | 137 | 315 | 462 | 472 |
| සිව්වන කාර්තුව | 547 | 379 | 401 | 449 | 567 |
| **පිරිපහදු කළ බනිජ තෙල් (ආ)** | **3,501** | **3,961** | **2,907** | **3,385** | **3,321** |
| පළමු කාර්තුව | 702 | 1,036 | 673 | 970 | 799 |
| දෙවන කාර්තුව | 807 | 903 | 756 | 762 | 952 |
| තෙවන කාර්තුව | 1,022 | 997 | 791 | 1,006 | 744 |
| සිව්වන කාර්තුව | 970 | 1,025 | 687 | 647 | 826 |
| **පොහොර** | **801** | **640** | **600** | **765** | **873** |
| පළමු කාර්තුව | 131 | 129 | 61 | 202 | 163 |
| දෙවන කාර්තුව | 207 | 176 | 139 | 190 | 244 |
| තෙවන කාර්තුව | 266 | 226 | 187 | 95 | 189 |
| සිව්වන කාර්තුව | 197 | 108 | 214 | 277 | 277 |

(අ) තාවකාලික
(ආ) ගළපන ලද

මූලයන්: ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාව
ලංකා අයි.ඕ.සී. සමාගම
සීමාසහිත ප්‍රීමා ලංකා සමාගම
සීමාසහිත සෙරෙන්ඩිබ් ෆ්ලාර් මිල්ස් පුද්ගලික සමාගම
ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

ලද බනිජතෙල් නිෂ්පාදිත ආනයන පරිමාව පිළිවෙළින් සියයට 2.0 කින් සහ සියයට 1.9 කින් අඩු විය. මේ අනුව, ඉන්ධන ආනයන මුළු ආනයනයෙහි ප්‍රතිශතයක් ලෙස ගත් විට පෙර වසරෙහි වාර්තා වූ සියයට 23.7 ට සාපේක්ෂව 2015 වසරේ දී සියයට 14.3 ක් දක්වා අඩු විය. මේ අතර, ගල්අඟුරු බල උත්පාදනය වර්ධනය වීම හේතුවෙන්, 2015 වසරේ දී ගල්අඟුරු ආනයන පරිමාව සියයට 17.1 කින් වර්ධනය වූ අතර, ගල්අඟුරු ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 159 ක් දක්වා සුළු වශයෙන් වර්ධනය විය. ඇඟලුම් අපනයනයෙහි වාර්තා වූ පහළ යෑමට සමගාමීව, රෙදිපිළි හා රෙදිපිළි උපාංග ආනයන වියදම 2014 වසරේ දී පැවති එ.ජ. ඩොලර් මිලියන 2,328 සමග සැසඳීමේ දී 2015 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 2,296 ක් දක්වා සියයට 1.3 කින් අඩු විය. කෙසේ වුවද, අන්තර් භාණ්ඩ යටතේ වර්ග කර ඇති රබර් හා රබර් ආශ්‍රිත නිෂ්පාදිත, රසායනික නිෂ්පාදිත, වාහන හා යන්ත්‍රසූත්‍ර කොටස්, පොහොර සහ සකස් නොකළ දුම්කොළ, 2015 වසරේ දී ආනයන වියදම වර්ධනය වීම සඳහා ධනාත්මකව දායක විය.

**ආහාර හා පාන ආනයන වියදමෙහි සුළු අඩු වීමක් වාර්තා වුවද, ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ ආනයනය සැලකියයුතු ලෙස ඉහළ යෑම හේතුවෙන් පාරිභෝගික භාණ්ඩ ආනයනය විශාල ලෙස වර්ධනය විය.** 2015 වසරේ දී, පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 4,713 ක් දක්වා සියයට 22.3 කින් සැලකියයුතු ලෙස වර්ධනය වූ අතර, පෞද්ගලික රථවාහන ආනයනය විශාල ලෙස ඉහළ යෑම හේතුවෙන් ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 3,086 ක් දක්වා සියයට 39.1 කින් වර්ධනය වීම ඒ සඳහා විශාල ලෙස හේතු විය. 2014 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 897 ක්ව පැවති රථ වාහන ආනයන වියදම 2015 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 1,360 ක් දක්වා සියයට 51.6 කින් වර්ධනය වූ අතර, ඒ සඳහා මෝටර් කාර් ආනයන වියදම සියයට 47.6 කින් වර්ධනය වීම දායක විය. රාජ්‍ය සේවකයන් සඳහා සහනදායී රථවාහන බලපත්‍ර ලබාදීම, විශේෂයෙන් එන්ජින් ධාරිතාවය 1000 ට අඩු වාහන ඇතුළු රථවාහන ආනයන සඳහා බදු අඩු කිරීම සහ ජපාන 'යෙන්' වටිනාකම අවප්‍රමාණය වීම, විශේෂයෙන් රථ වාහන ඇතුළු ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ ආනයන වර්ධනය සඳහා හේතු විය. 2015 වසරේ දී, පෙර වසරට සාපේක්ෂව රෙදිපිළි හා උපාංග (සියයට 38.0), විදුලි සංදේශ උපකරණ (සියයට 60.3), බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත (සියයට 20.8) සහ ගෘහ උපකරණ (සියයට 41.3) ආනයන වියදම් වර්ධනය වීම තුළින් ආනයනික භාණ්ඩ සඳහා දේශීය වශයෙන් පැවති ඉහළ ඉල්ලුම පිළිබිඹු විය. මෙයට අමතරව, පරිප්පු, ළූණු සහ රනිල කුලයට අයත් එළවළු වැනි එළවළු කාණ්ඩය යටතේ ආනයනය කරනු ලබන ප්‍රධාන ආනයනවල වර්ධනය හේතුවෙන් මෙම වසරේ දී, එළවළු ආනයන වියදම සියයට 39.6 කින් වර්ධනය විය. මේ අතර, මෙම වසරේ දී මුහුදු ආහාර (සියයට 53.4), තෙල් හා මේද (සියයට 66.5), කුළුබඩු (සියයට 15.4), පලතුරු (සියයට 30.5) සහ පාන වර්ග (සියයට 26.1) යන භාණ්ඩ ආනයන වියදම් වැඩි විය. කෙසේ වුවද, 2014 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 282 ක්ව පැවති සහල් ආනයන වියදම 2015 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 135 ක් දක්වා අඩු විය. 2014 අප්‍රේල් මාසයේ සිට සැලකියයුතු වර්ධනයක් වාර්තා කළ සහල් ආනයනය, 2015 වසරේ මැයි මාසයේ සිට


අඩු වීමක් පෙන්නුම් කළ අතර, 2015 වසරේ යල සහ මහ කන්න දෙකෙහිම වාර්තා වූ ඉතා ඉහළ වී අස්වැන්න හේතුවෙන් දේශීය වෙළඳපොළෙහි ප්‍රමාණවත් සහල් සැපයුමක් පැවතීම සැලකිල්ලට ගෙන සහල් සඳහා වූ ආනයන බදු වැඩි කිරීම ඒ සඳහා හේතු විය. තවද, කිරිපිටි ආනයන පරිමාව විශාල ලෙස වර්ධනය වුවද කිරිපිටි ආනයන සාමාන්‍ය මිල සැලකියයුතු ලෙස අඩු වීම හේතුවෙන් කිරිපිටි ආනයන වියදමේ අඩු වීමක් වාර්තා වීම 2015 වසරේ දී කිරි නිෂ්පාදිත ආනයන වියදම සියයට 26.1 කින් අඩු වීම සඳහා හේතු විය.

**සියලුම උප කාණ්ඩ ආනයනවල වර්ධනයන් පිළිබිඹු කරමින් 2015 වසරේ දී ආයෝජන භාණ්ඩ ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 4,567 ක් දක්වා සියයට 10.0 කින් වර්ධනය විය.** කෙසේ වුවද, මෙම වර්ධනය සඳහා විශාලතම දායකත්වය ප්‍රවාහන උපකරණ මගින් ලැබුණු අතර, දෙවනුව යන්ත්‍රසූත්‍ර හා උපකරණ ඒ සඳහා දායක විය. 2015 වසරේ දී ප්‍රවාහන උපකරණ ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 931 ක් දක්වා සියයට 31.6 කින් සැලකියයුතු ලෙස වර්ධනය වූ අතර, විශේෂයෙන් ත්‍රීරෝද රථ, ලොරි, වාණිජ කටයුතු සඳහා භාවිත කරන කැබ් රථ සහ කෘෂිකාර්මික කටයුතු සඳහා භාවිත කරන ට්‍රැක්ටර් ආදී රථවාහන ආනයනය ඉහළ යෑම ඒ සඳහා හේතු විය. ප්‍රධාන වශයෙන් ඉංජිනේරු උපකරණ, විද්‍යුත් උපකරණ, විදුලි සංදේශ උපකරණ සහ කාර්යාලීය යන්ත්‍රසූත්‍ර යනාදියෙන් සමන්විත වන යන්ත්‍රසූත්‍ර හා උපකරණ ආනයන වියදම 2015 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 2,278 ක් දක්වා සියයට 6.9 කින් වර්ධනය විය. ප්‍රධාන වශයෙන් සිමෙන්ති, යකඩ හා වානේ, ඇලුමිනියම් උපාංග සහ ඛනිජ නිෂ්පාදිත යනාදියෙන් සමන්විත වන ගොඩනැගිලි ද්‍රව්‍ය ආනයන වියදම, 2015 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 1,352 ක් දක්වා සියයට 3.3 කින් වර්ධනය වූ අතර, යකඩ හා වානේ උපාංග ආනයන වියදම පෙර වසරට සාපේක්ෂව සියයට 19.4 කින් වර්ධනය වීම මෙම වැඩි වීම සඳහා මූලික විය.

### 5.3.3 වෙළඳ ශේෂය

**2014 වසරේ තුන්වන කාර්තුවේ සිට පුළුල් වූ වෙළඳ හිඟුමේ හිඟයෙහි වර්ධන වේගය 2015 වසරේ මැද භාගයේ සිට අඩු වූ අතර, 2015 වසරේ දී එහි සුළු වර්ධනයක් වාර්තා විය.** ආනයන වියදමෙහි සුළු අඩු වීමට සාපේක්ෂව අපනයන ආදායම විශාල වශයෙන් අඩුවීම 2015 වසරේ වෙළඳ හිඟය පුළුල් වීම සඳහා හේතු විය. ඒ අනුව, 2014 වසරේ එ.ජ. ඩොලර් මිලියන 8,287 ක්ව පැවති වෙළඳ හිඟය 2015 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 8,430 ක් දක්වා සියයට 1.7 කින් සුළු වශයෙන් වර්ධනය විය. කෙසේ වුවද, 2014 වසරේ දී

**5.3 රූප සටහන** — **අපනයන, ආනයන සහ වෙළඳ ශේෂය**





දළ දේශීය නිෂ්පාදිතයෙහි (ද.දේ.නි.) ප්‍රතිශතයක් ලෙස සියයට 10.4 ක්ව පැවති වෙළඳ ගිණුමේ හිඟය, 2015 වසරේ දී සියයට 10.2 ක් දක්වා අඩු විය.

### 5.3.4 වෙළඳ මිල අනුපාතය

**අපනයන මිල ගණන්හි අඩු වීමට සාපේක්ෂව, ඛනිජතෙල් ප්‍රමුඛ ආනයන මිල ගණන් සැලකියයුතු ලෙස අඩු වීම, 2015 වසරේ දී වෙළඳ මිල අනුපාතය සියයට 2.3 කින් වර්ධනය වීම සඳහා හේතු විය.** ඒ අනුව, සියයට 9.8 කින් අඩු වූ අපනයන මිල දර්ශකයට සාපේක්ෂව ආනයන මිල දර්ශකය සියයට 11.8 කින් අඩු වීම පිළිබිඹු කරමින්, 2014 වසරේ දී දර්ශක අංක 97.6 ක්ව පැවති වෙළඳ මිල අනුපාතය 2015 වසරේ දී දර්ශක අංක 99.9 ක් දක්වා වර්ධනය විය.

**ප්‍රධාන අපනයන කාණ්ඩ සියල්ලකම මිල ගණන්හි අඩු වීම් පිළිබිඹු කරමින් 2015 වසරේ අපනයන මිල දර්ශකය පහත වැටුණි.** තේ, රබර් සහ මුහුදු ආහාර

**5.4 රූප සටහන** — **වෙළඳ මිල අනුපාතය සහ වෙළඳ දර්ශක**



**5.5 සංඛ්‍යා සටහන**

## වෙළඳ දර්ශක (අ)

2010 = 100

| කාණ්ඩය | වටිනාකම් දර්ශකය | | | පරිමා දර්ශකය | | | ඒකක වටිනාකම් දර්ශකය | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | 2014 | 2015 (ආ) | වර්ධනය % | 2014 | 2015 (ආ) | වර්ධනය % | 2014 | 2015 (ආ) | වර්ධනය % |
| අපනයන | | | | | | | | | |
| **කෘෂිකාර්මික අපනයන** | **121.2** | **107.6** | **-11.2** | **103.2** | **95.6** | **-7.4** | **117.5** | **112.6** | **-4.1** |
| තේ | 113.1 | 93.1 | -17.7 | 98.5 | 91.3 | -7.3 | 114.9 | 102.0 | -11.2 |
| රබර් | 26.2 | 15.1 | -42.3 | 32.3 | 21.0 | -34.9 | 81.0 | 71.8 | -11.3 |
| පොල් | 215.1 | 212.3 | -1.3 | 170.7 | 159.4 | -6.6 | 126.0 | 133.2 | 5.7 |
| කුළු බඩු | 127.7 | 182.2 | 42.7 | 85.8 | 118.3 | 37.8 | 148.8 | 154.0 | 3.5 |
| සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත | 231.4 | 224.6 | -2.9 | 232.2 | 205.3 | -11.6 | 99.7 | 109.4 | 9.7 |
| **කාර්මික අපනයන** | **135.6** | **130.9** | **-3.5** | **133.2** | **144.4** | **8.4** | **101.8** | **90.6** | **-10.9** |
| රෙදිපිළි හා ඇඟලුම් | 147.0 | 143.7 | -2.2 | 128.2 | 126.4 | -1.4 | 114.7 | 113.7 | -0.9 |
| ඛනිජ තෙල් නිෂ්පාදිත | 128.4 | 142.1 | 10.6 | 92.6 | 208.6 | 125.4 | 138.7 | 68.1 | -50.9 |
| රබර් නිෂ්පාදිත | 159.8 | 136.7 | -14.5 | 108.1 | 96.9 | -10.4 | 147.9 | 141.1 | -4.6 |
| **ඛනිජ ද්‍රව්‍ය අපනයන** | **245.4** | **117.2** | **-52.3** | **158.6** | **82.4** | **-48.1** | **154.7** | **142.2** | **-8.1** |
| **මුළු අපනයන** | **129.1** | **121.8** | **-5.6** | **122.3** | **128.0** | **4.6** | **105.5** | **95.2** | **-9.8** |
| ආනයන | | | | | | | | | |
| **පාරිභෝගික භාණ්ඩ** | **155.7** | **190.5** | **22.3** | **143.3** | **177.9** | **24.1** | **108.6** | **107.1** | **-1.4** |
| ආහාර හා පාන වර්ග | 123.5 | 123.1 | -0.4 | 125.8 | 128.1 | 1.9 | 98.2 | 96.0 | -2.2 |
| ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ | 192.7 | 268.0 | 39.1 | 163.5 | 235.0 | 43.7 | 117.9 | 114.0 | -3.2 |
| **අන්තර් භාණ්ඩ** | **141.6** | **119.8** | **-15.4** | **122.9** | **128.7** | **4.7** | **115.2** | **93.1** | **-19.2** |
| ඉන්ධන | 151.2 | 88.8 | -41.3 | 117.7 | 116.6 | -1.0 | 128.4 | 76.2 | -40.7 |
| පොහොර | 113.4 | 120.6 | 6.3 | 112.6 | 129.5 | 15.1 | 100.8 | 93.1 | -7.6 |
| රසායනික නිෂ්පාදිත | 155.4 | 167.4 | 7.7 | 138.3 | 155.6 | 12.5 | 112.4 | 107.6 | -4.3 |
| තිරිඟු සහ ඉරිඟු | 152.5 | 134.6 | -11.7 | 123.5 | 121.3 | -1.7 | 123.5 | 110.9 | -10.2 |
| රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 128.7 | 126.9 | -1.3 | 115.8 | 120.4 | 4.0 | 111.1 | 105.4 | -5.2 |
| ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 143.7 | 145.5 | 1.2 | 131.1 | 142.6 | 8.8 | 109.6 | 102.0 | -6.9 |
| දියමන්ති, අගනා ගල් වර්ග හා ලෝහ | 46.5 | 42.8 | -7.9 | 57.7 | 49.1 | -14.9 | 80.5 | 87.1 | 8.1 |
| **ආයෝජන භාණ්ඩ** | **150.7** | **165.8** | **10.0** | **158.2** | **179.7** | **13.6** | **95.3** | **92.2** | **-3.2** |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 159.3 | 164.5 | 3.3 | 153.0 | 167.8 | 9.7 | 104.1 | 98.1 | -5.8 |
| ප්‍රවාහන උපකරණ | 119.4 | 157.1 | 31.6 | 114.4 | 156.5 | 36.8 | 104.3 | 100.4 | -3.8 |
| යන්ත්‍රසූත්‍ර සහ උපකරණ | 159.3 | 170.3 | 6.9 | 180.7 | 197.3 | 9.2 | 88.2 | 86.3 | -2.1 |
| අනෙකුත් ආයෝජන භාණ්ඩ | 147.9 | 178.4 | 20.6 | 162.2 | 184.6 | 13.8 | 91.2 | 96.7 | 6.0 |
| **මුළු ආනයන** | **144.8** | **141.2** | **-2.5** | **134.0** | **148.2** | **10.6** | **108.1** | **95.3** | **-11.8** |
| **වෙළඳ මිල අනුපාතය** | | | | | | | **97.6** | **99.9** | **2.3** |

(අ) එ.ජ.ඩොලර් වටිනාකම අනුව
(ආ) තාවකාලික

මූලයන්: ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා වෙනත් ඛනිජ තෙල් නිශ්පාදිත අපනයනකරුවන්
ලංකා අයි.ඕ.සී සමාගම
ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය
ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

අපනයන මිල ගණන් අඩු වීමට සමගාමීව, කෘෂිකාර්මික අපනයනවලට අදාළ අපනයන මිල දර්ශකය 2015 වසරේ දී සියයට 4.1 කින් අඩු විය. 2015 වසරේ දී තේ සඳහා වූ අපනයන මිල දර්ශකය සියයට 11.2 කින් සැලකියයුතු ලෙස අඩු වූ අතර, මේ සඳහා ප්‍රධාන වශයෙන් රුසියාව සහ මැදපෙරදිගින් ශ්‍රී ලංකාවේ තේ සඳහා පැවති අඩු ඉල්ලුම හේතු විය. මේ අතර, රබර් සහ මුහුදු ආහාර සඳහා වූ සාමාන්‍ය අපනයන මිල දර්ශකය පිළිවෙළින් සියයට 11.3 කින් සහ සියයට 5.1 කින් අඩු විය. 2015 වසරේ දී කාර්මික අපනයනවලට අදාළ අපනයන මිල දර්ශකය ද සියයට 10.9 කින් අඩු වූ අතර, මේ සඳහා ප්‍රධාන වශයෙන් ඛනිජතෙල් නිෂ්පාදිත අපනයන මිල දර්ශකයේ වාර්තා වූ සියයට 50.9 ක අඩු වීම හේතු විය. කෙසේ වුවද, කාර්මික අපනයන යටතේ වර්ග කර ඇති ප්‍රවාහන උපකරණ, පිඟන් මැටි නිෂ්පාදිත සහ සම් භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් මෙන්ම, කෘෂිකාර්මික නිෂ්පාදිත යටතේ වර්ග කර ඇති පොල් මද නිෂ්පාදිත, සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත සහ කුළුබඩු යනාදිය සඳහා වූ අපනයන මිල දර්ශක ද මෙම වසරේ දී ඉහළ ගියේය.


**2015 වසරේ දී ආනයන මිල දර්ශකය සැලකියයුතු ලෙස අඩු වූ අතර, ඒ සඳහා තෙල් මිල විශාල ලෙස පහත වැටීම හේතු විය.** වසර පුරාම ගෝලීය වෙළඳපොළෙහි පැවති අඩු තෙල් මිල ගණන් පිළිබිඹු කරමින් ප්‍රධාන වශයෙන් ඉන්ධන ආනයන සාමාන්‍ය මිල දර්ශකය සියයට 40.7 කින් අඩු වීම හේතු කොට ගෙන 2015 වසරේ දී අන්තර් භාණ්ඩ ආනයනයට අදාළ වූ ආනයන මිල දර්ශකය සියයට 19.2 කින් සැලකියයුතු ලෙස අඩු විය. ඒ අනුව, පසුගිය වසරේ දර්ශක අංක 128.4 ක්ව පැවති ඉන්ධන ආනයන සාමාන්‍ය මිල දර්ශකය, 2015 වසරේ දී දර්ශක අංක 76.2 ක් දක්වා අඩු විය. දියමන්ති, අගනා ගල් වර්ග හා ලෝහ ආනයන මිල දර්ශක හැර අන්තර් භාණ්ඩ ආනයන යටතේ ඇති අනෙකුත් සියලුම උප කාණ්ඩයන්ගේ ආනයන මිල දර්ශක 2015 වසරේ දී අඩු විය. යන්ත්‍රසූත්‍ර හා උපකරණ, ගොඩනැගිලි ද්‍රව්‍ය සහ ප්‍රවාහන උපකරණ යනාදියෙහි මිල අඩු වීම පිළිබිඹු කරමින් 2015 වසරේ දී ආයෝජන භාණ්ඩ ආනයන මිල දර්ශකය සියයට 3.2 කින් අඩු විය. ජාත්‍යන්තර වෙළඳපොළෙහි අමුද්‍රව්‍ය මිල ගණන් අඩු වීමට සමගාමීව, ගොඩනැගිලි ද්‍රව්‍ය ආනයන මිල දර්ශකය සියයට 5.8 කින් අඩු විය. තවද, එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව ජපාන 'යෙන්' වටිනාකම සැලකියයුතු ලෙස අවප්‍රමාණය වීම ප්‍රවාහන උපකරණ සඳහා වූ ආනයන මිල දර්ශකය අඩු වීමට හේතු විය. මේ අතර, ආහාර හා පාන සහ ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ සඳහා වූ ආනයන මිල දර්ශක පිළිවෙළින් සියයට 2.2 කින් සහ සියයට 3.2 කින් අඩු වීම පාරිභෝගික භාණ්ඩ සඳහා වන ආනයන මිල දර්ශකය සියයට 1.4 කින් අඩු වීම කෙරෙහි හේතු විය.

### 5.3.5 වෙළඳ දිශාව


**ශ්‍රී ලංකාවේ ප්‍රධාන අපනයන ගමනාන්ත ලෙස බටහිර රටවල් තවදුරටත් පැවති අතර, ආනයන සඳහා ආසියාතික රටවලට ප්‍රමුඛත්වය ලැබුණි.** ඇමෙරිකා එක්සත් ජනපදය සහ එක්සත් රාජධානිය විශාලතම අපනයන ගමනාන්ත ලෙස පැවති අතර, පළමුව ඉන්දියාව ද අනතුරුව චීනය සහ ජපානය ද ප්‍රධාන ආනයන ප්‍රභව ලෙස පැවතුණි. 2015 වසරේ දී සෑම රටක් විසින්ම ශ්‍රී ලංකාව සමඟ ඩොලර් බිලියන 3 ඉක්මවන වෙළඳ ගනුදෙනු ප්‍රමාණයක් වාර්තා කරමින් ශ්‍රී ලංකාවේ ප්‍රධානතම වෙළඳ හවුල්කරුවන් ලෙස ඉන්දියාව, චීනය සහ ඇමෙරිකා එක්සත් ජනපදය තවදුරටත් පැවතිණි. මෙයට අමතරව 2015 වසරේ දී එක්සත් රාජධානිය, ජපානය, එක්සත් ආරාබි එමීර් රාජ්‍ය සහ සිංගප්පූරුව යන රටවල් ශ්‍රී ලංකාව සමඟ වෙන් වෙන් වශයෙන් එ.ජ. ඩොලර් බිලියන 1 කට වඩා වැඩි වෙළඳ ගනුදෙනු සිදු කරමින් අනෙකුත් ප්‍රධානතම වෙළඳ හවුල්කරුවන් බවට පත්විය. ඉන්දියාව, චීනය, ජපානය සහ ඇමෙරිකා එක්සත් ජනපදය යන රටවල් සමඟ පැවති සමස්ත වෙළඳාම 2015 වසරේ දී පෙර වසරට සාපේක්ෂව වර්ධනය වූ අතර, රුසියාව, සමහර මැදපෙරදිග රටවල් සහ යුරෝපා සංගමය සමඟ පැවති සමස්ත වෙළඳාම අඩු විය.

**ඇමෙරිකා එක්සත් ජනපදය ශ්‍රී ලංකාවේ ප්‍රධානතම ගැනුම්කරු ලෙස තවදුරටත් පැවති අතර, පෙර වසරේ දී මුළු අපනයනවලින් සියයට 25 ක්ව පැවති ඇමෙරිකා එක්සත් ජනපදයට සිදු කළ අපනයන, මෙම වසරේ දී සියයට 27 ක් දක්වා වර්ධනය විය.** 2015 වසරේ දී, ඇමෙරිකා එක්සත් ජනපදයට සිදු කළ මුළු අපනයන ප්‍රමාණය එ.ජ. ඩොලර් මිලියන 2,810 ක් දක්වා සියයට 2.9 කින් වර්ධනය වු අතර, 2015 වසරේ දී මුළු ඇඟලුම් අපනයනයෙන් සියයට 46.3 ක් වූ ඇමෙරිකා එක්සත් ජනපදය වෙත සිදු කළ ඇඟලුම් අපනයනය, 2007 වසරට පසුව යුරෝපා සංගමය වෙත සිදු කළ ඇඟලුම් අපනයනය අභිබවා යමින් එ.ජ. ඩොලර් මිලියන 2,110 ක් දක්වා සියයට 6.0 කින් වර්ධනය විය. යුරෝපා සංගමය වෙත සිදු කළ මුහුදු ආහාර අපනයනය සැලකියයුතු ලෙස අඩු වුවද, 2015 වසරේ දී ද එක්සත් රාජධානිය මුළු අපනයනවලින් සියයට 9.8 ක් වාර්තා කරමින් දෙවන විශාලතම අපනයන ගමනාන්තය ලෙස තවදුරටත් පැවතිණි. 2015 වසරේ දී එක්සත් රාජධානිය වෙත සිදු කළ මුළු අපනයනවලින් පිළිවෙළින් සියයට 79.2 ක් සහ සියයට 2.9 ක් වූ ඇඟලුම් සහ රබර් නිෂ්පාදිත එරටට සිදු කළ ප්‍රධාන අපනයන ලෙස පැවතිණි. 2015 වසරේ දී එක්සත් රාජධානිය වෙත සිදු කළ අපනයන එ.ජ. ඩොලර් මිලියන 1,029 ක් දක්වා සියයට 7.8 කින් අඩු වූ අතර, මේ සඳහා ප්‍රධාන වශයෙන් ඇඟලුම් අපනයනය අඩු වීම ද අනතුරුව රබර් නිෂ්පාදිත සහ මුහුදු ආහාර අපනයන අඩු වීම ද හේතු විය. 2014 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 625 ක් වූ ඉන්දියාව වෙත සිදු කරන ලද අපනයන ප්‍රධාන වශයෙන් කුළුබඩු, ප්‍රවාහන උපකරණ සහ සත්ත්ව ආහාර අපනයන හේතු කොට ගෙන 2015 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 643 ක් දක්වා සියයට 3.0 කින් වර්ධනය වූ අතර, ඉන්දියාව වෙත සිදු කළ අපනයන මුළු අපනයනවලින් සියයට 6.1 ක් විය. 2015 වසරේ ඉන්දියාව, ශ්‍රී ලංකාවේ තෙවන විශාලතම අපනයන ගමනාන්තය වශයෙන් කුළුබඩු, සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත සහ සත්ත්ව ආහාර අපනයනවල ප්‍රධානම ගැනුම්කරු වූ අතර, ශ්‍රී ලංකාවේ ප්‍රවාහන උපකරණ අපනයනයේ දෙවන විශාලතම ගැනුම්කරු විය. පෙර වසරේ 13 වන විශාලතම අපනයන ගමනාන්තය වශයෙන් පැවති චීනය මෙම වසරේ දී 6 වන විශාලතම

**5.5 රූප සටහන** අපනයන වෙළඳ දිශාව




**5.6 රූප සටහන** ආනයන වෙළඳ දිශාව




ගමනාන්තය ලෙස එහි තත්ත්වය වර්ධනය කර ගනිමින් ශ්‍රී ලංකාවේ විශාල ගැනුම්කරුවකු බවට පත් වූ අතර, ඒ සඳහා ප්‍රවාහන උපකරණ, ඇඟලුම් සහ තේ අපනයනයේ වාර්තා වූ සැලකියයුතු වර්ධනය හේතු විය.

**ඉන්දියාව, ශ්‍රී ලංකාවේ විශාලතම ආනයන ප්‍රභවය ලෙස අඛණ්ඩව පැවති අතර, 2015 වසරේ දී ඉන්දියාවෙන් කරන ලද ආනයන මුළු ආනයනයෙන් සියයට 23 ක් විය.** 2015 වසරේ දී මුළු ආනයන වියදම සියයට 2.5 කින් අඩු වුව ද, ප්‍රධාන වශයෙන් පෞද්ගලික ප්‍රයෝජනයට ගන්නා සහ ආයෝජන අවශ්‍යතා සඳහා භාවිතා කරන රථවාහන ආනයනය සැලකියයුතු ලෙස ඉහළ යෑම හේතුවෙන් ඉන්දියාවෙන් සිදු කරන ලද ආනයන එ.ජ. ඩොලර් මිලියන 4,268 ක් දක්වා සියයට 6.1 කින් වර්ධනය විය. 2015 ජනවාරි මාසයේ පැවති අතුරු අයවැය මගින් විශේෂයෙන් එන්ජින් ධාරිතාවය 1000 ට අඩු කුඩා රථවාහන සඳහා ආනයන බදු අඩු කිරීම මේ සඳහා හේතු විය. ඒ අනුව, 2015 වසරේ දී ඉන්දියාවෙන් සිදු කරන ලද මෝටර් රථ, මෝටර් සයිකල් සහ ත්‍රිරෝද රථ ආනයන පිළිවෙළින් සියයට 565.6 කින්, සියයට 15.5 කින් සහ සියයට 56.3 කින් වර්ධනය විය. කෙසේ වුවද, ඉන්දියාවෙන් සිදු කරනු ලබන ආනයන වියදමෙන් විශාල කොටසකට දායක වන ඛනිජතෙල් නිෂ්පාදිත ආනයන වියදම, ඛනිජතෙල් මිල අඩු වීම හේතුවෙන් 2015 වසරේ දී සියයට 20.3 කින් සැලකියයුතු ලෙස අඩු විය. ඒ අතර, 2015 වසරේ දී, මුළු ආනයනවලින් සියයට 20 ක් වූ චීනයෙන් සිදු කරන ලද ආනයන එ.ජ. ඩොලර් මිලියන 3,712 ක් දක්වා සියයට 6.3 කින් වැඩි වූ අතර, මේ සඳහා මූල ලෝහ, යන්ත්‍රසූත්‍ර හා උපකරණ, ගොඩනැගිලි ද්‍රව්‍ය, පොහොර, මුහුදු ආහාර සහ රෙදිපිළි හා රෙදිපිළි උපාංග ආනයන ඉහළ යෑම හේතු විය. 2015 වසරේ දී ජපානයෙන් සිදු කරන ලද ආනයන එ.ජ. ඩොලර් මිලියන 1,389 ක් දක්වා සියයට 47.6 කින් සැලකියයුතු ලෙස වර්ධනය වූ අතර, ඒ සඳහා ජපාන 'යෙන්' වටිනාකම සැලකියයුතු ලෙස අවප්‍රමාණය වීම සහ ආනයන බදු ව්‍යුහය වෙනස් කිරීම හේතුවෙන් පෞද්ගලික ප්‍රයෝජනයට ගනු ලබන සහ ආයෝජන අවශ්‍යතා සඳහා භාවිත කරනු ලබන රථවාහන ආනයනය දිරිමත් වීමෙන් රථවාහන ආනයනය වර්ධනය වීම හේතු විය. 2012 වසරේ සිට පස්වන විශාලතම ආනයන ප්‍රභවය වශයෙන් පැවති ජපානය, 2015 වසරේ දී එක්සත් අරාබි එමීර් රාජ්‍යය සහ සිංගප්පූරුව අභිබවා යමින් ශ්‍රී ලංකාවේ තෙවන විශාලතම ආනයන ප්‍රභවය බවට පත්විය.

## 5.4 ජංගම සහ ප්‍රාග්ධන ගිණුම

### 5.4.1 සේවා වෙළඳාම

සංචාරක, ප්‍රවාහන, විදුලි සන්දේශ, පරිගණක හා තොරතුරු සේවා යන උප අංශයන්ගේ සතුටුදායක ක්‍රියාකාරිත්වය සමඟ 2015 වසරේ දී සේවා ගිණුමෙහි අතිරික්තයක් වාර්තා විය. මුහුදු සහ වරාය ආශ්‍රිත ප්‍රවාහන කටයුතු මන්දගාමී වීම හේතුවෙන් 2015 පළමු භාගයේ දී සේවා ගිණුමේ සුළු වර්ධනයක් පමණක් වාර්තා වුවද, වසරේ දෙවන භාගයේ දී සේවා අපනයන ඉපැයුම් ශීඝ්‍රයෙන් වර්ධනය වීමෙහි ප්‍රතිඵලයක් ලෙස සේවා ගිණුමෙහි සමස්ත අතිරික්තය 2014 වසරට සාපේක්ෂව 2015 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 2,325 ක් දක්වා සියයට 23.7 කින් වර්ධනය විය.

**ප්‍රවාහන සේවා**

ප්‍රවාහන සේවා ආශ්‍රිත ක්‍රියාකාරකම් 2015 වසරේ දී සේවා ගිණුමේ වර්ධනය සඳහා අඛණ්ඩව දායක විය. අපනයන පහළ යෑම හමුවේ මුහුදු සහ වරාය හා ගුවන්තොටුපළ ආශ්‍රිත ප්‍රධාන කටයුතුවල අඩු වීමක් පැවතිය ද මගී ගාස්තු, නැව් කුලී, වරාය සහ ගුවන් තොටුපොළ ආශ්‍රිත ක්‍රියාකාරකම්වලින් සමන්විත ප්‍රවාහන සේවා වෙත වූ ලැබීම් 2015 වසරේ දී සියයට 9.4 ක වර්ධනයක් වාර්තා කළේය. සංචාරක පැමිණීම් ඉහළ යෑමත් සමඟ ගුවන් මගී ගාස්තු ආශ්‍රිත ලැබීම් ප්‍රවාහන සේවා ලැබීම් වර්ධනය වීම සඳහා ප්‍රධාන වශයෙන් දායක විය. තවද, 2015 වසරේ දී දකුණු කොළඹ වරාය තුළ අලුතින් ගොඩනගන ලද කොළඹ ජාත්‍යන්තර බහලුම් හැසිරවීමේ පර්යන්තය පූර්ණ වශයෙන් ක්‍රියාත්මක වීමත් සමඟ ප්‍රතිනැව්ගත කිරීම් සහ බහලුම් හැසිරවීම්හි වර්ධනයක් නිරීක්ෂණය කළ හැකි විය. මේ අතර, විශේෂයෙන් භාණ්ඩ ආනයනය ඉහළ යෑමට අනුරූපීව භාණ්ඩ ප්‍රවාහනය මත වූ ගෙවීම් ඉහළ යෑම හමුවේ වරාය සහ ගුවන් තොටුපොළ ආශ්‍රිත ක්‍රියාකාරකම් මත වූ ගෙවීම් වර්ධනය වීම සමඟ, ප්‍රවාහන සේවා මත වූ ගෙවීම් 2015 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 1,579 ක් දක්වා සියයට 8.0 කින් වර්ධනය විය. එහි ප්‍රතිඵලයක් ලෙස, ප්‍රවාහන අංශය මත වූ ශුද්ධ ලැබීම් 2014 වසරේ වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 462 සමඟ සැසඳීමේ දී 2015 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 526 ක් විය.

**2015 වසරේ දී මගී ගාස්තු මත වූ ලැබීම් පෙර වසරට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 997 ක් දක්වා සියයට 17.8 කින් වර්ධනය විය.** වසර තුළ දී මෙරටට පැමිණි මගීන් සංඛ්‍යාව වර්ධනය වීම සහ අනෙකුත් තරගකාරී ගුවන් සමාගම් විසින් ගුවන් ගාස්තු ඉහළ දැමීමට සමගාමීව ශ්‍රීලංකන් ගුවන් සමාගම විසින්

**5.6 සංඛ්‍යා සටහන**

**ජංගම සහ ප්‍රාග්ධන ගිණුම**
**(BPM6 සංස්කරණයට අනුව සම්මත ඉදිරිපත් කිරීම)**

එ.ජ.ඩොලර් මිලියන

| ශීර්ෂය | 2014 (අ) | | | 2015 (ආ) | | |
|---|---|---|---|---|---|---|
| | බැර | හර | ශුද්ධ | බැර | හර | ශුද්ධ |
| **භාණ්ඩ හා සේවා** | **16,735** | **23,142** | **-6,407** | **16,902** | **23,006** | **-6,105** |
| **භාණ්ඩ** | **11,130** | **19,417** | **-8,287** | **10,505** | **18,935** | **-8,430** |
| වෙළඳ භාණ්ඩ | 11,130 | 19,405 | -8,275 | 10,505 | 18,892 | -8,387 |
| මූල්‍ය නොවන රත්‍රන් | - | 12 | -12 | - | 42 | -42 |
| **සේවා** | **5,605** | **3,725** | **1,880** | **6,397** | **4,072** | **2,325** |
| ප්‍රවාහන | 1,923 | 1,462 | 462 | 2,105 | 1,579 | 526 |
| මුහුදු ප්‍රවාහන | 969 | 722 | 246 | 997 | 762 | 234 |
| නැව් කුලී | 969 | 722 | 246 | 997 | 762 | 234 |
| ගුවන් ප්‍රවාහන | 954 | 739 | 215 | 1,108 | 816 | 292 |
| මගී ගාස්තු | 847 | 659 | 188 | 997 | 732 | 266 |
| ගුවන් කුලී | 108 | 80 | 27 | 111 | 85 | 26 |
| සංචාරක (ඇ) | 2,431 | 1,263 | 1,169 | 2,981 | 1,420 | 1,561 |
| ඉදිකිරීම් | 58 | 29 | 29 | 60 | 30 | 30 |
| රක්ෂණ සහ විශ්‍රාම වැටුප් | 115 | 90 | 26 | 119 | 92 | 27 |
| මූල්‍ය සේවා | 256 | 350 | -94 | 254 | 380 | -126 |
| විදුලි සන්දේශ සහ පරිගණක සේවා | 748 | 398 | 350 | 805 | 429 | 375 |
| විදුලි සන්දේශ | 120 | 98 | 22 | 128 | 102 | 26 |
| පරිගණක සේවා | 628 | 300 | 328 | 677 | 327 | 349 |
| වෙනත් ව්‍යාපාරික සේවා | 43 | 58 | -16 | 42 | 63 | -21 |
| රජයේ භාණ්ඩ හා සේවා වියදම් (අන් තැනක සඳහන් නොවන) | 31 | 77 | -45 | 31 | 79 | -48 |
| **ප්‍රාථමික ආදායම්** | **155** | **1,963** | **-1,808** | **127** | **2,224** | **-2,097** |
| සේවක වැටුප් | 19 | 68 | -50 | 19 | 83 | -63 |
| ආයෝජන ආදායම් | 137 | 1,895 | -1,758 | 108 | 2,142 | -2,034 |
| ඍජු ආයෝජන | 17 | 670 | -653 | 17 | 811 | -794 |
| ලාභාංශ | 17 | 289 | -273 | 17 | 469 | -453 |
| ප්‍රති ආයෝජිත ඉපැයුම් | - | 380 | -380 | - | 341 | -341 |
| විවිධ ආයෝජන | - | 828 | -828 | - | 868 | -868 |
| හිමිකම් | - | 69 | -69 | - | 108 | -108 |
| පොලී ආදායම් | - | 758 | -758 | - | 760 | -760 |
| කෙටි කාලීන | - | 61 | -61 | - | 27 | -27 |
| දිගු කාලීන | - | 697 | -697 | - | 734 | -734 |
| අනෙකුත් ආයෝජන | 18 | 398 | -379 | 25 | 463 | -438 |
| සංචිත වත්කම් | 102 | - | 102 | 66 | - | 66 |
| **ද්විතීයික ආදායම්** | **7,046** | **819** | **6,227** | **7,007** | **814** | **6,193** |
| රජය | 28 | - | 28 | 27 | - | 27 |
| සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ | 7,018 | 819 | 6,199 | 6,980 | 814 | 6,167 |
| **ජංගම ගිණුම** | **23,936** | **25,924** | **-1,988** | **24,036** | **26,044** | **-2,009** |
| **ප්‍රාග්ධන ගිණුම** | **73** | **15** | **58** | **71** | **24** | **46** |
| ප්‍රාග්ධන සංක්‍රාම | 73 | 15 | 58 | 71 | 24 | 46 |
| රජය | 52 | - | 52 | 50 | - | 50 |
| සංස්ථා සහ කුටුම්බ | 21 | 15 | 6 | 21 | 24 | -3 |
| **ජංගම ගිණුම සහ ප්‍රාග්ධන ගිණුම** | **24,009** | **25,938** | **-1,929** | **24,107** | **26,069** | **-1,962** |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) අනේවාසිකයන්ට සැපයූ මගී සේවාවන්, ප්‍රවාහන සේවාවන්හි ඇතුළත්ය.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

5

විදේශීය අංශයේ ප්‍රවණතා සහ ප්‍රතිපත්ති

ගුවන් ගාස්තු ඉහළ දැමීම මේ සඳහා මූලිකවම හේතු විය. මේ අතර, ශ්‍රීලංකන් ගුවන් සමාගම විසින් 2015 වසරේ දී පැරණි ගුවන් යානා පහක් වෙනුවට නව ගුවන් යානා යෙදවීමෙන් අනතුරුව, 2016 වසරේ දී ද නව ගුවන් යානා තුනක් යෙදවීමට අදහස් කරන අතර, එමගින් එහි මෙහෙයුම් කාර්යක්ෂමතාවය තවදුරටත් වර්ධනය කිරීමට සැලසුම් කෙරෙයි. මෙහෙයුම් කාර්යක්ෂමතාවයේ මෙම වර්ධනයට සමගාමීව ගුවන් ගමනාන්ත පුළුල් කිරීම සහ ශ්‍රීලංකන් ගුවන් සමාගම විසින් ගුවන් ගමන් වාර ගණන වැඩි කිරීම, මැදි කාලීන වශයෙන් මගී ගාස්තු මත වූ ලැබීම්හි තිරසාර වර්ධනයක් ඇති කිරීමට හේතු වනු ඇත.


**ගෝලීය ආර්ථික කටයුතු මන්දගාමී වීමත් සමග නැව් කුලී සහ වරාය ආශ්‍රිත සේවාවන් මත වූ දළ ලැබීම් 2015 වසරේ දී සුළු වර්ධනයක් වාර්තා කළේය.** ගෝලීය වෙළඳ කටයුතු පරිමාවෙහි සිදු වූ පහළ යෑම හේතුවෙන් ශ්‍රී ලංකාවේ වරාය ආශ්‍රිත සේවාවන්හි සමස්ත පරිමාව ද වසර තුළ දී අඩු විය. කෙසේ නමුත්, දකුණු කොළඹ වරාය එහි වැඩකටයුතු මුළුමනින්ම ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිඵලයක් ලෙස කොළඹ වරාය වෙත පැමිණි නැව් ප්‍රමාණය වර්ධනය වූ අතර, ඒ අනුව ප්‍රතිනැව්ගත කිරීම්, බහලුම් හැසිරවීම් සහ ඉන්ධන සැපයීමේ සේවා ඇතුළත් ශ්‍රී ලංකාවේ වරාය ආශ්‍රිත ක්‍රියාකාරකම් වර්ධනය විය.

### විදේශ ගමන් සහ සංචාරක සේවා

**අභ්‍යන්තර ගැටුම්කාරී වාතාවරණයෙන් පසුව ආර්ථිකය තුළ වේගයෙන්ම දියුණුවන කර්මාන්තයක් බවට පත්වෙමින් ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය 2015 වසරේ දී අතිවිශාල සාර්ථකත්වයක් ළඟාකර ගැනීමට සමත් විය.** 2015 වසරේ සංචාරක පැමිණීම් 1,798,380 ක් ලෙස වාර්තා වූ අතර, එය වසර සඳහා වූ සංශෝධිත ඉලක්කය වූ සංචාරක පැමිණීම් මිලියන 1.8 ට ඉතා සමීප අගයක් විය. සංචාරක කර්මාන්තයෙහි සිදු කළ ආයෝජන සැලකියයුතු ලෙස ඉහළ යෑම, සංචාරක කර්මාන්තය හා සම්බන්ධ යටිතල පහසුකම් සංවර්ධනය, නව සංචාරක ආකර්ෂණයන් හඳුන්වා දීම සහ සංචාරකයින් ආකර්ෂණය කර ගැනීම සඳහා රජය සහ පෞද්ගලික අංශය මගින් මෙහෙය වූ ක්‍රමෝපාය ප්‍රවර්ධන වැඩසටහන් මෙම සාර්ථකත්වය ළඟාකර ගැනීම සඳහා උපකාරී විය.

**2015 වසරේ දී, නැගෙනහිර යුරෝපය හැර අනෙකුත් ප්‍රධාන කලාප සියල්ලකින්ම වූ සංචාරක පැමිණීම් වර්ධනය විය.** බටහිර යුරෝපය තවදුරටත් ශ්‍රී ලංකාවේ විශාලතම සංචාරක ප්‍රභවය ලෙස පැවති අතර, මෙම කලාපයෙන් පැමිණි සංචාරකයින් සංඛ්‍යාව 552,442 ක් දක්වා සියයට 15.3 කින් වර්ධනය විය. කෙසේ වුවද,

**5.7 රූප සටහන** **රටවල් අනුව සංචාරක පැමිණීම් - 2015**




2012 වසරේ සිට පෙන්නුම් කළ ප්‍රවණතා තවදුරටත් පැවතෙමින්, 2012 වසරේ දී මුළු පැමිණීම්වලින් සියයට 37.1 ක් ලෙස පැවති බටහිර යුරෝපයෙන් වූ සංචාරක පැමිණීම්, 2015 වසරේ දී සියයට 30.7 ක් ලෙස තවදුරටත් පහත වැටුණු අතර, සාම්ප්‍රදායික නොවන ප්‍රභවයන්ගේ සංචාරක පැමිණීම්වල සිදු වූ වර්ධනය ඉන් පිළිබිඹු විය. චීනයෙන් පැමිණෙන සංචාරකයින් සංඛ්‍යාව කලාපයේ අනෙකුත් රටවලට සාපේක්ෂව ඉහළ වේගයකින් වර්ධනය වීම ප්‍රධාන වශයෙන් හේතුකොට ගෙන මුළු සංචාරක පැමිණීම් සඳහා නැගෙනහිර ආසියාවෙන් ලද දායකත්වය 2010 වසරේ සිට අඛණ්ඩව ඉහළ ගියේය. 2015 වසරේ ඉන්දියාවෙන් පැමිණි සංචාරකයින් සංඛ්‍යාව 316,247 ක් ලෙස වාර්තා වීමත් සමග තනි රටක් ලෙස ගත් කල ශ්‍රී ලංකාවට වැඩිම සංචාරක සංඛ්‍යාවක් පැමිණි රට ලෙස ඉන්දියාව තවදුරටත් ඉදිරියෙන් පැවති අතර, එක්සත් රාජධානිය අභිබවා යමින් චීනය දෙවන තැනට පත්වෙද්දී පිළිවෙළින් ජර්මනිය, මාලදිවයින සහ ප්‍රංශය වැඩිම සංචාරක පැමිණීමක් වාර්තා කළ අනෙකුත් රටවල් විය. 2015 වසරේ දී ශ්‍රී ලංකාවට පැමිණි සංචාරකයින්ගෙන් සියයට 54.8 ක්ම මෙම රටවල් හයෙන් පැමිණ තිබුණි. චීනයෙන් පැමිණි සංචාරකයින් සංඛ්‍යාව 214,783 ක් දක්වා සියයට 67.6 ක ඉහළම වර්ධනය වාර්තා කළ අතර, අනතුරුව නෙදර්ලන්තය සහ ඩෙන්මාර්කය යන රටවල් දෙකම සියයට 35.3 බැගින් වර්ධනය වී පිළිවෙළින් 32,742 ක හා 15,203 ක සංචාරක පැමිණීම් වාර්තා කළේය. සංචාරකයින් පැමිණීමේ අරමුණ සැලකීමේ දී 2015 වසරේ දී මුළු සංචාරක පැමිණීම්වලින් සියයට 67 ක පමණ බහුතරයක් විවේකය ගතකිරීම සඳහා පැමිණ ඇත.

**විශේෂ සටහන 8**


## සංචාරක කර්මාන්තය : අභියෝග සහ අපේක්ෂා

විවිධ ගැටලු සහ අභියෝග මධ්‍යයේ වුවද, ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය පශ්චාත් ගැටුම්කාරී ආර්ථිකයේ විශාලතම අංශවලින් එකක් මෙන්ම, වේගයෙන්ම වර්ධනය වන ආර්ථික අංශය බවට පත්වෙමින් ශීඝ්‍ර පුළුල් වීමකට සහ විවිධාංගීකරණයට ලක්විය. 2009 වසරේ දී 448,000 ක් වූ ශ්‍රී ලංකාවට පැමිණි සංචාරකයින් ප්‍රමාණය 2015 වසරේ දී මිලියන 1.8 ක් දක්වා වර්ධනය වී ඇත. සංචාරක ඉපැයීම් ද 2009 වසරේ දී වූ එ.ජ. ඩොලර් මිලියන 349 හි සිට 2015 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 2,981 ක් දක්වා විශාල ලෙස ඉහළ ගොස් ඇති අතර, එය සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ සහ ඇඟලුම් අපනයන ආදායමට පසු තෙවැනි විශාලතම විදේශ විනිමය උත්පාදන අංශය බවට පත් වී ඇත.

වසර ගණනාවක සිට ශ්‍රී ලංකාවට වැඩිම සංචාරකයින් ප්‍රමාණයක් පැමිණෙන රට ඉන්දියාව වූ අතර, වේගයෙන් වර්ධනය වන චීන සංචාරක පැමිණීම් එක්සත් රාජධානියේ සංචාරක පැමිණීම් අභිබවා යමින් දෙවන ස්ථානයට පැමිණ ඇත. තවද, ජර්මනිය සහ මාලදිවයින ද 2015 වසරේ සංචාරක පැමිණීම් අතර ඉදිරියෙන් පසු වේ. ශ්‍රී ලංකා සංචාරක කර්මාන්තය පිළිබඳව ලෝන්ලි ප්ලැනට් සඟරාව, ප්‍රංශයේ කොන්ඩේ නාස්ට් සඟරාව, ෆොබ්ස් සඟරාව, ෆොක්ස් ප්‍රවෘත්ති ඒජන්සිය සහ එක්සත් රාජධානියේ සන්ඩේ ටයිම්ස් වැනි ලොව පිළිගත් මාධ්‍ය සංවිධාන විසින් ප්‍රශංසාවන් ලබාදීම ඉහළ ගොස් ඇත.

**රූප සටහන වි.ස. 8.1**

**සංචාරක ව්‍යාපාරයේ වර්ධන ප්‍රවණතා 1970 සිට 2015**




### වර්ධන ශක්‍යතාවය

ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයට තවදුරටත් වර්ධනය වීම සඳහා ඉතා ඉහළ ශක්‍යතාවයක් පවතී. පහත සංඛ්‍යා සටහනෙහි දැක්වෙන පරිදි ශ්‍රී ලංකාව ලෝකයේ මුළු සංචාරක පැමිණීම්වලින් සියයට 0.13 කට ද, මුළු සංචාරක ඉපැයීම්වලින් සියයට 0.2 කට ද දායක වේ. ඒ අනුව, ශ්‍රී ලංකාව ලෝක සංචාරක කර්මාන්තයට ඉතාම අඩු ප්‍රතිශතයකින් දායක වී ඇති බැවින් ඉදිරියේ දී සිය සංචාරක කර්මාන්තය ඉතා විශාල වශයෙන් වර්ධනය කර ගැනීමේ ශක්‍යතාවයක් පවතී.

**සංඛ්‍යා සටහන වි.ස. 8.1**

**2014 වසරේ තෝරාගත් රටවල සංචාරක පැමිණීම් සහ ඉපැයීම්**

| රට/කලාපය | 2014 වසරේ සංචාරක පැමිණීම් සංඛ්‍යාව ('000) | වෙළඳපොළ ප්‍රතිශතය (%) | 2014 වසරේ සංචාරක ඉපැයීම් (එ.ජ. ඩොලර් මිලියන) | වෙළඳපොළ ප්‍රතිශතය |
|---|---|---|---|---|
| සමස්ථ ලෝකයේම | 1,133,000 | 100.00 | 1,245,000 | 100.00 |
| එයින්, ආසියා හා පැසිෆික් කලාපය | 263,305 | 23.24 | 376,815 | 30.27 |
| හොංකොං | 27,770 | 2.45 | 38,376 | 3.08 |
| සිංගප්පූරුව | 11,858 | 1.05 | 19,203 | 1.54 |
| ඉන්දියාව | 7,703 | 0.68 | 19,700 | 1.58 |
| මාලදිවයින | 1,205 | 0.11 | 2,661 | 0.21 |
| **ශ්‍රී ලංකාව** | **1,527** | **0.13** | **2,431** | **0.20** |

මූලය: ලෝක සංචාරක සංවිධානය

ලෝක සංචාරක කවුන්සිලය (World Travel and Tourism Council) විසින් සිදු කරන ලද ඇස්තමේන්තුවලට අනුව ශ්‍රී ලංකාවේ ද.දේ.නි.ට සහ සේවා නියුක්තිය වෙනුවෙන් විදේශ ගමන් සහ සංචාරක සේවා අංශයේ සෘජු සහ මුළු දායකත්වය[1], ලෝක සහ ආසියා පැසිෆික් කලාපීය සාමාන්‍යට වඩා ඉහළ මට්ටමක පවතී. එසේ වුවද, කලාපීය තරගකරුවන් වන මාලදිවයින, කාම්බෝජය, තායිලන්තය සහ මැලේසියාව වැනි රටවල් සමඟ සැසඳීමේ දී ද.දේ.නි. සහ සේවා නියුක්තිය යන අංශ දෙක සඳහාම ශ්‍රී ලංකාවේ විදේශ ගමන් හා සංචාරක සේවා අංශයෙහි සෘජු සහ මුළු දායකත්වය පහළ අගයක් ගන්නා අතර, සිය වර්ධන හැකියාවන් නිසි ලෙස භාවිත කර නොමැති බවක් එමගින් පෙන්නුම් කරයි.

ස්වභාව සෞන්දර්යය, සුව පහසු දේශගුණය, ඓතිහාසික හා සංස්කෘතික උරුමය සහ ආගමික විවිධත්වය වැනි කරුණු ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයේ වර්ධන ශක්‍යතාවන් ලෙස සාම්ප්‍රදායිකව සලකා ඇත. තවද, රටක පවතින ආරක්ෂාව සහ සුරක්ෂිතභාවය එම රටේ සංචාරක කර්මාන්තයේ උන්නතිය සඳහා විශාල වශයෙන් බලපානු ලබයි. වර්තමානයේ දී ලෝකයේ ත්‍රස්තවාදී උවදුරෙන් තොර සංචාරක ගමනාන්ත කිහිපය අතුරින් එකක් බවට

1 ලෝක සංචාරක කවුන්සිලයට අනුව, ද.දේ.නි. සඳහා විදේශ ගමන් හා සේවා අංශයේ සෘජු දායකත්වය ලෙස ගණනය කරනු ලබන්නේ, කිසියම් රටක් තුළ එහි නේවාසික හා අනේවාසික පුද්ගලයන් විසින් ව්‍යාපාරික හා විවේකය අරමුණු කරගෙන විදේශ ගමන් සහ සංචාරක සේවා සඳහා කරන වියදම මෙන්ම, රජය විසින්, විදේශ සංචාරකයින්ට සේවා සැපයීම සඳහා සෘජු සම්බන්ධතාවයක් ඇති කෞතුකාගාර, ජාතික වනෝද්‍යාන, හෝටල්, ගුවන් සේවා, ගුවන් තොටුපොළ, සංචාරක නියෝජිතායතන, විවේකය හා විනෝදාස්වාදය සපයන සේවා සඳහා කරනු ලබන වියදම් ඇතුළත් වේ. ද.දේ.නි. සඳහා විදේශ ගමන් හා සේවා අංශයේ මුළු දායකත්වය ලෙස ආර්ථිකයක් වෙත වක්‍ර සහ ප්‍රේරණ බලපෑම් ද ඇතුළත් වඩාත් විහිදුනු පරාසයක් ඇතුළත් වේ.

ශ්‍රී ලංකාව පත් වී ඇත. තවද, කිලෝමීටර 1,500 ක් දිගට විහිදුනු වෙරළ තීරයක් හිමි රටක් වුවද, ශ්‍රී ලංකාව විසින් එහි සැබෑ හැකියාවන් උපයෝජනය කර ගැනීමට අපොහොසත්ව ඇත. එබැවින් ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරයේ ඉහළ දියුණුවක් ලබාගත හැකි උප කාණ්ඩ ලෙස රැස්වීම්, සම්මන්ත්‍රණ හා උත්සව සඳහා වන MICE සංචාරක ව්‍යාපාරය, සුව සංචාරක ව්‍යාපාරය, පාරිසරික සංචාරක ව්‍යාපාරය, ත්‍රාසජනක කටයුතු (Adventure) සඳහා වන සංචාරක ව්‍යාපාරය, විවේකය අරමුණු කරගත් සංචාරක ව්‍යාපාරය, කෘෂි සංචාරක ව්‍යාපාරය, මගී යාත්‍රා සහ සාමුද්‍රික සංචාරක ව්‍යාපාරය, ග්‍රාමීය හා නාගරික සංචාරක ව්‍යාපාරය, විනෝදාස්වාදය අරමුණු කරගත් සංචාරක ව්‍යාපාරය හැඳින්විය හැකිය.

සංචාරක ව්‍යාපාරයේ ඉහත උප කාණ්ඩවල හැකියාවන් උපයෝජනය කර ගැනීම සඳහා ජාතික උරුමයන් සහ පරිසරය ආරක්ෂා කර ගනිමින් ආර්ථිකයේ සියලුම අංශ ආවරණය වන පරිදි ව්‍යුහාත්මක වෙනස්කම් සිදු කළ යුතු වන අතර, ඊට අමතරව යටිතල පහසුකම් සංවර්ධනය මගින් ඒ සඳහා විශාල සහයක් ලබාදිය යුතුව ඇත. මේ සඳහා සුබදායක ලෙස රජය මගින් 2016 ජනවාරි මාසයේ එළිදැක්වූ, යෝජිත මහානගර (Megapolis) හා බස්නාහිර සංවර්ධන සැලසුම මගින් ද 2016 වර්ෂය සඳහා වූ රජයේ අයවැය මගින් ද විභවතාවයක් පවතින නව අංශ කෙරෙහි සෘජු අවධානය යොමු කරමින් සංචාරක අංශයේ සංවර්ධනය සඳහා යෝජනා ඉදිරිපත් කර ඇත.

### සංචාරක කර්මාන්තය මුහුණ දෙන අභියෝග

ආර්ථිකයක වර්ධනය වෙමින් පවතින ඕනෑම කර්මාන්තයක් අභියෝග රැසකට මුහුණ දෙන අතර, ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයට ද එය එලෙසින්ම බලපා ඇත. ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය මුහුණ දෙන ප්‍රධාන අභියෝග ලෙස විශේෂඥයන් විසින් පහත සඳහන් කරුණු හඳුනාගෙන ඇත.

- **සංචාරකයින්ගේ අපේක්ෂිත වර්ධනයට සමගාමීව හෝටල් කාමර ප්‍රමාණවත් නොවීම:** ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයට අනුව 2016 වසර සඳහා මිලියන 2.2 කට වඩා වැඩි සංචාරක පැමිණීම් ප්‍රමාණයක් අපේක්ෂා කරනු ලබයි. මෙවැනි විශාල සංචාරකයින් ප්‍රමාණයකට පහසුකම් සැලසීම සඳහා හෝටල් කාමර 40,000 ත් 50,000 ත් අතර ප්‍රමාණයක් අවශ්‍ය වන බවට ඇස්තමේන්තු කර ඇති අතර, 2015 වන විට සංචාරක හෝටල් සහ අතිරේක ආයතන යන දෙඅංශයෙම සතුව පැවතියේ හෝටල් කාමර 30,000 ක පමණ ප්‍රමාණයකි. 2016 වසරේ දී හෝටල් කාමර 6,400 කට වැඩි ප්‍රමාණයක් අලුතින් එකතු කිරීමට අපේක්ෂිත අතර, පහසුකම් වර්ධනය කිරීම සඳහා තවත් නව හෝටල් ව්‍යාපෘතීන් විශාල ප්‍රමාණයක් ක්‍රියාත්මක වීමට නියමිතව ඇත. කෙසේ වුවද, හෝටල් කාමර සංඛ්‍යාව ඉහළ දැමීම කෙරෙහි අවධානය යොමු නොකළ හොත් ඉහළ යන සංචාරක පැමිණීම සඳහා පහසුකම් සැලසීමට පවතින පහසුකම් කිසිසේත්ම ප්‍රමාණවත් නොවනු ඇත.
- **පුහුණු සේවකයින්ගේ අවශ්‍යතාවය සහ ශ්‍රම සංක්‍රමණය:** සංචාරක කර්මාන්තයේ නියැලුණු ශ්‍රී ලාංකික පුහුණු ශ්‍රමිකයින් විශාල පිරිසක් ඉහළ වැටුප් වෙනුවෙන් විදේශීය රටවල සේවයේ යෙදී සිටී. සංචාරක කර්මාන්තයේ බලාපොරොත්තු වන ඉහළ වර්ධනය සඳහා පහසුකම් සැපයීමට පවතින නිත්‍ය මිනිස් බල සැපයුම ද ප්‍රමාණවත් නොවේ. සංචාරක කර්මාන්තයේ ඉහළ යන පුහුණු ශ්‍රමික අවශ්‍යතා සපුරා ගැනීම සඳහා අවශ්‍ය සේවක පුහුණු කිරීම් රජයට තනිව සිදු කිරීමට නොහැකි අතර, ඒ සඳහා රාජ්‍ය හා පෞද්ගලික අංශ හවුල්ව කටයුතු කිරීම අත්‍යවශ්‍ය වේ.
- **ලෝක ප්‍රසිද්ධ හෝටල් දාම ශ්‍රී ලංකාව වෙත දක්වා ඇති අවධානය ප්‍රමාණවත් නොවීම සහ කොළඹ හෝටල් සඳහා පනවා ඇති අවම කාමර ගාස්තුව:** මෑත කාලයේ දී ගෝලීය හෝටල් දාම ශ්‍රී ලංකාව වෙත අවධානය යොමු කළ ද, බොහෝ ප්‍රමුඛ පෙළේ හෝටල් දාම ඔවුන්ගේ හෝටල් ව්‍යාපාර ශ්‍රී ලංකාව වෙත තවමත් ප්‍රමාණවත් පරිදි ව්‍යාප්ත කර නොමැති ආකාරයක් පෙන්නුම් කරයි. ෆෝබ්ස් සඟරාව නම්කර ඇති ලොව හොඳම අන්තර්ජාතික සුඛෝපභෝගී හෝටල් දාම සන්නාම 10 අතුරින් ශ්‍රී ලංකාවේ දක්නට ඇත්තේ හෝටල් දාම තුනක් පමණි. ඒ අතර, කොළඹ තරු පන්තියේ හෝටල් වෙත රජය මගින් පනවා ඇති අවම කාමර ගාස්තුව මගින් වර්ධන අවධියක පවතින සංචාරක කර්මාන්තය කෙරෙහි ඇති කරන වාසි සහ අවාසි පිළිබඳව බරපතල ලෙස සලකා බැලිය යුතුව ඇත.
- **සංචාරක ව්‍යාපාරයේ උපායමාර්ගික අවධානය ඉහළ, මැද සහ පහළ පෙළ සංචාරකයින් වෙත යොමු කිරීම:** ශ්‍රී ලංකාව සාපේක්ෂව අඩු වියදම් සහිත ගෙවන මුදලට වටිනාකමක් ලබාදෙන සංචාරක ගමනාන්තයක් ලෙස සලකනු ලැබුව ද ඉහළ පෙළ සංචාරකයින්ගේ ආකර්ෂණය ශ්‍රී ලංකාව වෙත ලබා ගැනීම සඳහා බොහෝ සාකච්ඡා සිදු වී ඇත. වර්තමානයේ එ.ජ. ඩොලර් 164 ක් වැනි අගයක පවතින සංචාරකයෙකුගේ දෛනික වියදම තවදුරටත් ඉහළ නැංවීම සඳහා ඉහළ පෙළේ සංචාරකයින් ආකර්ෂණය කර ගැනීම උපකාරී වේ. ඒ අතරම, ඉහළ පෙළේ සංචාරකයන් කෙරෙහි පමණක් නැඹුරු වීම මගින් සංචාරක කර්මාන්තය

අවධානමට ලක්විය හැකි බැවින් ශ්‍රී ලංකාව වැනි රටක් ඉහළ, මැද සහ පහළ පෙළ යන සියලුම සංචාරකයින්ගේ ආකර්ෂණය ලබාගැනීම සඳහා අවශ්‍ය වන ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග කෙරෙහි යොමු වීම වඩා ආරක්ෂාකාරී වේ.

- **අවිධිමත් අංශය අන්තර්ග්‍රහණය කිරීම:** සංචාරක කර්මාන්තයේ විධිමත් අංශය හොඳින් නියාමනය වී තිබුණ ද, කර්මාන්තය තුළ සැලකියයුතු අවිධිමත් අංශයක් ක්‍රියාත්මක වෙමින් පවතී. එබැවින්, විධිමත් අංශය වෙත එම කොටස ද අන්තර්ග්‍රහණය කර ගැනීම සඳහා අවධානය යොමු කිරීම අත්‍යවශ්‍ය වන අතර, එමගින් නිසියාකාර නියාමනයක් සඳහා ඉඩ සැලසෙනු ඇත. අවිධිමත් අංශය තුළ සංචාරක කර්මාන්තයේ ආරක්ෂාව සහ ආචාරධර්ම වැඩිදියුණු කිරීම අත්‍යවශ්‍ය වන අතර, එසේ කිරීමට අපොහොසත් වීම රටෙහි යහපත් ප්‍රතිරූපය බිඳ වැටීමට හේතු වනු ඇත. තවද, අවිධිමත් අංශය හා සම්බන්ධ විශ්වාසනීය තොරතුරු නොමැති වීම සංචාරක කර්මාන්තය හා සම්බන්ධ ඉදිරි සැලසුම් සැකසීමේ දී ගැටලු නිර්මාණය කරනු ඇත.

- **විශාල විභවතාවයක් පවතින චීනයෙන් පැමිණෙන සංචාරකයින්ගේ වර්ධනයට සරිලන සේ පහසුකම් සැපයීමට ඇති හැකියාව:** සංචාරක කර්මාන්තයේ දැනට පවතින වර්ධනය වෙමින් පවතින චීන සංචාරකයින් සඳහා අවශ්‍ය පහසුකම් සපුරාලීමේ දී නව අභියෝග නිර්මාණය වී ඇත. එහිදී චීන භාෂාවෙන් විකාශනය වන රූපවාහිනී සහ ගුවන්විදුලි නාලිකා, චීන භාෂාව කථා කරන සංචාරක මගපෙන්වන්නන් යනාදිය අවශ්‍ය වනු ඇත.

- **නැවතී සිටින රාත්‍රී සංඛ්‍යාව ලෙස ගණනය කරනු ලබන සංචාරකයෙකු නැවතී සිටින සාමාන්‍ය කාලසීමාව වසර ගණනාවක් පුරා එක ලෙසම පැවතීම:** දෛනික සංචාරක වියදම පසුගිය වසර කීපය පුරා වර්ධනය වී තිබුණ ද ප්‍රධාන වශයෙන්ම සංචාරකයින් සඳහා ශ්‍රී ලංකාවේ පවතින ක්‍රියාකාරකම් අඩු වීම නිසා සංචාරකයකු නැවතී සිටින සාමාන්‍ය කාලසීමාව සංචාරක රාත්‍රීන් 10 ක් පමණ ලෙස නොවෙනස්ව පවතී. එමනිසා ශ්‍රී ලංකාවේ පවතින සංචාරක ආකර්ෂණයන් විවිධාංගීකරණය කිරීම සඳහා ප්‍රතිපත්තිමය තීරණ ගත යුතු වන අතර, එහිදී සංචාරක රාත්‍රීන් සංඛ්‍යාව අඩුම වශයෙන් සති දෙකක් ලෙස ඉලක්ක කිරීම සඳහා, මගී නෞකා සහ සාමුද්‍රික සංචාර, විවේකය අරමුණු කරගත් සංචාර සහ විනෝදාස්වාදය අරමුණු කරගත් සංචාර වැනි සංචාරක කර්මාන්තයේ පසුගාමී අංශ කෙරෙහි වඩාත් අවධානය යොමු කළ යුතුය. කෙසේ වුවද, ශ්‍රී ලංකාව දකුණු ආසියාවේ සැපයුම්, මූල්‍ය, වෙළඳ සහ තොරතුරු කේන්ද්‍රස්ථානයක් බවට සංවර්ධනය කිරීම සඳහා යෝජනා ගෙන ඒමත් සමග සාමාන්‍යයෙන් නැවතී සිටිනා සාමාන්‍ය කාලසීමාව අඩු, ව්‍යාපාර කටයුතු සඳහා පැමිණෙන සංචාරකයින්ගේ පැමිණීම් ඉහළ යනු ඇතැයි අපේක්ෂිතය. එමනිසා සංචාරය කිරීමේ අරමුණ අනුව වර්ග කර ඒ අනුව එම සංචාරකයින්ට වෙන් වෙන් වශයෙන් උචිත විවිධ ක්‍රමෝපාය අනුගමනය කිරීම අවශ්‍ය වනු ඇත.

- **නව නිර්මාණාත්මක ප්‍රවේශයක අවශ්‍යතාව:** තොරතුරු ලබාදීම සඳහා පමණක් නොව, බස්රථ, දුම්රිය, කුලීරථ, සහ හෝටල් වෙන්කිරීම්, ජංගම දුරකථන සම්බන්ධතා, වයි-ෆයි සම්බන්ධතා, සංචාර සැලසුම් ආදී වූ පුළුල් පරාසයක පැතිරෙන පරිදි සංචාරකයින් හා සම්බන්ධ සේවාවන් සපයන්නා වූ බහුකාර්ය සංචාරක තොරතුරු මධ්‍යස්ථාන සංඛ්‍යාව ප්‍රධාන සංචාරක ආකර්ෂණයන්හි සහ ප්‍රධාන ප්‍රවාහන කේන්ද්‍රස්ථානයන්හි තවදුරටත් වැඩි කිරීමේ අවශ්‍යතාවයක් පවතී. අධිවේගී අන්තර්ජාල සම්බන්ධතා සමගින් මුළු දිවයිනම ආවරණය වන පරිදි යෝජනා කරන ලද ගූගල් ලූන් ව්‍යාපෘතිය (Google Loon Project) වැනි නව්‍ය ව්‍යාපෘති හරහා, ජංගම දුරකථන හා අන්තර්ජාල ආවරණය වැඩි කිරීම තුළින්, විශේෂයෙන්ම සංචාරකයින්ගේ සම්බන්ධතා සහ සුරක්ෂිතභාවය පිළිබඳ හැඟීම ඉහළ යනු ඇත. සංචාරකයින් සඳහා වූ විශේෂ අවසරපත් (Tourist Pass), සෞන්දර්යාත්මක මාර්ග ඔස්සේ විශේෂ සංචාරක දුම්රිය සේවා සහ බස් චාරිකා, තද බෑවුම් සහිත කඳු තරණය කරනා දුම්රිය මාර්ග (Funicular Railway Routes) කේබල් කාර්, උසස් තත්ත්වයේ විනෝද උයන්, දේශීය මගී යාත්‍රා සහ කුඩා බෝට්ටු සේවා වැනි පහසුකම් ද සමඟින් සුදුසු සංචාරක හිතකාමී පොදු ප්‍රවාහන සේවා සැපයීම ද සංචාරකයින් වැඩියෙන් ආකර්ෂණය කර ගැනීම සඳහා ඉවහල් වනු ඇත. තවද, සංචාරක ක්ෂේත්‍රය හා සම්බන්ධ රාජ්‍ය ආයතන ද පෞද්ගලික අංශය ද ඇතුළුව සංචාරක කර්මාන්තයේ නියුතු සියලු පාර්ශ්වකරුවන් අධීක්ෂණය කිරීම සඳහා ඉහළ මට්ටමේ රාජ්‍ය ව්‍යුහයක් අවශ්‍ය වන අතර, එමගින් වඩා සහසම්බන්ධතාවයකින් යුතුව ඉහළ මට්ටමේ ක්‍රමෝපාය ක්‍රියාවට නැංවීමට ඉඩ සැලසෙනු ඇත. මීට අමතරව, වඩා හොඳ මාර්ග ආරක්ෂාව සහ අනුග්‍රහය, නිසි අපද්‍රව්‍ය බැහැර කිරීමේ පුරුදු සහ සංචාරකයින් කෙරෙහි වූ වැඩිදියුණු ආකල්ප සහ සංස්කෘතිකමය වටහා ගැනීම් ආදී වූ සමාජීය පරිවර්තන සංචාරක කර්මාන්තයේ තිරසාරභාවයට මෙන්ම සමස්ත සමාජයේම වර්ධනය කෙරෙහි වක්‍රව ආයක වනු ඇත.

සංචාරක කර්මාන්තයේ පවතින අභියෝග ජය ගැනීම සහ නව සංවර්ධනයන් ආරම්භ කිරීම සඳහා අවශ්‍ය යෝජනා ගණනාවක් 2016 රජයේ අයවැය මගින්

හඳුනා ගෙන තිබේ. ඊට අමතරව, රජයේ නව බස්නාහිර පළාත් මහානගර ප්‍රධාන සැලැස්ම මගින් බස්නාහිර පළාත ඉතා ඉහළ සංචාරක ගමනාන්තයක් බවට වැඩිදියුණු කිරීම සහ 2035 වසර වනවිට සංචාරක පැමිණීම් මිලියන 4.5 ක් දක්වා ඉහළ නංවා ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ඇතුලත් දිගුකාලීන සැලැස්මක් (Megapolis Master Plan) හඳුන්වා දී තිබේ. ගුවන් හා නාවික වෙළඳ කේන්ද්‍රස්ථාන, මධ්‍යම ව්‍යාපාරික දිස්ත්‍රික්ක, කාර්මික හා සංචාරක නගර, විද්‍යා හා තාක්ෂණ නගර, පාරිසරික ජනාවාස හා වැවිලි නගර සහ බහු මාදිලි ප්‍රවාහන කේන්ද්‍රස්ථාන වැනි සංකල්පීය ව්‍යාපෘති ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයට සෘජු හා වක්‍ර ප්‍රතිලාභ ලැබෙන ව්‍යාපෘති අතර වේ. මෙම නව උපායමාර්ග හා යෝජිත ක්‍රියාමාර්ග සංචාරක කර්මාන්තය මුහුණ දී ඇති ගැටලු ජය ගැනීමට සහ සෞභාග්‍යයේ මාවත කරා සංචාරක කර්මාන්තය රැගෙන යමින් ඉදිරි දශකය තුළ තිරසාර සංවර්ධනයක් ළඟාකර ගැනීම සඳහා උපකාරී වනු ඇත.

මූලාශ්‍ර:

From Island to Continent: Western Region Megapolis Master Plan, මහානගර සහ බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය

Travel and Tourism; Economic Impact 2015 Sri Lanka, World Travel and Tourism Council, (2015)


World Travel and Tourism Council, https://www.wttc.org
Sri Lanka Tourism Development Authority, https://www.sltda.gov.lk

විවිධ පුවත්පත් ලිපි

ව්‍යාපාරික කටයුතු සඳහා පැමිණි සංඛ්‍යාව සියයට 1 ක් පමණ වූ සුළු පිරිසක් වූ අතර ඥාති මිත්‍රාදීන් මුණ ගැසීම, ආගමික හා සංස්කෘතික කටයුතු, සෞඛ්‍යය, අධ්‍යාපනය හා ක්‍රීඩා කටයුතු සඳහා පැමිණි සංඛ්‍යාව 2015 වසරේ දී ප්‍රතිශතයක් ලෙස සියයට 32 ක් පමණ විය.

**සේවා ගිණුම ශක්තිමත් කරමින් 2015 වසරේ දී සංචාරක සේවා ඉපැයුම් විශාල වශයෙන් වර්ධනය විය.** සංචාරක සේවා ඉපැයුම් 2014 වසරේ දී වාර්තා කළ එ.ජ. ඩොලර් මිලියන 2,431 සමඟ සැසඳීමේ දී 2015 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 2,981 දක්වා සියයට 22.6 කින් වර්ධනය විය. විදේශ සංචාරක පැමිණීම් අඛණ්ඩව ඉහළ යෑම මෙන්ම සංචාරකයින්ගේ වියදම් ඉහළ යෑම සංචාරක ඉපැයුම් ඉහළ යෑම සඳහා උපකාරී විය. 2015 වසරේ දී සංචාරකයෙකුගේ සාමාන්‍ය දෛනික වියදම 2014 වසරේ වාර්තා වූ එ.ජ. ඩොලර් 160.8 සිට එ.ජ. ඩොලර් 164.1 දක්වා ඉහළ ගිය අතර, ඉහළ ක්‍රයශක්තියක් සහිත සංචාරකයින්ගේ පැමිණීම් වැඩිවීම සහ ඔවුන් වෙත සපයන ලද පහසුකම් පුළුල් වීම මෙයට මූලිකවම හේතු විය. මේ අතර, 2015 වසරේ දී සංචාරකයෙකු මෙරට ගතකරන සාමාන්‍ය කාලය දින 10.1 ක් ලෙස වාර්තා විය. සංචාරක සේවා කර්මාන්තය යෝග්‍ය වෙළඳපොළ වෙත විවිධාංගීකරණය කිරීම සහ සාම්ප්‍රදායික නොවන ක්ෂේත්‍ර වෙත සංවර්ධනය කිරීම ද මෙම අංශයෙහි වර්ධනය සඳහා දායක විය. විවිධ සංචාරක සේවා ප්‍රවර්ධන වැඩසටහන් සහ හෝටල් කර්මාන්තයෙහි ධාරිතාවය වර්ධනය වීම තුළින් ඉදිරි වසරවල දී සංචාරක ඉපැයුම්වල මෙම වර්ධන ප්‍රවණතාව අඛණ්ඩව පවතිනු ඇතැයි අපේක්ෂිතය. මේ අතර, විවේකය, අධ්‍යාපනය සහ සෞඛ්‍ය අරමුණු මත විදේශ සංචාරයන්හි නිරත වන ශ්‍රී ලාංකිකයින් ප්‍රමාණය ඉහළ යෑම හේතුවෙන් සංචාරක ගෙවීම්, සංචාරක ඉපැයීම්වලට සාපේක්ෂව අඩු අගයකින් වුවද වර්ධනය විය. සමස්තයක් ලෙස, විදේශ ගමන් සහ සංචාරක සේවා උප ගිණුමෙහි අතිරික්තය 2015 වසරේ දී සියයට 33.6 කින් වර්ධනය විය.

5.8 රූප සටහන
සංචාරක පැමිණීම් සහ ඉපැයීම්




**2015 වසරේ දී සංචාරක අංශයේ ආයෝජන තවදුරටත් පුළුල් විය.** වසර තුළ දී ෂැන්ග්‍රිලා (Shangri-La), හයට් (Hyatt), මූවන්පික් (Movenpick), ෂෙරටන් (Sheraton), ආර් අයි යූ (RIU), බැනියන් ට්‍රී (Banyan Tree), අනන්තරා (Anantara), සහ අයි ටී සී (ITC) සහ නෙක්ස්ට් (Next) ඇතුළු ජාත්‍යන්තර හෝටල් ජාලවල ඉදිකිරීම් කටයුතු අඛණ්ඩව සිදු විය. එ.ජ. ඩොලර් මිලියන 889 ක වටිනාකමක් සහිත හෝටල් කාමර 2,242 කින් සමන්විත වන නව හෝටල් ව්‍යාපෘති 35 ක් සඳහා ආයෝජන යෝජනාවලට 2015 වසර තුළ දී අනුමැතිය හිමි වූ අතර, 2014 වසරේ දී හෝටල් ක්ෂේත්‍රයේ ආයෝජනය කරන ලද එ.ජ. ඩොලර් මිලියන

**5.7 සංඛ්‍යා සටහන**

**සංචාරක ක්ෂේත්‍රයේ ක්‍රියාකාරිත්වය**

| ශීර්ෂය | 2011 | 2012 | 2013 | 2014 | 2015 (අ) | වාර්ෂික වෙනස්වීම % 2015 |
|---|---|---|---|---|---|---|
| සංචාරක පැමිණීම් (සංඛ්‍යාව) | 855,975 | 1,005,605 | 1,274,593 | 1,527,153 | 1,798,380 | 17.8 |
| පැමිණීමේ අරමුණ අනුව සංචාරකයින් ගණන | | | | | | |
| විනෝදාස්වාදය | 687,830 | 748,436 | 915,208 | 1,037,644 | 1,198,240 (ඇ) | 15.5 |
| ව්‍යාපාර | 68,436 | 90,040 | 67,946 | 20,270 (ආ) | 23,323 (ඇ) | -15.1 |
| වෙනත් | 99,709 | 167,129 | 291,439 | 469,239 (ආ) | 576,817 (ඇ) | 22.9 |
| සංචාරකයින් ගත කළ රාත්‍රී ගණන (දහස්) | 8,560 (ආ) | 10,056 | 10,909 (ආ) | 15,119 | 18,163 | 20.1 |
| කාමර උපයෝජන අනුපාතය (%) | 77.1 | 71.2 | 71.7 | 74.3 | 74.5 | 0.3 |
| දළ සංචාරක ලැබීම් (රු. මිලියන) | 91,926 | 132,427 | 221,720 | 317,479 | 405,492 | 27.7 |
| ඒක පුද්ගල සංචාරක ලැබීම් (රු.) | 107,393 | 131,688 | 173,954 | 207,889 | 225,476 | 8.5 |
| මුළු සේවා නියුක්තිය (සංඛ්‍යාව) | 138,685 | 162,869 | 270,150 | 299,890 | 319,436 (ඇ) | 6.5 |
| සෘජු සේවා නියුක්තිය | 57,786 | 67,862 | 112,550 | 129,790 | 135,930 (ඇ) | 4.7 |
| වක්‍ර සේවා නියුක්තිය (ඇ) | 80,899 | 95,007 | 157,600 | 170,100 | 183,506 | 7.9 |

(අ) තාවකාලික
(ආ) සංශෝධිත
(ඇ) ඇස්තමේන්තු

මූලයන්: ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය
ශ්‍රී ලංකා මහ බැංකුව

425 හා සැසඳීමේ දී සියයට 109 ක වර්ධනයක් මෙමගින් පෙන්නුම් කෙරුණි. තවද, සංචාරක ක්ෂේත්‍රයට කාමර 867 ක් එකතු කරන අතරතුර මුළු හෝටල් සංඛ්‍යාව 354 ක් දක්වා වැඩි කරමින් නව හෝටල් ව්‍යාපෘති 20 ක් සිය සේවා සැපයීමේ කටයුතු මෙම වසර තුළ දී ආරම්භ කළේය. එමගින් 2015 වසරේ දී කාමර ධාරිතාවය 19,377 ක් දක්වා පුළුල් වනු ඇත. තවද, 2015 වසරේ දී අති සුඛෝපභෝගී බංගලා, සංචාරක නිකේතන, සංචාරක සත්කාර නිවාස, පෞරාණික නිවාස, බංගලා සහ කුලියට ගත් නිවාස ආදී වූ සංචාරක ක්ෂේත්‍රයේ අතිරේක ආයතන සංඛ්‍යාව 1,409 ක් දක්වා වැඩි වූ අතර, කාමර ධාරිතාවය 10,702 ක් දක්වා වර්ධනය විය. රට තුළ පැවති අභ්‍යන්තර අර්බුදය නිම වීමත් සමඟ නැගෙනහිර සහ උතුරු පළාත්වල සංචාරක කර්මාන්තය ශීඝ්‍රයෙන් වර්ධනය වෙමින් පවතින අතර, දේශීය හා විදේශීය ආයෝජකයින් දැනටමත් මෙම පළාත්වල ආයෝජනය කිරීම ආරම්භ කර ඇත. මෙම යහපත් තත්ත්වය පිළිබිඹු කරමින් අභ්‍යන්තර අර්බුදය නිම වීමෙන් පසුව සිට 2015 වසර දක්වා කාලය තුළ, පිළිවෙළින් නැගෙනහිර හා උතුරු පළාත්වල සංචාරක ප්‍රවර්ධනය හා සම්බන්ධ ව්‍යාපෘති 56 ක් සහ 18 ක් දියත් කර ඇත. මීට අමතරව, කල්පිටියේ ඒකාබද්ධ සංචාරක නිකේතන ව්‍යාපෘති ඇති කිරීම, දෙද්දූවේ නිවාඩු නිකේතනයක් සහ විනෝදාස්වාදය සපයන ස්ථානයක් ඇති කිරීම සහ කුච්චවේලිවල වෙරළාසන්න නිවාඩු නිකේතනයක් තැනීම වැනි සංවර්ධන කටයුතු සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් යෝජනා ඉදිරිපත් කර ඇත.

**සංචාරක ක්ෂේත්‍රය හා සම්බන්ධ අංශ සංවර්ධනය කිරීම අගය එකතු කළ ක්‍රියාකාරකම් වැඩි කිරීමට හේතු වන අතර, එමගින් සමස්ත ආර්ථිකයටම ප්‍රතිලාභ ලැබෙනු ඇත.** මේ යටතේ සංචාරක කලාප තුළ පවතින ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය යටතේ ලියාපදිංචි වී නොමැති ආපනශාලා සෞඛ්‍ය අමාත්‍යාංශයේ සහ පළාත් පාලන ආයතනවල සහයෝගය ද ඇතිව ලියාපදිංචි කිරීමේ වැඩසටහනක් හඳුන්වා දී ඇති අතර, එම ආපනශාලාවල පවතින පහසුකම්, සනීපාරක්ෂක තත්ත්වයන් සහ සේවාවල ප්‍රමිතිය වැනි මූලික ප්‍රමිතීන් වැඩිදියුණු කිරීමට ද අපේක්ෂිතය. 2015 වසරේ දී ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය සංචාරක කර්මාන්තයේ කොටස්කරුවන් සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව ප්‍රධාන වෙළඳපොළ 20 ක් කෙරෙහි අවධානය යොමු කරමින් සංචාරකයින් මෙරටට යළි යළිත් පැමිණීමට පොළඹවන ශ්‍රී ලංකාවට ආවේණික සොභාදහම, සංස්කෘතිය සහ ත්‍රාසජනක ක්‍රියාකාරකම්වලින් සමන්විත වූ සංචාරක අත්දැකීම් ආදී වූ සංචාරක ආකර්ෂණයන් වැඩිදියුණු කිරීම සඳහා ශ්‍රී ලංකාව සඳහාම සුවිශේෂී වූ ක්‍රමෝපාය අලෙවිකරණ සැලැස්මක් එළිදැක්වීය. දේශීය සංචාරක කර්මාන්තය තුළ දැනට පවතින වෙළඳ සබඳතා වඩා ශක්තිමත් කර ගැනීමට සහ නව වෙළඳ සබඳතා වැඩිදියුණු කර ගැනීම සඳහා අවස්ථා රාශියක් නිර්මාණය කර ගැනීම සඳහා, ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය 2015 වසරේ දී විදේශ රටවල පැවැත්වූ සංචාරක වෙළඳපොළ සහ වෙළඳ සමුළු 50 කට අධික සංඛ්‍යාවකට සහභාගි විය. තවද, ජනමාධ්‍යවේදීන් ශ්‍රී ලංකාව නැරඹීම වැඩසටහන යටතේ ලෝකයේ ප්‍රධාන වෙළඳපොළවල

අති දක්ෂ ජනමාධ්‍යවේදීන් ලංකාවට ගෙන්වා ශ්‍රී ලංකාව පිළිබඳව දැනුම්වත් කිරීමට ද අරමුණු කර ගෙන ඇත. මීට අමතරව, සංචාරකයින්ට ශ්‍රී ලංකාව පිළිබඳව අත්දැකීම් ලබා ගැනීම සඳහා වේදිකාවක් නිර්මාණය කරමින් ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය දේශීය වැඩසටහන් 35 ක් සාර්ථකව මෙහෙයවීය. සංස්කෘතික හා ආගමික සංදර්ශන, සංචාරක උළාව, කොළඹ විලාසිතා සතිය, හෝටල් ප්‍රදර්ශන, සජීවී ත්‍රිකුණාමල උත්සවය (Live Trinco Festival) සහ ලොව විශාලතම තේ සාදය සඳහා වූ ගිනස් ලෝක වාර්තාවට උත්සාහ කිරීම වැනි සාර්ථකව දේශීය වැඩසටහන් කිහිපයක් 2015 වසරේ දී පැවැත්වුණි.

#### විදුලි සන්දේශ, පරිගණක සහ තොරතුරු සේවා

**2015 වසරේ දී, විදුලි සන්දේශ, පරිගණක සහ තොරතුරු සේවා අපනයන ලැබීම් අඛණ්ඩව වර්ධනය විය.** විදුලි සන්දේශ, පරිගණක හා තොරතුරු සේවා මත වූ මුළු අපනයන ඉපැයුම් 2014 වසරට සාපේක්ෂව 2015 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 805 ක් දක්වා සියයට 7.6 කින් වර්ධනය විය. විදුලි සන්දේශ අංශයෙහි මුළු ඉපැයුම් ප්‍රමාණය 2014 වසරේ දී වාර්තා කළ එ.ජ. ඩොලර් මිලියන 120 සිට 2015 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 128 ක් දක්වා වර්ධනය වෙමින් එහි වර්ධන ප්‍රවණතාව තවදුරටත් පවත්වා ගැනුණි. විදුලි සන්දේශ කර්මාන්තයෙහි පවතින ඉහළ තරගකාරිත්වය මෑත වසරවල දී ජාත්‍යන්තර දුරකථන ඇමතුම් ගාස්තුවල දේශීය මිල ගණන් සැලකියයුතු ලෙස අඩු කිරීමට හේතු වුවද, අන්තර්ජාල සේවාවන් සැලකියයුතු ලෙස භාවිත කිරීමෙහි ප්‍රතිඵලයක් ලෙස මෙරටට ලැබෙන හා මෙරටින් ලබා ගන්නා ඍජු දුරකථන ඇමතුම් මිනිත්තු ගණන 2014 වසරට සාපේක්ෂව 2015 වසරේ දී අඩු විය. මේ අතර, විදුලි සන්දේශ සේවා කර්මාන්තය ඩිජිටල් සහ දුරකථන ආශ්‍රිත වෙළඳපොළෙහි වැඩි වන ඉල්ලුම සපුරාලීම සඳහා ඉතා ශීඝ්‍ර පරිවර්තනයකට භාජනය වෙමින් පවතී. රට පුරා අන්තර්ජාල භාවිතය ඉහළ නැංවීමේ අපේක්ෂාවෙන් ක්‍රියාත්මක කිරීමට නියමිත "ගූගල් ලූන්" ව්‍යාපෘතිය සාර්ථකව නිම කිරීම මගින් මෙම අංශයෙහි ක්‍රියාකාරිත්වය වර්ධනය වනු ඇත.

**පරිගණක සහ තොරතුරු සේවා අංශයෙහි ක්‍රියාකාරිත්වය 2015 වසරේ දී වර්ධනය විය.** පරිගණක සහ තොරතුරු සේවා උප අංශයෙහි දළ ලැබීම් 2015 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 677 දක්වා සියයට 7.8 කින් වර්ධනය විය. ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීම (BPO) සහ දැනුම පදනම් කරගත් ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර මත පැවරීම (KPO) ඇතුළත් මෘදුකාංග සහ තොරතුරු තාක්ෂණය පදනම් කරගත් සේවා (ITES) ශ්‍රී ලංකාවේ ඉහළ වර්ධන ශක්‍යතාවයක් සහිත අංශයක් ලෙස නැගී එමින් පවතින අතර, පෙර වසරට සාපේක්ෂව 2015 වසරේ දී සැලකියයුතු ලැබීම් ප්‍රමාණයක් වාර්තා කළේය. එහි ප්‍රතිඵලයක් ලෙස, 2016 වසරේ දී, ගෝලීය වශයෙන් ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීමේ ප්‍රධාන ස්ථානයන් නම් කිරීමේ A.T. Kearney Global Services Location Index (GSLI) නැමති දර්ශකය අනුව ශ්‍රී ලංකාව 2015 වසරේ පැවති තත්ත්වයේ සිට ස්ථානයන් දෙකක් ඉදිරියට එමින් දහහතර වන ස්ථානය හිමිකර ගෙන ඇත. තොරතුරු තාක්ෂණය, ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීම සහ දැනුම පදනම් කරගත් ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීම සඳහා අවශ්‍ය වන පුහුණු ශ්‍රමය ලබාදීමේ හැකියාව ශ්‍රී ලංකාව සතුව පවතින අතර, ශ්‍රම වෙළඳපොළෙහි ඇති ගැටලු අතුරෙන් මූලිකවම ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීමේ අංශය සහ දැනුම පදනම් කරගත් ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීම යන අංශයන්හි ඇති ගැටලු නිරාකරණය කිරීම පිණිස නීති සංශෝධනය කිරීම සඳහා යෝජනාවක් රජය විසින් 2016 වසර සඳහා වූ අයවැය තුළින් ඉදිරිපත් කර ඇත. ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීමේ කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා ජාත්‍යන්තර ප්‍රවර්ධන සහ මිනුම්දඬු භාවිතය යොදා ගැනීමේ යෝජනාවක් ද ඉදිරිපත් කර ඇත.

### 5.4.2 ප්‍රාථමික ආදායම

**සංචිත වත්කම් ආයෝජනය තුළින් ලද ඉපැයුම් පහළ යෑම, පොලී ගෙවීම් සහ ලාභාංශ හා ප්‍රතිආයෝජන ඉපැයුම් ලෙස වූ ගෙවීම් ඉහළ යෑම හේතුවෙන් 2015 වසරේ දී ප්‍රාථමික ආදායම් ගිණුමේ හිඟය තවදුරටත් වැඩි විය.** 2015 වසරේ දී ප්‍රාථමික ආදායම් ගිණුමේ හිඟය 2014 වසරේ දී වූ එ.ජ. ඩොලර් මිලියන 1,808 ට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 2,097 ක් විය. 2015 වසරේ දී ප්‍රාථමික ආදායම් ගිණුම වෙත වූ ලැබීම්, 2014 වසරේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 155 ට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 127 ක් වූ අතර, සංචිත වත්කම් ආයෝජනය මගින් ඉපැයූ ආදායමෙහි පහළ යෑම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. වසර තුළ දී සිදු වූ දළ නිල සංචිත මට්ටමෙහි අඩු වීම, සංචිත මගින් ඉපැයූ ආදායම 2014 වසරේ දී වූ එ.ජ. ඩොලර් මිලියන 102 ට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 66 ක් දක්වා අඩු වීමට හේතු විය.

**2015 වසර තුළ දී ප්‍රාථමික ආදායම් ගිණුමේ ගෙවීම් ඉහළ ගියේය.** 2015 වසර තුළ දී ප්‍රාථමික ආදායම් ගිණුමෙහි වූ මුළු ගෙවීම් 2014 වසරේ දී වූ එ.ජ. ඩොලර් මිලියන 1,963 ට සාපේක්ෂව එ.ජ. ඩොලර්

මිලියන 2,224 දක්වා සියයට 13.3 කින් ඉහළ ගියේය. ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර සඳහා වූ පොලී ගෙවීම් ඉහළ යෑම සහ සෘජු ආයෝජන ලැබීම් සඳහා වූ ලාභාංශ ගෙවීම් ඉහළ යෑම මේ සඳහා මූලිකවම හේතු විය. 2015 වසරේ දී සෘජු ආයෝජන ව්‍යාපාරයන්හි ලාභාංශ සහ ප්‍රතිආයෝජන ඉපැයුම් ලෙස වූ ගෙවීම් පෙර වසරේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 670 ට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 811 දක්වා වැඩි විය. මෙම ගෙවීම්, එ.ජ. ඩොලර් මිලියන 469 ක ලාභාංශ ගෙවීම් සහ එ.ජ. ඩොලර් මිලියන 341 ක ප්‍රතිආයෝජන ඉපැයුම්වලින් සමන්විත වන අතර, ප්‍රාථමික ආදායම් ගිණුමෙන් වන ගෙවීම් වශයෙන් සටහන් වන ප්‍රතිආයෝජන ඉපැයුම් මූල්‍ය ගිණුමේ සෘජු ආයෝජන ලැබීම් වශයෙන් සැලකේ. සෘජු ආයෝජන මත වූ ලාභාංශ ගෙවීම් පෙර වසරට සාපේක්ෂව ඉහළ අගයක් ගනු ලැබුව ද සිය ආයෝජනයන් මත වූ ඉපැයුම් නැවත ආයෝජනය නොකොට තම රට වෙත ගෙන්වා ගැනීමට ආයෝජකයින් තුළ වූ කැමැත්ත පිළිබිඹු කරමින් ප්‍රතිආයෝජන ඉපැයුම් පෙර වසරට සාපේක්ෂව අඩු විය. මේ අතර, 2015 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 868 ක විවිධ ආයෝජන මත වූ මුළු පොලී ගෙවීම් අතරින් එ.ජ ඩොලර් මිලියන 108 ක් හිමිකම් ආයෝජන මත ලාභාංශ ගෙවීම් වූ අතර, එ.ජ. ඩොලර් මිලියන 760 ක් ණය සුරැකුම්පත් මත වූ කූපන සහ පොලී ගෙවීම් විය. තවද, 2015 වසරේ දී විදේශීය ණය සඳහා වූ පොලී ගෙවීම්වලින් සමන්විත ප්‍රාථමික ආදායම් ගිණුමේ අනෙකුත් ආයෝජන ගෙවීම් 2014 වසරේ දී වූ එ.ජ. ඩොලර් මිලියන 398 ට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 463 ක් විය. 2015 වසරේ දී විදේශීය ණය සඳහා වූ මුළු පොලී ගෙවීම් අතුරින් රජය, පෞද්ගලික අංශය හා රජය සතු වාණිජ ව්‍යවසායයන්, තැන්පතු භාරගන්නා ආයතන සහ මහ බැංකුව විසින් ලබාගන්නා ලද විදේශීය ණය සඳහා වූ පොලී ගෙවීම් පිළිවෙළින් එ.ජ. ඩොලර් මිලියන 266, එ.ජ. ඩොලර් මිලියන 118, එ.ජ. ඩොලර් මිලියන 67 සහ එ.ජ. ඩොලර් මිලියන 13 ක් විය. නොපියවා ඉතිරිව ඇති ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර ප්‍රමාණය සාපේක්ෂව අඩු මට්ටමක පැවතිය ද, ව්‍යාපෘති ණය සඳහා වන පොලී ගෙවීම්වලට සාපේක්ෂව රජය විසින් ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර සඳහා සිදු කරන ඉහළ කූපන ගෙවීම් සමඟ මෑත වසර කිහිපය තුළ දී කූපන හා පොලී ගෙවීම්හි ව්‍යුහාත්මක වෙනස්කම් දක්නට ලැබුණි.

### 5.4.3 ද්විතීයික ආදායම

**ප්‍රධාන වශයෙන් ද්විතීයික ආදායම් ලැබීම් තුළ ඉහළ දායකත්වයක් දරන විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ මන්දගාමී වීම හේතුවෙන් ද්විතීයික ආදායම් ගිණුම වසර තුළ දී අඩු අගයක පැවතුණි.** විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ, 2014 වසරේ දී වාර්තා කළ සියයට 9.5 ක වර්ධනයේ සිට කැපීපෙනෙන අඩු වීමක් පෙන්නුම් කරමින් 2015 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 6,980 දක්වා සියයට 0.5 කින් අඩු විය. 2014 වසරට සාපේක්ෂව 2015 වසර තුළ දී රජයේ සංක්‍රාම ද සියයට 4.3 ක අඩු වීමක් වාර්තා කළේය. එහි ප්‍රතිඵලයක් ලෙස, ද්විතීයික ආදායම් ගිණුම වෙත වූ ලැබීම්, පෙර වසරට සාපේක්ෂව සියයට 0.5 ක අඩු වීමක් පෙන්නුම් කරමින් 2015 වසර තුළ දී, එ.ජ. ඩොලර් මිලියන 7,007 ක් ලෙස වාර්තා විය. විදේශීය සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණවල ප්‍රධානතම සාම්ප්‍රදායික මූලාශ්‍රය වන මැද පෙරදිග තෙල් අපනයනය කරන රටවල ආදායම පහත වැටීම සහ එහි ප්‍රතිඵලයක් ලෙස එම රටවල වර්ධනය මන්දගාමී වීම 2015 වසරේ විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ පහත වැටීමට හේතු විය. තවද, ගෘහ සේවිකාවන් ඇතුළු අර්ධ පුහුණු හා නුපුහුණු කාණ්ඩය යටතේ වූ ශ්‍රම සංක්‍රමණය සියයට 23.2 කින් අඩු වීම ද විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ අඩු වීම කෙරෙහි හේතු වී ඇත. රජය විසින් ගෘහ සේවිකාවන් හා නුපුහුණු කම්කරුවන් විදේශ සේවා නියුක්තිය සඳහා පිටත්ව යෑම අධෛර්යමත් කිරීම සඳහා ගනු ලැබූ විවිධ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග සහ මැද පෙරදිග කලාපය තුළ පවතින භූ-දේශපාලන අස්ථාවරත්වය ශ්‍රම සංක්‍රමණයේ මෙම පහත වැටීම සඳහා හේතු විය. මේ අතර, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් නිකුත් කර ඇති නවතම දත්ත අනුව වෘත්තීයවේදීන් ඇතුළු පුහුණු කාණ්ඩය යටතේ වන ශ්‍රම සංක්‍රමණය වසර තුළ දී සියයට 12.5 කින් වර්ධනය වී ඇති අතර, එමගින් එළඹෙන වසරවලදී විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණවල සංයුතියෙහි වෙනස් වීමක් සිදු වනු ඇති බව පෙන්නුම් කෙරේ.

## 5.5 ජංගම ගිණුමේ ශේෂය

**වෙළඳ හා ආදායම් ගිණුම්වල හිඟයයන් පුළුල් වීම හමුවේ වුවද, ප්‍රධාන වශයෙන් සේවා හා ද්විතීයික ආදායම් ගිණුම්වල අතිරික්ත හේතුවෙන් 2015 වසරේ විදේශීය ජංගම ගිණුමේ හිඟය එ.ජ. ඩොලර් බිලියන 2.0 කට සීමා විය.** පාරිභෝගික භාණ්ඩ ආනයනය සඳහා වන වියදම් ඉහළ යෑම සහ අපනයන ආදායම පහත වැටීම හේතුවෙන් 2015 වසර තුළ දී වෙළඳ ගිණුමේ හිඟය අඛණ්ඩව පුළුල් විය. කෙසේ නමුත්, ජාත්‍යන්තර වෙළඳපොළෙහි තෙල් මිල සැලකියයුතු ලෙස පහළ යෑම හමුවේ බොර තෙල් ආනයනය මත වූ වියදම අඩු වීම හේතුවෙන් වෙළඳ හිඟය සැලකියයුතු ලෙස ඉහළ යෑම වැළකුණු අතර, එහි ප්‍රතිඵලයක් ලෙස 2015 වසරේ දී වෙළඳ හිඟය පෙර වසරට සාපේක්ෂව සියයට 1.7 ක

සුළු වර්ධනයක් වාර්තා කළේය. කෙසේ නමුත්, ප්‍රධාන වශයෙන් සංචාරක ඉපැයීම්හි කැපී පෙනෙන ඉහළ යෑම හේතුවෙන් සේවා ගිණුමෙහි ඇති වූ අතිරික්තය මගින් සහ විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණවල සිදු වූ සුළු අඩු වීම හේතුවෙන් ද්විතීයික ආදායම් ගිණුමේ පසු බෑමක් ඇති වුවද, එහි වාර්තා වූ අතිරික්තය මගින් වෙළඳ සහ ආදායම් ගිණුම්වල හිඟයෙන් කොටසක් ආවරණය කෙරිණි. ඒ අනුව, 2015 වසරේ දී ජංගම ගිණුමේ හිඟය පෙර වසරේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 1,988 ට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 2,009 ක් විය. කෙසේ නමුත්, නාමික වශයෙන් ද.දේ.නි.යේ සිදු වූ සුළු වර්ධනයෙහි ප්‍රතිඵලයක් ලෙස 2015 වසරේ දී ජංගම ගිණුමේ හිඟය ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස 2014 වසරේ දී වූ සියයට 2.5 ට සාපේක්ෂව සියයට 2.4 දක්වා සුළු වශයෙන් අඩු විය.


## 5.6 ප්‍රාග්ධන ගිණුමේ ශේෂය

**ප්‍රාග්ධන සංක්‍රාම ලැබීම් අඩු වීම හේතුවෙන් 2015 වසරේ දී ප්‍රාග්ධන ගිණුමේ ශේෂය අඩු විය.** 2015 වසරේ දී ප්‍රාග්ධන ගිණුමෙහි ශුද්ධ ලැබීම් 2014 වසරේ වූ එ.ජ. ඩොලර් මිලියන 58 සිට එ.ජ. ඩොලර් මිලියන 46 ක් දක්වා අඩු විය. 2014 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 15 ක් වූ ප්‍රාග්ධන සංක්‍රාම ගෙවීම්, 2015 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 24 ක් දක්වා වැඩි වීම මේ සඳහා මූලික වශයෙන් හේතු විය. මේ අතර, 2014 වසරේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 73 ක් වූ රජය සහ පෞද්ගලික අංශය ලද ප්‍රාග්ධන සංක්‍රාම ද 2015 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 71 ක් දක්වා අඩු විය.

## 5.7 මූල්‍ය ගිණුම

**2015 වසරේ ගෙවුම් තුලනයෙහි මූල්‍ය ගිණුමෙහි ශුද්ධ විදේශ වගකීම් වෙනස්වීම් සහ ශුද්ධ මූල්‍ය වත්කම් අත්කර ගැනීම් 2014 වසරට සාපේක්ෂව සැලකියයුතු ලෙස අඩු විය.** 2014 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 4,124 කින් ඉහළ ගිය ශුද්ධ විදේශ වගකීම්වල වෙනස් වීම් 2015 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 3,227 ක් වූ අතර ශුද්ධ මූල්‍ය වත්කම් අත්කර ගැනීම් 2014 වසරේ දී වාර්තා කළ එ.ජ. ඩොලර් මිලියන 2,588 ක වැඩි වීම සමඟ සංසන්දනය කළ විට 2015 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 957 ක වැඩි වීමක් පමණක් වාර්තා කළේය. 2015 වසරේ දී ගෝලීය ආර්ථිකයේ ක්‍රියාකාරිත්වය මූල්‍ය ගිණුම වෙත වූ ලැබීම් සාපේක්ෂව අඩු මට්ටමක පැවතීමට යම් පමණකට හේතු වූ අතර ප්‍රධාන ජාතික මැතිවරණ දෙකක් පැවැත්වීම හේතුවෙන් ආයෝජකයින්ගේ විශ්වාසය අඩු වීම ද විදේශීය සෘජු ආයෝජන ලැබීම් වසර තුළ දී අපේක්ෂා කළ මට්ටමට වඩා අඩු වීමට හේතු විය. වසරේ පළමු කාර්තු තුන

**5.9 රූප සටහන** මූල්‍ය ගිණුමේ ලැබීම්




තුළ දී එක්සත් ජනපදයේ පොලී අනුපාතික ඉහළ යනු ඇතැයි යන අපේක්ෂාව සහ ඉන් පසුව හතරවන කාර්තුවේ දී පොලී අනුපාතික ඉහළ දැමීම ශ්‍රී ලංකාව ඇතුළු අනෙකුත් නැගී එන වෙළඳපොළ ආර්ථිකයන් කෙරෙහි දැඩි බලපෑමක් ඇති කළේය. එහි ප්‍රතිඵලයක් ලෙස, රාජ්‍ය සුරැකුම්පත්, එනම් භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කර වෙළඳපොළෙහි විදේශීය ආයෝජන සහ කොළඹ කොටස් වෙළඳපොළෙහි විදේශීය ආයෝජන සැලකියයුතු ආපසු ගෙවීම් ප්‍රමාණයක් වාර්තා කළේය. වසර ආරම්භයේ දී එ.ජ. ඩොලර් මිලියන 500 ක කල්පිරුණු ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරය පියවීමෙන් අනතුරුව ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර දෙකක් මගින් ලද එ.ජ. ඩොලර් මිලියන 2,150 වසර තුළ දී ගෙවුම් තුලනයේ මූල්‍ය ගිණුමේ ප්‍රධානතම ලැබීම විය. ඉන්දියානු සංචිත බැංකුව සමඟ ඇතිකර ගත් විදේශ විනිමය හුවමාරු ගිවිසුම තුළින් ලද එ.ජ. ඩොලර් මිලියන 1,500 මූල්‍ය ගිණුම වෙත වාර්තා වූ අනෙක් ප්‍රධාන ලැබීම වූ අතර, එයින් එ.ජ. ඩොලර් මිලියන 400 ක් 2015 වසර තුළ දී පියවන ලදී. වසර තුළ දී ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර නිකුත් කිරීම තුළින් විදේශීය අරමුදල් රැස්කර ගැනීම කෙරෙහි රජය විසින් අවධානය යොමු කළේය. තවද, මූල්‍ය ගිණුම වෙත විදේශ විනිමය ලැබෙන සාම්ප්‍රදායික මූලාශ්‍ර වන රජය, රජය සතු වාණිජ ව්‍යවසායයන් සහ පෞද්ගලික අංශය ලබාගත් විදේශීය ණය 2015 වසර තුළ දී අඩු විය.

### 5.7.1 සෘජු ආයෝජන

**ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි සමාගම් ලබාගත් ණය ද ඇතුළත් මුළු විදේශීය සෘජු ආයෝජන 2015 වසරේ දී සැලකියයුතු ලෙස අඩු විය.** ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි සමාගම් ලබාගත් ණය ඇතුළත් මුළු විදේශීය සෘජු ආයෝජන 2015 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 1,161 ක් වූ අතර ආයෝජන

මණ්ඩලයේ ලියාපදිංචි සමාගම් ලබාගත් ණය ඉවත් කළ පසු විදේශීය සෘජු ආයෝජන එ.ජ. ඩොලර් මිලියන 681 ක් විය. මෙය, 2014 වසරේ දී පිළිවෙළින් වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 1,635 සහ එ.ජ. ඩොලර් මිලියන 894 සමඟ සැසඳීමේ දී සැලකියයුතු අඩු වීමකි. 2015 වසරේ දී විදේශීය සෘජු ආයෝජන ලැබීම් අඩු වීමට හේතු කිහිපයක් බලපා ඇත. පළමුව, වසර තුළ දී ජාතික මැතිවරණ දෙකක් පැවැත්වීම හේතුවෙන් අයෝජකයින් දේශපාලනික පරිසරය ස්ථාවර වන තුරු අපේක්ෂාවෙන් පසුවීම සෘජු ආයෝජන අඩු වීමට එක් හේතුවකි. දෙවනුව, එක්සත් ජනපදයේ ෆෙඩරල් සංචිත බැංකුව විසින් පොලී අනුපාතික ඉහළ දැමීමට ඇති හැකියාව හමුවේ නැගී එන වෙළඳපොළ ආර්ථිකයන් වෙතින් අඛණ්ඩව මූල්‍ය ප්‍රවාහ ඉවතට ඇදී යෑම සමඟ විශේෂයෙන් රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ වෙතින් ආයෝජන අඛණ්ඩව ඉවත්කර ගැනීම හේතුවෙන් ආයෝජකයින් නැගී එන වෙළඳපොළ ආර්ථිකයන් තුළ ආයෝජනය කිරීමට පසුබට විය. තෙවනුව, රජය විසින් ව්‍යාපෘතිය සමාලෝචනය කිරීමට තීරණය කිරීම හේතුවෙන් කොළඹ වරාය නගර ව්‍යාපෘතිය තාවකාලිකව නතර කිරීමත් වසර තුළ දී විදේශීය සෘජු ආයෝජන කෙරෙහි අයහපත් ලෙස බලපෑවේය. මුළු විදේශීය සෘජු ආයෝජන ලැබීම්, හිමිකම් ප්‍රාග්ධන කොටස් එ.ජ. ඩොලර් මිලියන 84 කින් ද, ප්‍රතිආයෝජනය කළ ඉපැයුම් එ.ජ. ඩොලර් මිලියන 341 කින්ද, කොටස් හිමියන්ගේ අත්තිකාරම් එ.ජ. ඩොලර් මිලියන 126 කින්ද, අන්තර් සමාගම් ණය එ.ජ. ඩොලර් මිලියන 222 කින් ද සමන්විත වූ අතර, වසර තුළ දී එ.ජ. ඩොලර් මිලියන 92 ක් වූ අන්තර් සමාගම් ණය සහ කොටස් හිමියන්ගේ අත්තිකාරම් පියවන ලදී. තවද, 2015 වසර තුළ දී අයෝජන මණ්ඩලයේ ලියාපදිංචි සමාගම් එම සමාගම්වල සම්බන්ධතාවයක් නොමැති පාර්ශ්වයන්ගෙන් එ.ජ. ඩොලර් මිලියන 480 ක විදේශීය ණය ලබා ගෙන ඇත.

**විදේශීය සෘජු ආයෝජන වැඩි වශයෙන් යොමු වී ඇත්තේ ඉඩම් සංවර්ධනය, සංචාරක සහ විදුලි සන්දේශ යන ව්‍යාපෘති සඳහාය.** ඒ අනුව, 2015 වසරේ දී ඉඩම් සංවර්ධනය, සංචාරක සේවා සහ විදුලි සන්දේශ යන ව්‍යාපෘති සඳහා යොමු වූ ආයෝජන ප්‍රමාණය මුළු විදේශීය සෘජු ආයෝජනවලින් පිළිවෙළින් සියයට 22 ක්, සියයට 19 ක් සහ සියයට 14 ක් විය. ආයෝජන සිදු කළ ආසන්නතම රට අනුව ගත් කල විදේශීය සෘජු ආයෝජන සිදු කළ ප්‍රධාන රටවල් පහ වූයේ හොංකොං රාජ්‍යය, මුරුසි දිවයින, නෙදර්ලන්තය, චීනය සහ ඉන්දියාවයි. මේ අතර, ශුද්ධ වත්කම් අත්කර ගැනීමක් වශයෙන් සැලකෙන ශ්‍රී ලාංකික සමාගම් විදේශීය රටවල සිදු කළ ආයෝජන 2014 වසරේ වාර්තා වූ එ.ජ. ඩොලර්

**5.8.අ සංඛ්‍යා සටහන**

**මූල්‍ය ගිණුම**
**(BPM6 සංස්කරණයට අනුව සම්මත ඉදිරිපත් කිරීම)**

එ.ජ.ඩොලර් මිලියන

| ශීර්ෂය | 2014 (අ) | | 2015 (ආ) | |
|---|---|---|---|---|
| | මූල්‍ය වත්කම්හි ශුද්ධ අත්කර ගැනීම් | මූල්‍ය වගකීම්හි ශුද්ධ වෙනස්වීම් | මූල්‍ය වත්කම්හි ශුද්ධ අත්කර ගැනීම් | මූල්‍ය වගකීම්හි ශුද්ධ වෙනස්වීම් |
| **මූල්‍ය ගිණුම** | **2,588** | **4,124** | **957** | **3,227** |
| **සෘජු ආයෝජන** | **67** | **894** | **53** | **681** |
| හිමිකම් සහ ආයෝජන කොටස් අරමුදල් | 67 | 469 | 53 | 426 |
| ප්‍රති ආයෝජිත ඉපැයුම් නොවන හිමිකම් | 67 | 88 | 53 | 84 |
| සෘජු ආයෝජකයන් විසින් සෘජු ආයෝජන ව්‍යාපාරයන්හි | 67 | 88 | 53 | 84 |
| ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි සමාගම් | - | 10 | - | 36 |
| ආයෝජන මණ්ඩලයෙහි ලියාපදිංචි නොවූ සමාගම් | - | -15 | - | 62 |
| අනෙකුත් සමාගම් | - | 93 | - | -13 |
| ප්‍රතිආයෝජිත ඉපැයුම් | - | 380 | - | 341 |
| ණය උපකරණ | - | 425 | - | 256 |
| සෘජු ආයෝජකයන් විසින් සෘජු ආයෝජන ව්‍යාපාරයන්හි | - | 425 | - | 256 |
| ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි සමාගම් | - | 424 | - | 110 |
| කොටස් හිමියන්ගේ අත්තිකාරම් | - | 208 | - | 126 |
| අන්තර් සමාගම් ණය | - | 224 | - | 76 |
| ණය ගෙවීම් | - | -7 | - | -92 |
| ආයෝජන මණ්ඩලයෙහි ලියාපදිංචි නොවූ සමාගම් | - | 1 | - | 145 |
| **විවිධ ආයෝජන** | **-0.2** | **2,065** | **0.02** | **689** |
| හිමිකම් සහ ආයෝජන කොටස් අරමුදල් | - | 178 | - | -58 |
| කොළඹ කොටස් වෙළඳපොළෙහි ලියාපදිංචි සමාගම් | - | 178 | - | -58 |
| ණය සුරැකුම්පත් | -0.2 | 1,887 | 0.02 | 747 |
| තැන්පතු භාරගන්නා ආයතන | -0.2 | 250 | 0.02 | - |
| දිගු කාලීන | -0.2 | 250 | 0.02 | - |
| රජය | - | 1,462 | - | 747 |
| කෙටි කාලීන (භාණ්ඩාගාර බිල්පත්) | - | -173 | - | -392 |
| දිගු කාලීන | - | 1,635 | - | 1,139 |
| භාණ්ඩාගාර බැඳුම්කර | - | 60 | - | -701 |
| ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර | - | 75 | - | 190 |
| ස්වෛරීත්ව බැඳුම්කර | - | 1,500 | - | 1,650 |
| අනෙකුත් අංශ | - | 175 | - | - |
| දිගු කාලීන | - | 175 | - | - |
| මූල්‍ය ව්‍යුත්පන්න | - | - | - | - |
| අනෙකුත් ආයෝජන | **973** | **1,165** | **553** | **1,857** |
| මුදල් සහ තැන්පතු | 276 | -292 | 143 | 1,457 |
| මහ බැංකුව | - | 1 | - | 1,098 |
| කෙටි කාලීන | - | 1 | - | -2 |
| දිගු කාලීන | - | - | - | 1,100 |
| තැන්පතු භාරගන්නා ආයතන | 276 | -293 | 143 | 359 |
| කෙටි කාලීන | 142 | -293 | 152 | 359 |
| දිගු කාලීන | 134 | - | -9 | - |
| **පිටු අංක 167 හා සම්බන්ධයි...** | | | | |
| **විශේෂිත අයිතමයන්** | | | | |
| **කොටස් වෙළඳපොළ වෙත වූ මුළු ශුද්ධ ලැබීම්** | | **163** | | **4** |
| සෘජු ආයෝජන | | -15 | | 62 |
| විවිධ ආයෝජන | | 178 | | -58 |
| **භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කර වෙත වූ ශුද්ධ ආයෝජන (ස්වෛරීත්ව බැඳුම්කර හැර)** | | **-113** | | **-1,093** |
| විදේශීය මිලදී ගැනීම් | | 1,775 | | 1,211 |
| විදේශීය විකුණුම් | | 1,889 | | 2,304 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

මිලියන 67 සමඟ සැසඳීමේ දී 2015 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 53 ක් විය. ශ්‍රී ලාංකික සමාගම් විදේශ රටවල සිදු කළ ආයෝජන මූලික වශයෙන් සමන්විත වූයේ කොළඹ කොටස් වෙළඳපොළෙහි ලියාපදිංචි සමාගම් විසින් අග්නිදිග ආසියානු රටවල, විශේෂයෙන් වැවිලි අංශයෙහි පෞද්ගලික හිමිකම් කොටස්වල සිදු කළ ආයෝජනවලිනි.

### 5.7.2 විවිධ ආයෝජන

#### හිමිකම් සහ ආයෝජන අරමුදල් කොටස්

**නැගී එන වෙළඳපොළ ආර්ථිකයන් තුළ ආයෝජනය කිරීමට විදේශීය ආයෝජකයින් තුළ වූ අකැමැත්ත 2015 වසරේ විවිධ ආයෝජන යටතේ වන හිමිකම් කොටස් වෙත වූ විදේශීය ආයෝජන අඩු වීම මගින් ද පිළිබිඹු විය.** අනේවාසිකයෙකු ශ්‍රී ලාංකික සමාගමක තනි කොටස් හිමිකරුවකු ලෙස සියයට 10 කට වඩා අඩු හිමිකම් කොටස් ප්‍රමාණයක ආයෝජන කර ඇති ආයෝජන අයත් වන විවිධ ආයෝජන යටතේ වන හිමිකම් කොටස්හි ශුද්ධ වගකීම්වල වෙනස්වීම, 2014 වසරේ වාර්තා කළ එ.ජ. ඩොලර් මිලියන 178 ක ශුද්ධ වැඩිවීම සමඟ සැසඳීමේ දී 2015 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 58 ක ශුද්ධ අඩු වීමක් වාර්තා කළේය. කොළඹ කොටස් වෙළඳපොළේ ලියාපදිංචි සමාගම් වෙත වූ විදේශීය සෘජු ආයෝජන හැර, සාම්ප්‍රදායිකව විදේශීය සෘජු ආයෝජනවලට වඩා ඉහළ විචලනයක් සහිත කොළඹ කොටස් වෙළඳපොළෙහි ලියාපදිංචි සමාගම් වෙත අනේවාසිකයින් විසින් සිදු කරන ආයෝජන හා සම්බන්ධ ද්විතීයික වෙළඳපොළ වෙතින් එ.ජ. ඩොලර් මිලියන 94 ක ශුද්ධ ගෙවීමක් වාර්තා කළ අතර, ප්‍රාථමික වෙළඳපොළ වෙත එ.ජ ඩොලර් මිලියන 36 ක ශුද්ධ ලැබීමක් වාර්තා කළේය. ඒ අනුව, හිමිකම් කොටස් වශයෙන් වූ විවිධ ආයෝජන එ.ජ. ඩොලර් මිලියන 58 ක සමස්ත ශුද්ධ ගෙවීමක් වාර්තා කළේය. මෙය, 2014 වසරේ දී කොළඹ කොටස් වෙළඳපොළෙහි ද්විතීයික වෙළඳපොළ වෙත වූ එ.ජ. ඩොලර් මිලියන 174 ක ශුද්ධ ලැබීම් හා ප්‍රාථමික වෙළඳපොළ වෙත වූ එ.ජ. ඩොලර් මිලියන 4 ක ශුද්ධ ලැබීම් සමඟ වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 178 ක ශුද්ධ ලැබීම හා සමඟ සැසඳීමේ දී ඉතා අඩු අගයකි.

#### ණය සුරැකුම්පත්

**2015 වසරේ ණය සුරැකුම්පත් යටතේ වූ ප්‍රධානතම ලැබීම වූයේ රජය විසින් නිකුත් කරන ලද එ.ජ. ඩොලර් බිලියන 2.15 ක වටිනාකමින් යුත් ස්වෛරීත්ව බැඳුම්කර දෙක තුළින් ලද ලැබීමය.** කල්පිරීමේ කාලය වසර 10 ක් වූ එ.ජ. ඩොලර් මිලියන 1,500 ක සහ එ.ජ. ඩොලර් මිලියන 650 ක වටිනාකම්වලින් යුතු වූ මෙම බැඳුම්කර දෙක පිළිවෙළින් වසරකට සියයට 6.85 ක් සහ සියයට 6.125 ක පොලී අනුපාතිකයකට නිකුත් කරන ලදී. එක්සත් ජනපදයේ ෆෙඩරල් සංචිත බැංකුව විසින් පොලී අනුපාතික ඉහළ දමනු ඇතැයි යන අපේක්ෂාව සමඟ මෙවැනි තරගකාරී පොලී අනුපාතික ආකර්ෂණය කර ගනු ලැබුවේ ගෝලීය ප්‍රාග්ධන වෙළඳපොළෙහි පොලී අනුපාතික ඉහළ යන කාලපරිච්ඡේදයක වීම විශේෂත්වයකි. කෙසේ නමුත්, 2015 වසරේ ජනවාරි මාසය තුළ දී එ.ජ. ඩොලර් මිලියන 500 ක ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර කල්පිරීම හේතුවෙන් 2015 වසරේ දී ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුත් කිරීම තුළින් වූ ලැබීම්වල ශුද්ධ බලපෑම අඩු විය. මේ අතර, 2015 වසරේ වැඩි කාලයක් තුළ එක්සත් ජනපදයේ ෆෙඩරල් සංචිත බැංකුව විසින් පොලී අනුපාතික ඉහළ දමනු ඇතැයි වූ අපේක්ෂාව හේතුවෙන් ද ඉන් පසුව, 2015 දෙසැම්බර් මාසයේ දී පොලී අනුපාතික ඉහළ දැමීම හේතුවෙන් ද වසර පුරාවට ශ්‍රී ලංකාව ඇතුළු නැගී එන වෙළඳපොළ ආර්ථිකයන් ගණනාවකින් ප්‍රාග්ධන ප්‍රවාහ නැවත ඇමෙරිකා එක්සත් ජනපදය වෙත ඇදී යෑමක් දක්නට ලැබුණි. ඒ අනුව, වසර තුළ දී භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කරවල විදේශීය ආයෝජනවල සැලකියයුතු ගෙවීම් ප්‍රමාණයක් වාර්තා වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස, ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර හැර රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ තුළ 2014 වසරේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 38 ක ශුද්ධ ගෙවීමට සාපේක්ෂව 2015 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 903 ක ශුද්ධ ගෙවීමක් වාර්තා විය. මෙය, එ.ජ. ඩොලර් මිලියන 392 ක භාණ්ඩාගාර බිල්පත් හා සම්බන්ධ ශුද්ධ ගෙවීම්, එ.ජ. ඩොලර් මිලියන 701 ක භාණ්ඩාගාර බැඳුම්කර හා සම්බන්ධ ශුද්ධ ගෙවීම්වලින් සහ එ.ජ. ඩොලර් මිලියන 190 ක ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර හා සම්බන්ධ ශුද්ධ ලැබීම්වලින් ද සමන්විත විය. මේ අතර, තැන්පතු භාරගන්නා ආයතනවලට අයත් සුරැකුම්පත් ලෙස වූ වත්කම් බොහෝ දුරට 2014 වසරේ පැවති මට්ටමේම නොවෙනස්ව පැවතුණි.

### 5.7.3 වෙනත් ආයෝජන

#### මුදල් සහ තැන්පතු

**2015 වසර තුළ දී මුදල් සහ තැන්පතු ආශ්‍රිත වගකීම්හි ශුද්ධ වෙනස්වීම් සහ මුදල් සහ තැන්පතු වත්කම්හි ශුද්ධ අත්කර ගැනීම් ඉහළ ගියේය.** 2015 වසරේ දී ඉන්දියානු සංචිත බැංකුව සමඟ එළඹි එ.ජ. ඩොලර් මිලියන 1,500 ක විදේශ විනිමය හුවමාරු ගිවිසුම සහ එහි පළමු කොටස වන එ.ජ. ඩොලර්

**5.8.ආ සංඛ්‍යා සටහන**

**මූල්‍ය ගිණුම**
**(BPM6 සංස්කරණයට අනුව සම්මත ඉදිරිපත් කිරීම)**

එ.ජ.ඩොලර් මිලියන

| ශීර්ෂය | 2014 (අ) | | 2015 (ආ) | |
|---|---|---|---|---|
| | මූල්‍ය වත්කම්හි ශුද්ධ අත්කර ගැනීම් | මූල්‍ය වගකීම්හි ශුද්ධ වෙනස්වීම් | මූල්‍ය වත්කම්හි ශුද්ධ අත්කර ගැනීම් | මූල්‍ය වගකීම්හි ශුද්ධ වෙනස්වීම් |
| අනෙකුත් ආයෝජන (පිටු අංක 165 හා සම්බන්ධයි) | | | | |
| ණය | - | 1,713 | - | 734 |
| මහ බැංකුව | - | -719 | - | -507 |
| ජා.මූ. අරමුදලෙන් ලද ණය | - | -719 | - | -507 |
| තැන්පතු භාරගන්නා ආයතන | - | 1,358 | - | 787 |
| කෙටි කාලීන | - | 1,156 | - | 657 |
| දිගු කාලීන | - | 202 | - | 131 |
| රජය | - | 646 | - | 470 |
| දිගු කාලීන | - | 646 | - | 470 |
| අනෙකුත් අංශ (ඇ) | - | 429 | - | -16 |
| දිගු කාලීන | - | 429 | - | -16 |
| වෙළඳ ණය සහ අත්තිකාරම් | 383 | -407 | 166 | -376 |
| තැන්පතු භාරගන්නා ආයතන | 8 | - | -30 | - |
| කෙටි කාලීන | 8 | - | -30 | - |
| අනෙකුත් අංශ (ඈ) | 375 | -407 | 196 | -376 |
| කෙටි කාලීන | 375 | -407 | 196 | -376 |
| අනෙකුත් ගිණුම් ලැබිය යුතු / ගෙවිය යුතු | 314 | 151 | 244 | 41 |
| මහ බැංකුව | - | 151 | - | 41 |
| කෙටි කාලීන (ඉ) | - | 151 | - | 41 |
| තැන්පතු භාරගන්නා ආයතන | 314 | - | 244 | - |
| කෙටි කාලීන | 314 | - | 244 | - |
| විශේෂ ගැනුම් හිමිකම් (වි.ගැ.හි) | - | - | - | - |
| **සංචිත වත්කම්** | **1,548** | | **350** | |
| මූල්‍ය රත්‍රන් | 9 | | -39 | |
| විශේෂ ගැනුම් හිමිකම් | -6 | | -2 | |
| ජා. මූ. අරමුදලේ සංචිත මට්ටම | - | | - | |
| අනෙකුත් සංචිත වත්කම් | 1,545 | | 391 | |
| මුදල් සහ තැන්පතු | 496 | | 116 | |
| මූල්‍ය අධිකාරියේ හිමිකම් | 462 | | 369 | |
| අනෙකුත් ආයතනයන්හි හිමිකම් | 34 | | -253 | |
| සුරැකුම්පත් | 1,049 | | 275 | |
| ණය සුරැකුම්පත් | 1,049 | | 275 | |
| දිගු කාලීන | 1,049 | | 275 | |
| **මූල්‍ය ගිණුම (ශුද්ධ)** | **-1,536** | | **-2,271** | |
| **විශේෂිත අයිතමයන්** | | | | |
| **රජයේ දිගු කාලීන ණය (ශුද්ධ)** | | **646** | | **470** |
| ලැබීම් (ණය මුදා හැරීම්) | | 1,439 | | 1,268 |
| ගෙවීම් | | 793 | | 798 |

(අ) සංශෝධිත

(ආ) තාවකාලික

(ඇ) රජය සතු වාණිජ ව්‍යවසායයන් සහ පෞද්ගලික අංශයේ සමාගම් ඇතුළත් වේ.

(ඈ) ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව සහ පෞද්ගලික අංශයේ සමාගම්වල වෙළඳ ණය ඇතුළත් වේ.

(ඉ) ආසියානු නිෂ්කාශන සංගමයේ වගකීම්වල ශුද්ධ ගනුදෙනු ඇතුළත් වේ.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

මිලියන 400 ආපසු ගෙවීමෙහි ශුද්ධ ප්‍රතිඵලයක් ලෙස මහ බැංකුවෙහි මුදල් සහ තැන්පතු ආශ්‍රිත වගකීම් එ.ජ. ඩොලර් මිලියන 1,098 ක ශුද්ධ වැඩි වීමක් වාර්තා කළේය. අනෙකුත් තැන්පතු භාර ගන්නා ආයතනයන්හි මුදල් සහ තැන්පතු 2015 වසර තුළ දී එ.ජ. ඩොලර් මිලියන 359 කින් ඉහළ ගිය අතර, එහි ප්‍රතිඵලයක් ලෙස 2015 වසර තුළ දී මුදල් සහ තැන්පතු ලෙස වූ වගකීම්වල සමස්ත ශුද්ධ වෙනස්වීම් එ.ජ. ඩොලර් මිලියන 1,457 ක් දක්වා ඉහළ ගියේය. මේ අතර, මූලික වශයෙන් තැන්පතු භාරගන්නා ආයතන විසින් විදේශීය රටවල පවත්වාගෙන යනු ලබන කෙටි කාලීන මුදල් සහ තැන්පතුවල වැඩි වීම හේතුවෙන් මුදල් සහ තැන්පතු වත්කම් අත්කර ගැනීම් ආශ්‍රිත ගනුදෙනුවල එ.ජ. ඩොලර් මිලියන 143 ක ශුද්ධ වැඩි වීමක් සිදු විය.

### විදේශීය ණය

**වසර තුළ දී රජය වෙත වූ විදේශීය ණය ලැබීම් මධ්‍යස්ථ මට්ටමක පැවති අතර, පෞද්ගලික අංශය, තැන්පතු භාරගන්නා ආයතන සහ මහ බැංකුව විසින් සිදු කරනු ලැබූ ඉහළ ණය ආපසු ගෙවීම් හේතුවෙන් 2015 වසරේ දී ශුද්ධ ණය ලැබීම්වල අඩු වීමක් සිදු විය.** ඒ අනුව, 2014 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 1,713 ක් වූ ශුද්ධ විදේශීය ණය ලැබීම් හා සැසඳීමේ දී 2015 වසරේ දී එය, එ.ජ. ඩොලර් මිලියන 734 ක් විය.

**2015 වසරේ දී රජය වෙත වූ ශුද්ධ විදේශීය ණය ලැබීම් පෙර වසරට සාපේක්ෂව පහළ මට්ටමක පැවතුණි.** ප්‍රධාන ජාතික මැතිවරණ දෙකක් පැවැත්වීම හේතුවෙන් 2015 වසරේ පළමු කාර්තු තුන තුළ දී රජයේ ව්‍යාපෘති බොහෝ ප්‍රමාණයක වැඩ කටයුතු තාවකාලිකව නතර වීම ව්‍යාපෘති ණය ලැබීම් පහළ යෑම සඳහා හේතු විය. එහි ප්‍රතිඵලයක් ලෙස, 2015 වසර තුළ දී රජයේ ව්‍යාපෘති ණය ලෙස වූ ණය ලැබීම් 2014 වසරේ දී වූ එ.ජ. ඩොලර් මිලියන 1,439 ට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 1,268 ක් විය. තවද, 2015 වසරේ දී රජයේ ණය ආපසු ගෙවීම් 2014 වසරේ දී වූ එ.ජ. ඩොලර් මිලියන 793 ට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 798 ක් දක්වා සුළු වශයෙන් වර්ධනය විය. 2015 වසරේ දී රජයේ ව්‍යාපෘති සඳහා වූ ප්‍රධාන ණය ලැබීම් තුළ ප්‍රමුඛතාගත මාර්ග සංවර්ධනය සහ ප්‍රතිසංස්කරණය (පළමු සහ දෙවන අදියර), ශ්‍රී ලංකාවේ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සහ හරිත බලශක්තිය සඳහා වන ගෝලීය ණය පහසුකම, මාතර කතරගම දුම්රිය මාර්ගය දීර්ඝ කිරීමේ ව්‍යාපෘතියෙහි මාතර බෙලිඅත්ත කොටස සහ මහ කොළඹ නාගරික ප්‍රවාහන ප්‍රවර්ධන ව්‍යාපෘතිය ඇතුළත් වේ.

**2015 වසරේ දී තැන්පතු භාරගන්නා ආයතන විසින් ලබාගත් ශුද්ධ විදේශීය ණය ප්‍රමාණය සැලකියයුතු අඩු වීමක් වාර්තා කළේය.** බලපත්‍රලාභී වාණිජ බැංකු, බලපත්‍රලාභී විශේෂිත බැංකු සහ බලපත්‍රලාභී මූල්‍ය සමාගම්වලින් සමන්විත තැන්පතු භාරගන්නා ආයතන ලබාගත් ශුද්ධ විදේශීය ණය ප්‍රමාණය 2014 වසරේ දී වාර්තා කළ එ.ජ. ඩොලර් මිලියන 1,358 සමඟ සන්සන්දනය කිරීමේ දී 2015 වසරේ එ.ජ. ඩොලර්

**5.9 සංඛ්‍යා සටහන** **2015 වසර තුළ විදේශ ණය මගින් මූල්‍යනය කරන ලද ප්‍රධාන ව්‍යාපෘතීන්**

| දායකයා සහ ව්‍යාපෘතිය | ලැබුණු ණය මුදල එ.ජ.ඩොලර් මිලියන |
|---|---|
| **රජයේ ව්‍යාපෘතීන් මුළු එකතුව** | **1,268** |
| එයින්; | |
| **චීන අපනයන - ආනයන බැංකුව** | **295** |
| එයින්; | |
| දක්ෂිණ අධිවේගී මාර්ගය දීර්ඝ කිරීමේ ව්‍යාපෘතිය - I කොටස - මාතර සිට බෙලිඅත්ත දක්වා | 67 |
| දක්ෂිණ අධිවේගී මාර්ගය දීර්ඝ කිරීමේ ව්‍යාපෘතිය - IV කොටස - මත්තල සිට හම්බන්තොට දක්වා | 36 |
| මාතර කතරගම දුම්රිය මාර්ගය දීර්ඝ කිරීමේ ව්‍යාපෘතිය - මාතර බෙලිඅත්ත කොටස | 31 |
| පින්නදූව සිට කෝදාගොඩ දක්වා අධිවේගී මාර්ග ව්‍යාපෘතිය | 18 |
| පුත්තලම - මරිච්චිකඩේ - මන්නාරම මාර්ගය ප්‍රතිසංස්කරණය | 18 |
| **ආසියානු සංවර්ධන බැංකුව** | **288** |
| එයින්; | |
| ඒකාබද්ධ මහාමාර්ග ආයෝජන වැඩසටහන | 31 |
| රජයේ සංවර්ධන අංශ ව්‍යාපෘතිය | 19 |
| පිවිතුරු බලශක්තිය සහ ප්‍රවේශය වර්ධනය කිරීමේ ව්‍යාපෘතිය | 18 |
| ජාතික අධිවේගී ව්‍යාපෘතිය | 17 |
| **චීන සංවර්ධන බැංකුව** | **193** |
| එයින්; | |
| ප්‍රමුඛතාගත මාර්ග ප්‍රතිසංස්කරණය සහ සංවර්ධන ව්‍යාපෘතිය I අදියර | 109 |
| ප්‍රමුඛතාගත මාර්ග ප්‍රතිසංස්කරණය සහ සංවර්ධන ව්‍යාපෘතිය II අදියර | 51 |
| මොරගහකන්ද සංවර්ධන ව්‍යාපෘතිය | 24 |
| **ජපානය** | **168** |
| එයින්; | |
| මහ කොළඹ ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතිය - II අදියර | 57 |
| මහ කොළඹ ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතිය | 20 |
| ජල සංවර්ධන ව්‍යාපෘතිය | 19 |
| **ජාත්‍යන්තර සංවර්ධන සංගමය** | **118** |
| එයින්; | |
| ද්වීතියික සෞඛ්‍ය අංශය ප්‍රවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය | 39 |
| 'දැනුම් කේන්ද්‍රස්ථාන' ව්‍යාපෘතියට පදනමක් ලෙස පාසල් අධ්‍යාපන ක්‍රමය සැකසීමේ ව්‍යාපෘතිය | 18 |
| **යුරෝපිය ආයෝජන බැංකුව** | **81** |
| ශ්‍රී ලංකාවේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සහ හරිත බල ශක්ති සංවර්ධනය කිරීමේ ගෝලීය ණය පහසුකම | 81 |
| **ඉන්දියාව** | **73** |
| එයින්; | |
| උතුරු පළාත් දුම්රිය සේවාව ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය | 28 |
| වැඩි දියුණු කරන ලද පෙට්‍රල් තොග 2 ක් ප්‍රසම්පාදනය කිරීම | 27 |
| **නෙදර්ලන්ත රබෝ බැංකුව (Rabobank)** | **73** |
| එයින්; | |
| ග්‍රාමීය පාලම් 463 ක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය | 20 |
| **ඩොයිෂ් බැංකුව (Deutsche Bank AG)** | **37** |
| වානේ පාලම් 537 ක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය | 37 |
| **හොංකොං ෂැන්හයි බැංකුව (HSBC) (EKF ඩෙන්මාර්කය සමඟ ඇප ආවරණයක් සහිත)** | **25** |
| බඩල්ගම කිරි සැකසුම් මධ්‍යස්ථානයක් පිහිටුවීමේ ව්‍යාපෘතිය | 25 |
| **ප්‍රතිසංස්කරණය සහ සංවර්ධනය කිරීමේ ජාත්‍යන්තර බැංකුව** | **19** |
| කොළඹ නගරය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය | 19 |
| **රජය සතු වාණිජ ව්‍යවසායයන්වල මුළු එකතුව** | **80** |
| පුත්තලම ගල් අඟුරු බලාගාර ව්‍යාපෘතිය - II අදියර | 67 |
| හම්බන්තොට වරාය සංවර්ධන ව්‍යාපෘතිය - I අදියර - උපකරණ සැපයීම සහ අනෙකුත් වැඩ සඳහා වූ ව්‍යාපෘතිය | 9 |
| පුත්තලම ගල් අඟුරු බලාගාර ව්‍යාපෘතිය - ගැනුම්කරුගේ ණය පහසුකම | 5 |

මූලය: ජාතික ප්‍රතිපත්ති සහ ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව

මිලියන 787 ක් විය. මෙම මුළු ශුද්ධ ණය ලැබීම්වලින් එ.ජ. ඩොලර් මිලියන 657 ක් කෙටි කාලීන ශුද්ධ ලැබීම්වලින් ද, එ.ජ. ඩොලර් මිලියන 131 ක් දිගු කාලීන ශුද්ධ ලැබීම්වලින් ද සමන්විත විය.

**ශ්‍රී ලංකා මහ බැංකුව ජා.මූ. අරමුදලේ සමීපස්ථ ණය පහසුකමෙහි ණය ආපසු ගෙවීම් 2015 වසරේ දී ද අඛණ්ඩව සිදු කළේය.** ඒ අනුව, ජා.මූ. අරමුදලෙහි සමීපස්ථ ණය පහසුකමට අදාළව 2009 සිට 2012 වසර දක්වා මුදාහරින ලද ණය සඳහා 2015 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 507 ක මුදලක් ණය වාරික වශයෙන් ගෙවන ලදී. මෙම පහසුකම යටතේ ලබාගත් මුළු ණය ප්‍රමාණය 2017 වසරේ ජූලි මස වනවිට සම්පූර්ණයෙන්ම ගෙවා නිමකිරීමට නියමිතය.

**2015 වසරේ දී වූ ණය ලැබීම්වලට සාපේක්ෂව ණය ගෙවීම් ඉහළ යෑම හේතුවෙන් පෞද්ගලික අංශය සහ රජය සතු වාණිජ ව්‍යවසායයන් වෙත වූ විදේශීය ණය සුළු ශුද්ධ ගෙවීම් ප්‍රමාණයක් වාර්තා කළේය.** වසර තුළ දී මෙම අංශ දෙක ලබාගත් ණය ප්‍රමාණය එ.ජ. ඩොලර් මිලියන 561 ක් ද මුළු ණය ගෙවීම් එ.ජ. ඩොලර් මිලියන 577 ක් ද වූ අතර, ඒ අනුව මෙම අංශ දෙකෙහි එ.ජ. ඩොලර් මිලියන 16 ක ශුද්ධ ණය ගෙවීමක් වාර්තා විය. 2015 වසරේ දී රජය සහ තැන්පතු භාරගන්නා ආයතන ලබාගත් විදේශීය ණය ප්‍රමාණය අඩු මට්ටමක පැවති ලෙසටම පෞද්ගලික අංශය ද ඉතා සීමිත විදේශීය ණය ප්‍රමාණයක් පමණක් ලබාගත්තේය. මෙම අංශ ලබාගත් මුළු විදේශීය ණය ප්‍රමාණයෙන් එ.ජ. ඩොලර් මිලියන 481 ක් පෞද්ගලික අංශය ලබාගත් ණය වූ අතර ඉතිරි ප්‍රමාණය වන එ.ජ. ඩොලර් මිලියන 80 ක් රජය සතු වාණිජ ව්‍යවසායයන් විසින් ලබාගන්නා ලදී. පෞද්ගලික අංශය ලබාගත් ණය මූලික වශයෙන් සංචාරක, විදුලි සන්දේශ සහ වරාය සංවර්ධන යන අංශවලට යොමු විය. ගෝලීය පොලී අනුපාතික අඩු මට්ටමක පැවතීම හේතුවෙන් පෞද්ගලික අංශය ලබාගත් විදේශීය ණය පසුගිය වසර කිහිපය තුළ දී ඉහළ මට්ටමක පැවතියේය. කෙසේ නමුත්, එක්සත් ජනපදයේ පොලී අනුපාතික ඉහළ යෑම ආරම්භ වීමත් සමඟ ගෝලීය පොලී අනුපාතික ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරෙන අතර, මේ හේතුවෙන් පෞද්ගලික අංශය සහ තැන්පතු භාරගන්නා ආයතන ගනු ලබන විදේශීය ණය ප්‍රමාණය පහළ යෑමේ ප්‍රවණතාවයක් ඇති විය හැකිය.

### වෙළඳ ණය හා අත්තිකාරම් සහ අනෙකුත් ලැබිය යුතු/ගෙවිය යුතු ගිණුම්

**2015 වසරේ දී ලබාගත් වෙළඳ ණය සහ අත්තිකාරම් අඩු වූ අතර, ලබාදුන් වෙළඳ ණය සහ අත්තිකාරම් වැඩි විය.** ප්‍රධාන වශයෙන් ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව විසින් ලබාගත් වෙළඳ ණයවලින් සමන්විත

වෙළඳ ණය ලැබීම් 2015 වසරේ දී පහළ ගිය අතර, එහි ප්‍රතිඵලයක් ලෙස වෙළඳ ණය වගකීම්වල ශුද්ධ වෙනස්වීම් 2014 වසරේ දී වාර්තා කළ එ.ජ. ඩොලර් මිලියන 407 ක අඩු වීම සමඟ සැසඳීමේ දී 2015 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 376 ක අඩු වීමක් වාර්තා කළේය. 2014 වසරේ සිට ඉරානයෙන් බොරතෙල් ආනයනය කිරීමට එරෙහිව පැනවූ සම්බාධක හේතුවෙන් ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව මූලිකවම කෙටි කාලීන වෙළඳ ණය මත පදනම්ව බොරතෙල් මිලදී ගත් අතර, මේ හේතුවෙන්, 2014 වසරේ දී මෙන්ම 2015 වසරේ දී ද නොපියවා ඉතිරිව ඇති වෙළඳ ණය ශේෂය ක්‍රමානුකූලව අඩු විය. මේ අතර, ශ්‍රී ලාංකික අපනයනකරුවන් තම විදේශීය වෙළඳ හවුල්කරුවන් වෙත ලබාදුන් වෙළඳ ණයවලින් සමන්විත වෙළඳ ණය සහ අත්තිකාරම්වල ශුද්ධ වත්කම් අත්කර ගැනීම 2014 වසරේ දී වාර්තා කළ එ.ජ. ඩොලර් මිලියන 375 ක වැඩිවීම සමඟ සැසඳීමේ දී 2015 වසරේ දී එ.ජ ඩොලර් මිලියන 196 ක වැඩි වීමක් වාර්තා කළේය. තවද, තැන්පතු භාරගන්නා ආයතන විසින් ලබාදුන් වෙළඳ ණය 2015 වසරේ දී එ.ජ ඩොලර් මිලියන 30 ක ශුද්ධ අඩු වීමක් වාර්තා කළේය.


### 5.7.4 විදේශීය සංචිත වත්කම්

**2015 වසර තුළ දී විදේශීය සංචිත වත්කම් හා සම්බන්ධ ගනුදෙනු අඩු වීමට වසර තුළ දී පැවති විදේශීය සංචිත වත්කම් තත්වය අඩු වීම මූලිකවම හේතු විය.** මූල්‍ය ගිණුම වෙත වූ ලැබීම් අඩු මට්ටමක පැවතීම ජංගම ගිණුමේ හිඟය පියවීමට ප්‍රමාණවත් නොවූ අතර, මෙය 2015 වසරේ දී සමස්ත විදේශීය සංචිත වත්කම් අඩු වීමට හේතු විය. එහි ප්‍රතිඵලයක් ලෙස, විදේශීය සංචිත වත්කම් හා සම්බන්ධ ශුද්ධ ගනුදෙනු 2014 වසරේ දී වාර්තා කළ එ.ජ. ඩොලර් මිලියන 1,548 ක වැඩි වීමට සාපේක්ෂව 2015 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 350 ක සුළු වැඩි වීමක් පමණක් වාර්තා කළේය. 2015 වසරේ දී මූල්‍ය රත්‍රන් ගනුදෙනු එ.ජ. ඩොලර් මිලියන 39 කින් අඩු වීම, මුදල් හා තැන්පතු එ.ජ. ඩොලර් මිලියන 116 කින් වැඩි වීම සහ ණය සුරැකුම්පත් එ.ජ. ඩොලර් මිලියන 275 කින් වැඩි වීම විදේශීය සංචිත වත්කම් ගනුදෙනු තුළ අන්තර්ගත විය.

## 5.8 ගෙවුම් තුලනය

**ශුද්ධ විදේශීය සංචිතවල වෙනස වන ගෙවුම් තුලනයේ සමස්ත ශේෂය 2015 වසරේ දී හිඟයක් වාර්තා කළේය.** ගෙවුම් තුලනයෙහි 2014 වසරේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 1,369 ක අතිරික්තය

**5.10 රූප සටහන** ගෙවුම් තුලනය




සමඟ සැසඳීමේ දී 2015 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 1,489 ක සමස්ත හිඟයක් වාර්තා වූ අතර, ඒ සඳහා ජංගම ගිණුමේ හිඟය පුළුල් වීම සහ මූල්‍ය ගිණුම වෙත වූ ලැබීම් සාපේක්ෂව අඩු වීම හේතු විය.

## 5.9 අන්තර්ජාතික ආයෝජන තත්ත්වය

**2015 වසර අවසානයේ දී ශ්‍රී ලංකාවේ විදේශීය වගකීම් තත්ත්වය සුළු වශයෙන් ඉහළ ගිය අතර, මූල්‍ය ගිණුම වෙත වූ සීමිත ලැබීම් හේතුවෙන් විදේශීය වත්කම් තත්ත්වය අඩු විය.** 2015 වසර අග වනවිට, සංචිත වත්කම්වල සිදු වූ කැපී පෙනෙන අඩු වීමෙහි ප්‍රතිඵලයක් ලෙස මුළු විදේශීය වත්කම් තත්ත්වය 2014 වසර අවසානයේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 11,186 ට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 10,887 ක් දක්වා අඩු විය. 2015 වසර අග වනවිට මුළු මූල්‍ය වත්කම් තත්ත්වයෙන්, සංචිත වත්කම් තත්ත්වය සියයට 67 ක් විය. මේ අතර, 2015 වසර අග වනවිට සෘජු ආයෝජන වත්කම් තත්ත්වය සහ අනෙකුත් ලැබිය යුතු ගිණුම් තත්ත්වය වසර ආරම්භයට සාපේක්ෂව වර්ධනය විය. නොපියවා ඉතිරිව ඇති මුළු වගකීම් තත්ත්වයෙහි වාර්තා වූ මධ්‍යස්ථ වර්ධනය හේතුවෙන් 2015 වසර අග වනවිට නොපියවා ඉතිරිව ඇති වගකීම් තත්ත්වය 2014 වසර අග වනවිට පැවති එ.ජ. ඩොලර් මිලියන 52,811 ට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 53,586 ක් විය. අන්තර්ජාතික ආයෝජන තත්ත්වයෙහි ප්‍රධාන සංරචක තුන අතුරින් විවිධ ආයෝජන වගකීම් තත්ත්වයෙහි මෙන්ම සෘජු ආයෝජන වගකීම් තත්ත්වයෙහි අඩු වීමක් වාර්තා වූ අතර, විදේශීය ණය වගකීම් තත්ත්වයෙහි සුළු වැඩි වීමක් පමණක් වාර්තා විය. මූල්‍ය වත්කම් අඩු වීමෙහි සහ වගකීම් තත්ත්වය ඉහළ යැමෙහි සමස්ත ප්‍රතිඵලයක් ලෙස 2015 වසර අග වනවිට ශුද්ධ අන්තර්ජාතික ආයෝජන තත්ත්වය, 2014 වසර

අවසානයේ දී පැවති එ.ජ. ඩොලර් මිලියන 41,625 ක නොපියවූ ශුද්ධ වගකීම් තත්ත්වයේ සිට එ.ජ. ඩොලර් මිලියන 42,699 ක නොපියවූ ශුද්ධ වගකීම් තත්ත්වයක් දක්වා වැඩි විය.

### 5.9.1 සෘජු ආයෝජන තත්ත්වය

**වෙළඳපොළ වටිනාකමෙහි සිදු වූ කැපීපෙනෙන අඩු වීම හේතුවෙන් 2015 වසර අවසානයේ දී සෘජු ආයෝජන වගකීම් තත්ත්වය පහළ ගිය අතර, සෘජු ආයෝජන වත්කම් තත්ත්වයෙහි සුළු වැඩි වීමක් වාර්තා විය.** 2015 වසර තුළ දී සෘජු ආයෝජන ගනුදෙනුවල ශුද්ධ ලැබීමක් වාර්තා වීම හමුවේ වුවද, 2015 වසර අග වන විට සෘජු ආයෝජන වගකීම් තත්ත්වය 2014 වසර අගදී වූ එ.ජ. ඩොලර් මිලියන 10,572 ට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 9,972 දක්වා අඩු විය. විනිමය අනුපාතිකයේ වෙනස්වීම් මගින් ඇති වූ තක්සේරු අලාභවලට අමතරව කොටස් වෙළඳපොළේ ලැයිස්තුගත සමාගම්වල සෘජු ආයෝජකයින් සතු ඡන්ද බලය හිමි කොටස්වල වෙළඳපොළ මිල අඩු වීම ද මේ සඳහා මූලික වශයෙන් හේතු විය. කොළඹ කොටස් වෙළඳපොළෙහි ලැයිස්තුගත ප්‍රධාන සමාගම් 10 ක වෙළඳපොළ මිල අඩු වීම, හිමිකම් තත්ත්වයෙහි සිදු වූ එ.ජ. ඩොලර් බිලියන 1.2 ක මුළු තක්සේරු අලාභයෙන් සියයට 70 ට වඩා වැඩි ප්‍රමාණයකට දායක විය. තවද, ස්වභාවික සම්පත් ගවේෂණ අංශයෙහි ප්‍රධාන සමාගම විසින් ලබාගත් ණය කපාහැරීම ගෙවුම් තුලනය සම්බන්ධ ගනුදෙනුවක් වශයෙන් වාර්තා නොවුව ද, අන්තර්ජාතික ආයෝජන තත්ත්වයෙහි අනෙකුත් වෙනස්වීම් යටතේ වාර්තා කර ඇති අතර, එය 2015 වසරේ දී සෘජු ආයෝජන අන්තර් සමාගම් ණය තත්ත්වය අඩු වීම සඳහා දායක විය. මුළු සෘජු ආයෝජන වගකීම් තත්ත්වයෙන් සියයට 42 ක් කොළඹ කොටස් වෙළඳපොළ ලැයිස්තුගත සමාගම් සතුව ද, සියයට 53 ක් කොළඹ කොටස් වෙළඳපොළෙහි ලැයිස්තුගත සහ ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි සමාගම් සතුව ද, සියයට 5 ක් කොටස් වෙළඳපොළෙහි ලැයිස්තුගත නොවූ සහ ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි නොවූ පෞද්ගලික සමාගම් සතුව ද පැවතුණි.

**ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සෘජු ආයෝජන පිළිබඳ ඒකාබද්ධ සමීක්ෂණය (CDIS) සඳහා දායක වීමත් සමඟ වර්තමානයේ දී ශ්‍රී ලංකාව, සෘජු ආයෝජන වගකීම් තත්ත්වය රටවල් අනුව වාර්තා කරයි.** ඒ අනුව, 2015 වසර අවසානයේ දී පැවති සෘජු ආයෝජන තත්ත්වය අනුව ප්‍රධාන මූලාශ්‍ර පහ වූයේ එක්සත් රාජධානිය, නෙදර්ලන්තය, ඉන්දියාව, මැලේසියාව සහ චීනයයි. තවද, අනේවාසිකයින් විසින් කොළඹ කොටස් වෙළඳපොළෙහි සිදු කර තිබූ

**5.10 සංඛ්‍යා සටහන**

**අන්තර්ජාතික ආයෝජන තත්ත්වය**
**(BPM6 සංස්කරණයට අනුව සම්මත ඉදිරිපත් කිරීම)**

එ.ජ.ඩොලර් මිලියන
*(කාලපරිච්ඡේදය අවසානයේදී තත්ත්වය)*

| ශීර්ෂය | 2014 (අ) | | 2015 (ආ) | |
|---|---|---|---|---|
| | වත්කම් | වගකීම් | වත්කම් | වගකීම් |
| **සෘජු ආයෝජන (ඇ)** | **607** | **10,572** | **660** | **9,972** |
| හිමිකම් සහ ආයෝජන අරමුදල් කොටස් | 604 | 8,028 | 657 | 7,253 |
| ණය උපකරණ | 3 | 2,544 | 3 | 2,719 |
| **විවිධ ආයෝජන** | **0.1** | **12,664** | **0.1** | **12,375** |
| හිමිකම් සහ ආයෝජන අරමුදල් කොටස් | - | 1,869 | - | 1,536 |
| අනෙකුත් අංශ | - | 1,869 | - | 1,536 |
| ණය සුරැකුම්පත් (ඈ) | 0.1 | 10,795 | 0.1 | 10,839 |
| තැන්පතු භාරගන්නා ආයතන | 0.1 | 2,263 | 0.1 | 2,140 |
| දිගු කාලීන | 0.1 | 2,263 | 0.1 | 2,140 |
| රජය | - | 8,358 | - | 8,534 |
| කෙටි කාලීන | - | 399 | - | 33 |
| දිගු කාලීන | - | 7,959 | - | 8,501 |
| අනෙකුත් අංශ | - | 174 | - | 164 |
| දිගු කාලීන | - | 174 | - | 164 |
| **මූල්‍ය ව්‍යුත්පන්න** | **-** | **-** | **-** | **-** |
| **අනෙකුත් ආයෝජන** | **2,370** | **29,575** | **2,923** | **31,240** |
| **මුදල් සහ තැන්පතු** | **558** | **1,594** | **701** | **3,051** |
| මහ බැංකුව | - | 6 | - | 1,105 |
| කෙටි කාලීන | - | 6 | - | 5 |
| දිගු කාලීන | - | - | - | 1,100 |
| තැන්පතු භාරගන්නා ආයතන | 558 | 1,587 | 701 | 1,946 |
| කෙටි කාලීන | 388 | 1,587 | 539 | 1,946 |
| දිගු කාලීන | 171 | - | 162 | - |
| **ණය** | **-** | **25,297** | **-** | **25,864** |
| මහ බැංකුව | - | 1,248 | - | 692 |
| ජා.මූ. අරමුදලෙන් ලද ණය | - | 1,248 | - | 692 |
| තැන්පතු භාරගන්නා ආයතන | - | 4,282 | - | 5,070 |
| කෙටි කාලීන | - | 3,159 | - | 3,816 |
| දිගු කාලීන | - | 1,123 | - | 1,253 |
| රජය | - | 15,774 | - | 16,147 |
| දිගු කාලීන | - | 15,774 | - | 16,147 |
| අනෙකුත් අංශ (ඉ) | - | 3,993 | - | 3,956 |
| දිගු කාලීන | - | 3,993 | - | 3,956 |
| **වෙළඳ ණය සහ අත්තිකාරම්** | **820** | **1,674** | **986** | **1,299** |
| තැන්පතු භාරගන්නා ආයතන | 126 | - | 96 | - |
| කෙටි කාලීන | 126 | - | 96 | - |
| අනෙකුත් අංශ (ඊ) | 694 | 1,674 | 890 | 1,299 |
| කෙටි කාලීන | 694 | 1,674 | 890 | 1,299 |
| **අනෙකුත් ගිණුම් ලැබිය යුතු/ගෙවිය යුතු** | **992** | **437** | **1,236** | **478** |
| මහ බැංකුව (උ) | - | 437 | - | 478 |
| කෙටි කාලීන | - | 437 | - | 478 |
| තැන්පතු භාරගන්නා ආයතන | 992 | - | 1,236 | - |
| කෙටි කාලීන | 992 | - | 1,236 | - |
| **විශේෂ ගැනුම් හිමිකම් (වි.ගැ.හි)** | **-** | **573** | **-** | **548** |
| **සංචිත වත්කම්** | **8,208** | **-** | **7,304** | **-** |
| මූල්‍ය රත්‍රන් | 893 | - | 760 | - |
| විශේෂ ගැනුම් හිමිකම් | 9 | - | 7 | - |
| ජා.මූ.අරමුදලේ සංචිත මට්ටම | 69 | - | 66 | - |
| අනෙකුත් සංචිත වත්කම් | 7,237 | - | 6,470 | - |
| මුදල් සහ තැන්පතු | 3,795 | - | 3,911 | - |
| මූල්‍ය අධිකාරියේ හිමිකම් | 1,798 | - | 2,167 | - |
| අනෙකුත් ආයතනයන්හි හිමිකම් | 1,997 | - | 1,745 | - |
| සුරැකුම්පත් | 3,442 | - | 2,559 | - |
| ණය සුරැකුම්පත් | 3,442 | - | 2,559 | - |
| **මුළු වත්කම්/වගකීම්** | **11,186** | **52,811** | **10,887** | **53,586** |
| **ශුද්ධ ජාත්‍යන්තර ආයෝජන තත්ත්වය** | **-** | **-41,625** | **-** | **-42,699** |
| **විශේෂිත අයිතමයන්** | | | | |
| පරිණත කාලය අනුව ජාත්‍යන්තර ආයෝජන තත්ත්වය | 11,186 | 52,811 | 10,887 | 53,586 |
| කෙටි කාලීන | 6,957 | 9,132 | 7,499 | 9,113 |
| දිගු කාලීන | 4,229 | 43,679 | 3,388 | 44,473 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) ආයෝජන මණ්ඩලයේ, කොළඹ කොටස් හුවමාරුවේ සහ අනෙකුත් පෞද්ගලික සමාගම්වල පැවති සෘජු ආයෝජනද ඇතුළත් වේ.
(ඈ) විදේශ විනිමය ණය එකතුව වෙළඳපොළ වටිනාකම මත පදනම් වන අතර දේශීය විනිමය ණය නිකුතුව පොත් අගය මත පදනම් වේ.
(ඉ) රජය සතු වාණිජ ව්‍යවසායයන් ලබාගත් ව්‍යාපෘති ණය සම්බන්ධයෙන් වූ නොපියවා ඉතිරිව ඇති ණය ඇතුළත් වේ.
(ඊ) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සහ පෞද්ගලික සමාගම්වල නොපියවූ වෙළඳ ණය ඇතුළත් වේ.
(උ) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කළමනාකරණය කරනු ලබන ආසියානු නිෂ්කාශන සංගමයේ වගකීම්වල නොපියවා ඉතිරිව ඇති තත්ත්වය

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

එ.ජ. ඩොලර් මිලියන 5,675 ක නොපියවා ඉතිරිව ඇති මුළු විදේශීය ආයෝජන අතරින් සියයට 73 ක් සෘජු ආයෝජකයින් විසින් නොපියවා ඉතිරිව ඇති ප්‍රමාණය වූ අතර, සියයට 27 ක් තනි ව්‍යාපාරවල සියයට 10 ට අඩු කොටස් හිමිකමක් සහිත විවිධ ආයෝජකයින්ගේ හිමිකම්වල නොපියවා ඉතිරිව ඇති ආයෝජනවලින් සමන්විත විය. කොළඹ කොටස් වෙළඳපොළෙහි නොපියවා ඉතිරිව ඇති මුළු විදේශීය ආයෝජනයන්ගෙන් වැඩි ප්‍රමාණයක් සෘජු ආයෝජකයින්ගේ නොපියවා ඉතිරිව ඇති ආයෝජනවලින් සමන්විත වීම තුළින් කොළඹ කොටස් වෙළඳපොළෙහි විදේශීය ආයෝජනවල සාපේක්ෂ ස්ථායීතාව පෙන්නුම් කෙරෙයි. විවිධ ආයෝජන ඉහළ උච්චාවචනයක් පෙන්නුම් කරනු ඇතැයි අපේක්ෂා කෙරෙන නමුත් සෘජු ආයෝජන වඩා දිගු කාලීන අරමුණු සහිත වේ යැයි අපේක්ෂා කෙරෙයි. මේ අතර, විශේෂයෙන් අග්නිදිග ආසියානු කලාපයේ කොටස් වෙළඳපොළවල ලියාපදිංචි නොකළ සමාගම්වල ආයෝජන කරනු ලැබූ ශ්‍රී ලාංකික ආයෝජන අරමුදල් ප්‍රමාණය සමඟ විදේශයන්හි සිදු කළ ආයෝජන තත්ත්වයෙහි ඉහළ යෑමක් වාර්තා විය.

### 5.9.2 විවිධ ආයෝජන තත්ත්වය

**2015 වසරේ දී හිමිකම් වශයෙන් ඇති විවිධ ආයෝජනවල තත්ත්වය පහළ ගිය අතර, නොපියවා ඉතිරිව ඇති ණය සුරැකුම්පත් වශයෙන් ඇති විවිධ ආයෝජන තත්ත්වය සුළු වශයෙන් වර්ධනය විය.** ශ්‍රී ලාංකික සමාගමක කොටස් වටිනාකමින් සියයට 10 කට වඩා අඩු විදේශීය ආයෝජනවලින් සමන්විත හිමිකම් සහ ආයෝජන අරමුදල් කොටස් වගකීම් තත්ත්වය 2014 වසර අවසානයේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 1,869 සිට 2015 වසර අවසානයේ දී එ.ජ. ඩොලර් මිලියන 1,536 ක් දක්වා අඩු වූ අතර, 2015 වසරේ දී ලැයිස්තුගත සමාගම්හි කොටස්වල වෙළඳපොළ මිල ගණන් මෙන්ම විදේශ විනිමය අනුපාතිකයෙහි සිදු වූ වෙනස්කම් හේතුවෙන් ඇති වූ සැලකියයුතු තක්සේරු අලාභ එයට ප්‍රධාන වශයෙන් හේතු විය. අනේවාසිකයින් සතු නොපියවා ඉතිරිව ඇති ණය සුරැකුම්පත් ප්‍රමාණය 2014 වසර අවසානය වනවිට එ.ජ. ඩොලර් මිලියන 10,795 සිට 2015 වසර අවසානය වනවිට එ.ජ. ඩොලර් මිලියන 10,839 දක්වා සුළු වශයෙන් වැඩි වීමක් වාර්තා කළේය. භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර ශුද්ධ ගෙවීම් සහ එ.ජ. ඩොලර් මිලියන 500 ක ස්වෛරීත්ව බැඳුම්කර කල්පිරීම වෙනුවෙන් සිදු කළ ගෙවීම මගින් වසර තුළ දී රජය විසින් නව ණය සුරැකුම්පත් නිකුත් කිරීමෙන් ඇති වූ බලපෑම අවම කිරීම මේ සඳහා මූලිකවම හේතු විය. නව ස්වෛරීත්ව බැඳුම්කර දෙකක් නිකුත් කිරීම තුළින් ලද එ.ජ. ඩොලර් මිලියන 2,150 ක ලැබීම් සහ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර නිකුත් කිරීම තුළින් ලද ශුද්ධ ලැබීම් වසර තුළ දී මෙම අංශයෙහි ශුද්ධ ලැබීමක් වාර්තා වීමට මූලිකවම හේතු විය. 2015 වසර තුළ දී භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කරවල විදේශීය ආයෝජනයන්හි සැලකියයුතු ශුද්ධ ගෙවීම් ප්‍රමාණයක් වාර්තා වීමත් සමඟ නොපියවා ඉතිරිව ඇති භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර ප්‍රමාණය 2014 වසර අවසානයේ දී පැවති එ.ජ. ඩොලර් මිලියන 2,996 සිට එ.ජ. ඩොලර් මිලියන 1,844 ක් දක්වා අඩු විය. තවද, නොපියවා ඉතිරිව ඇති ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවල වෙළඳපොළ වටිනාකම 2014 වසර අවසානයේ දී වාර්තා කළ එ.ජ. ඩොලර් මිලියන 5,287 සිට 2015 වසර අවසානයේ දී එ.ජ. ඩොලර් මිලියන 6,425 ක් දක්වා ඉහළ ගියේය. මේ අතර, අනේවාසිකයින් සතු නොපියවා ඉතිරිව ඇති ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවල ප්‍රමාණය 2015 වසර අවසානය වන විට එ.ජ. ඩොලර් මිලියන 265 ක් විය.

### 5.9.3 අනෙකුත් ආයෝජන තත්ත්වය

#### මුදල් සහ තැන්පතු

**2015 වසරේ දී මුදල් සහ තැන්පතු වත්කම් සහ වගකීම් තත්ත්වය ඉහළ ගියේය.** ශ්‍රී ලංකා මහ බැංකුවේ සහ තැන්පතු භාරගන්නා ආයතනවල මුදල් සහ තැන්පතු වගකීම් තත්ත්වය 2014 වසර අවසානයේ දී වූ එ.ජ. ඩොලර් මිලියන 1,594 සිට 2015 වසර අවසානයේ දී එ.ජ. ඩොලර් මිලියන 3,051 දක්වා ඉහළ ගියේය. ශ්‍රී ලංකා මහ බැංකුව සහ ඉන්දියානු සංචිත බැංකුව අතර ඇති කරගත් ජාත්‍යන්තර විදේශීය විනිමය හුවමාරු ගිවිසුම් පහසුකම තුළින් ලබාගත් එ.ජ. ඩොලර් මිලියන 1,500 ශ්‍රී ලංකා මහ බැංකුවෙහි මුදල් සහ තැන්පතු මෙසේ ඉහළ යෑමට හේතු වූ අතර, එයින් එ.ජ. ඩොලර් මිලියන 400 ක් 2015 වසරේ දී පියවන ලදී. මෙහි ප්‍රතිඵලයක් ලෙස, 2015 වසර අවසාන වන විට ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් සහ තැන්පතු වගකීම් තත්ත්වය එ.ජ. ඩොලර් මිලියන 1,105 ක් දක්වා ඉහළ ගියේය. මේ අතර, තැන්පතු භාරගන්නා ආයතනවල වත්කම් ප්‍රමාණය ආවරණය කෙරෙන මුදල් සහ තැන්පතු වත්කම් තත්ත්වය 2015 වසරේ දී සුළු වශයෙන් ඉහළ ගියේය.

#### විදේශීය ණය

**2015 වසර අවසානය වනවිට රජය සහ තැන්පතු භාරගන්නා ආයතනවල නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය ප්‍රමාණය ඉහළ ගිය අතර, ශ්‍රී ලංකා මහ බැංකුව, පෞද්ගලික අංශයේ ආයතන සහ රජය සතු වාණිජ ව්‍යවසායයන්වල නොපියවා ඉතිරිව ඇති ණය වගකීම් තත්ත්වය පහළ ගියේය.** මුළු විදේශීය ණය ප්‍රමාණයෙන් සියයට 30 ක් පමණ වන නොපියවා ඉතිරිව ඇති රජයේ විදේශීය ණය ප්‍රමාණය 2014 වසර අවසානය

වනවිට පැවති එ.ජ. ඩොලර් මිලියන 15,774 සිට 2015 වසර අවසානය වනවිට එ.ජ. ඩොලර් මිලියන 16,147 ක් දක්වා සුළු ඉහළ යෑමක් වාර්තා කළේය. ණය ලැබීම් ප්‍රමාණය පහළ යෑම මෙන්ම රුපියල් අගයෙන් පැවති විදේශීය ණය තත්ත්වය එ.ජ. ඩොලර්වලින් ප්‍රකාශ කිරීමේ දී විනිමය අනුපාතික තක්සේරු අලාභ මත අඩු අගයක් ගැනීම මේ සඳහා මූලිකවම හේතු විය. තැන්පතු භාරගන්නා ආයතනවල ණය වගකීම් වැඩි වූ අතර, වසර තුළ දී පෞද්ගලික අංශය වෙත වූ ණය ලැබීම් සමඟ සැසඳීමේ දී වඩා වැඩි ගෙවීම් ප්‍රමාණයක් වාර්තා වීම හේතුවෙන් පෞද්ගලික අංශයේ නොපියවා ඉතිරිව ඇති ණය වගකීම් තත්ත්වය අඩු විය. මේ අතර, ශ්‍රී ලංකා මහ බැංකුව ජා.මූ. අරමුදලේ සමීපස්ථ ණය පහසුකම හා අදාළ ණය වාරික අඛණ්ඩව ආපසු ගෙවූ අතර, වසර තුළ දී රජය සතු වාණිජ ව්‍යවසායයන් ද ණය ලබාගැනීම්වලට වඩා ඉහළ ණය ගෙවීම් ප්‍රමාණයක් වාර්තා කළේය.

### වෙළඳ ණය සහ අත්තිකාරම්

**2015 වසර තුළ දී ලබාගත් වෙළඳ ණය සහ අත්තිකාරම්වල නොපියවා ඉතිරිව ඇති වගකීම් තත්ත්වය අඩු වූ අතර, ලබාදුන් වෙළඳ ණය සහ අත්තිකාරම්වල වත්කම් තත්ත්වය ඉහළ ගියේය.** වෙළඳ ණය සහ අත්තිකාරම්වල නොපියවා ඉතිරිව ඇති වගකීම් තත්ත්වය 2014 වසර අවසානය වන විට වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 1,674 සිට 2015 වසර අවසානය වන විට එ.ජ. ඩොලර් මිලියන 1,299 දක්වා අඩු වූ අතර, ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව විසින් නොපියවා ඉතිරිව ඇති ඉන්ධන බිල්පත් ගෙවීම් ඉහළ යෑම ඒ සඳහා මූලික විය. වසර තුළ දී විවිධ අවස්ථාවල අඩු වැඩි වීම් වාර්තා කළ වෙළඳ ණය සහ අත්තිකාරම්වල වත්කම් තත්ත්වය 2014 වසර අවසානය වනවිට වාර්තා කළ එ.ජ. ඩොලර් මිලියන 820 ක නොපියවා ඉතිරිව තිබූ තත්ත්වයට සාපේක්ෂව 2015 වසර අවසානය වනවිට එ.ජ. ඩොලර් මිලියන 986 ක නොපියවා ඉතිරිව ඇති තත්ත්වයක් වාර්තා කළේය.


### අනෙකුත් ලැබිය යුතු/ගෙවිය යුතු ගිණුම් සහ විශේෂ ගැනුම් හිමිකම්

**2015 වසර තුළ දී නොපියවා ඉතිරිව ඇති අනෙකුත් ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්වල තත්ත්වය ඉහළ ගියේය.** නොපියවා ඉතිරිව ඇති අනෙකුත් ලැබිය යුතු ගිණුම්වල තත්ත්වය තැන්පතු භාරගන්නා ආයතනවල අනෙකුත් ලැබිය යුතු ගිණුම්වල නොපියවා ඉතිරිව ඇති වත්කම් තත්ත්වය මත කලින් කලට වෙනස් විය හැකි අතර, 2015 වසර අවසානය වන විට එ.ජ. ඩොලර් මිලියන 1,236 ක නොපියවා ඉතිරිව ඇති තත්ත්වයක් වාර්තා විය. මේ අතර, ශ්‍රී ලංකා මහ බැංකුවට අයත් ආසියානු නිෂ්කාශන සංගමයේ (ACU) වගකීම් ඉහළ යෑම නිසා නොපියවා ඉතිරිව ඇති අනෙකුත් ගෙවිය යුතු ගිණුම් තත්ත්වය 2015 වසර අවසානය වන විට එ.ජ. ඩොලර් මිලියන 478 ක් දක්වා ඉහළ ගියේය.

### 5.9.4 විදේශීය සංචිත වත්කම් තත්ත්වය

**ශ්‍රී ලංකා මහ බැංකුව සහ රජය සතු විදේශීය සංචිත වත්කම්වලින් සමන්විත ශ්‍රී ලංකාවේ දළ නිල සංචිත වත්කම් තත්ත්වය 2015 වසර අවසානය වනවිට එ.ජ. ඩොලර් බිලියන 7.3 ක් විය.** 2014 වසර අවසානය වනවිට දළ නිල සංචිත මට්ටම එ.ජ. ඩොලර් බිලියන 8.2 ක් විය. විදේශීය ණය සේවාකරණ ගෙවීම්, කල් පිරුණු ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරය වෙනුවෙන් වූ ගෙවීම්, ජා.මූ. අරමුදලේ සමීපස්ථ ණය පහසුකමෙහි ගෙවීම් සහ දේශීය විදේශ විනිමය වෙළඳපොළ වෙත ද්‍රවශීලතාව සැපයීම වසර තුළ දී දළ නිල සංචිත අඩු වීමට හේතු විය. මේ අතර, දළ නිල සංචිත සහ තැන්පතු භාරගන්නා ආයතන සතු විදේශීය වත්කම්වලින් සමන්විත මුළු විදේශීය වත්කම් ප්‍රමාණය 2014 වසරේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් බිලියන 9.9 සිට 2015 වසරේ දී එ.ජ. ඩොලර් බිලියන 9.3 ක් දක්වා අඩු විය. වසර තුළ දී, දළ නිල සංචිත අඩු වීම හේතුවෙන් රටෙහි මුළු විදේශීය වත්කම් පහළ ගිය ද, තැන්පතු භාරගන්නා ආයතනවල විදේශීය වත්කම් වැඩි වීම හේතුවෙන් මුළු විදේශීය වත්කම් විශාල වශයෙන් පහළ යෑම වැළකුණි. දළ නිල සංචිතවල ප්‍රමාණාත්මකභාවය සැලකීමේ දී, 2015 වසර අවසානය වනවිට දළ නිල සංචිත ප්‍රමාණය භාණ්ඩ ආනයනික මාස 4.6කට ද භාණ්ඩ සහ සේවා ආනයනික මාස 3.8කට ද සමාන වූ අතර, එය ජාත්‍යන්තරව පිළිගත් සම්මතය වන ආනයනික මාස 3 ට වඩා ඉහළ මට්ටමකි. මේ අතර, මුළු විදේශීය වත්කම්,

**5.11 රූප සටහන** — **කාර්තුමය දළ නිල සංචිත සහ මුළු විදේශීය වත්කම්**



**5.11 සංඛ්‍යා සටහන**

### දළ නිල සංචිත, මුළු විදේශීය වත්කම් සහ සමස්ත ශේෂය

(කාලපරිච්ඡේදය අවසානයේදී තත්ත්වය)

| | එ.ජ.ඩොලර් මිලියන | | | | | රුපියල් මිලියන | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2011 | 2012 | 2013 | 2014 | 2015 (අ) | 2011 | 2012 | 2013 | 2014 | 2015 (අ) |
| 1. රජයේ විදේශීය වත්කම් | 615 | 631 | 465 | 635 | 470 | 70,088 | 80,209 | 60,857 | 83,262 | 67,690 |
| 2. මහ බැංකුවේ විදේශීය වත්කම් | 6,134 | 6,475 | 7,030 | 7,573 | 6,834 | 698,666 | 823,375 | 919,171 | 992,438 | 984,489 |
| 3. දළ නිල සංචිත වත්කම් (1+2) | 6,749 | 7,106 | 7,495 | 8,208 | 7,304 | 768,754 | 903,584 | 980,028 | 1,075,700 | 1,052,178 |
| 4. තැන්පතු භාරගන්නා ආයතනවල විදේශීය වත්කම් | 1,241 | 1,481 | 1,078 | 1,676 | 2,033 | 141,394 | 188,195 | 141,008 | 219,641 | 292,916 |
| 5. මුළු විදේශීය වත්කම් (3+4) (ආ) | 7,991 | 8,587 | 8,573 | 9,884 | 9,337 | 910,148 | 1,091,779 | 1,121,036 | 1,295,342 | 1,345,095 |
| 6. සංචිතවලට අදාළ වගකීම් (ඇ) | 2,737 | 2,943 | 2,347 | 1,691 | 2,275 | 311,773 | 373,984 | 306,825 | 221,593 | 327,725 |
| 7. ශුද්ධ ජාත්‍යන්තර සංචිත (3-6) | 4,012 | 4,163 | 5,148 | 6,517 | 5,029 | 456,981 | 529,600 | 673,203 | 854,107 | 724,453 |
| 8. සමස්ත ශේෂය (ඈ) | -1,059 | 151 | 985 | 1,369 | -1,489 | -105,712 | 72,619 | 143,603 | 180,904 | -129,654 |
| 9. දළ නිල සංචිත මගින් ආවරණය කළ හැකි ආනයනික මාස ගණන | | | | | | | | | | |
| 9.1 වෙළඳ භාණ්ඩ | 4.0 | 4.4 | 5.0 | 5.1 | 4.6 | | | | | |
| 9.2 වෙළඳ භාණ්ඩ හා සේවා | 3.6 | 3.9 | 4.2 | 4.3 | 3.8 | | | | | |
| 10. මුළු විදේශීය වත්කම් මගින් ආවරණය කළ හැකි ආනයනික මාස ගණන | | | | | | | | | | |
| 10.1 වෙළඳ භාණ්ඩ | 4.7 | 5.4 | 5.7 | 6.1 | 5.9 | | | | | |
| 10.2 වෙළඳ භාණ්ඩ හා සේවා | 4.3 | 4.7 | 4.8 | 5.1 | 4.9 | | | | | |

(අ) තාවකාලික

(ආ) 'විදේශයන්හි සිදුකරන ලද සෘජු ආයෝජන' සහ 'ලබා දුන් වෙළඳ ණය සහ අත්තිකාරම්' යන විදේශීය වත්කම් ඇතුළත් නොවේ.

(ඇ) මහ බැංකුවේ නොපියවා ඉතිරිව ඇති ණය (විශේෂ ගැනුම් හිමිකම් හැර)

(ඈ) කාලපරිච්ඡේදය තුළ දී ශුද්ධ ජාත්‍යන්තර සංචිත තත්ත්වයේ වෙනස් වීම්

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

භාණ්ඩ ආනයනික මාස 5.9කට සහ භාණ්ඩ හා සේවා ආනයනික මාස 4.9කට ද සමාන විය. 2015 වසර අවසානය වනවිට විදේශීය සංචිත වත්කම් ප්‍රමාණය රටෙහි කෙටි කාලීන ණය සහ වගකීම්වලින් සියයට 60 ක් ආවරණය කළේය.

## 5.10 විදේශීය ණය සහ ණය සේවාකරණය


### 5.10.1 විදේශීය ණය

2014 වසරේ දී එ.ජ. ඩොලර් බිලියන 42.9 ක් වූ රටෙහි මුළු විදේශීය ණය 2015 වසරේ දී එ.ජ. ඩොලර් බිලියන 44.8 ක් දක්වා ඉහළ ගිය අතර, එය ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස ගත්විට සියයට 53.6 ක සිට සියයට 54.4 දක්වා වැඩි වීමකි. විදේශීය ණය ලබා ගැනීම් මන්දගාමී වීම මෙන්ම ණය සුරැකුම්පත් කල්පිරීම් වෙනුවෙන් වූ ගෙවීම් සහ අනෙකුත් නියමිත ණය ආපසු ගෙවීම් මෙම නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය ප්‍රමාණයෙහි ඉහළ යෑම සාපේක්ෂව අඩු වීමට හේතු විය. විදේශ විනිමය අනුපාත තක්සේරු වෙනස්වීම් ඉහළ මට්ටමක පැවතීම නිසා නොපියවා ඉතිරිව ඇති ණය එ.ජ. ඩොලර් වශයෙන් දැක්වූ විට සුළු වැඩි වීමක් පමණක් පිළිබිඹු කළේය. මේ අතර, වසර ආරම්භයේ දී සහ අවසානයේ දී කෙටි කාලීන සහ දිගු කාලීන විදේශීය ණය සංයුතිය සමාන අගයක පැවතුණි.

විදේශීය ණය වගකීම්වලින් **(debt)** සියයට 58 ක් වූ නොපියවා ඉතිරිව ඇති ණය **(outstanding loans)**, 2015 වසර අවසානයේ දී පැවති මුළු විදේශීය ණය වගකීම්වල ප්‍රධාන සංරචකය විය. 2015 වසර අවසානය වන විට ණය සුරැකුම්පත් සහ මුදල් හා තැන්පතු වශයෙන් පැවති නොපියවා ඉතිරිව ඇති විවිධ ආයෝජන පිළිවෙළින් සියයට 24 ක් සහ සියයට 7 ක් විය. 2015 වසර අවසානයේ නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය වගකීම් ප්‍රමාණයෙහි ආංශික සංයුතිය සලකා බැලීමේ දී මුළු ණය වගකීම්වලින් වැඩිම

**5.12 රූප සටහන**

### විදේශීය ණය




5

විදේශීය අංශයේ ප්‍රවණතා සහ ප්‍රතිපත්ති

**5.12 සංඛ්‍යා සටහන**

**නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය**
**(BPM6 සංස්කරණයට අනුව සම්මත ඉදිරිපත් කිරීම)**

එ.ජ.ඩොලර් මිලියන
*(වසර අවසානයේදී තත්ත්වය)*

| ශීර්ෂය | 2014 (අ) | 2015 (ආ) |
|---|---|---|
| රජය | **24,132** | **24,681** |
| කෙටි කාලීන | **399** | **33** |
| ණය සුරැකුම්පත් | 399 | 33 |
| භාණ්ඩාගාර බිල්පත් (ඇ) | 399 | 33 |
| දිගු කාලීන | **23,733** | **24,647** |
| ණය සුරැකුම්පත් | 7,959 | 8,501 |
| භාණ්ඩාගාර බැඳුම්කර (ඇ) | 2,597 | 1,811 |
| ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර (ඈ) | 75 | 265 |
| ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර (ඉ) | 5,287 | 6,425 |
| ණය | 15,774 | 16,147 |
| මහ බැංකුව | **2,264** | **2,823** |
| කෙටි කාලීන | **443** | **483** |
| මුදල් සහ තැන්පතු | 6 | 5 |
| අනෙකුත් ගෙවිය යුතු ගෙවීම් | 437 | 478 |
| ආසියානු නිෂ්කාශන සංගමයේ වගකීම් | 437 | 478 |
| දිගු කාලීන | **1,821** | **2,340** |
| විශේෂ ගැනුම් හිමිකම් වෙන් කිරීම් | 573 | 548 |
| මුදල් සහ තැන්පතු | - | 1,100 |
| ණය | 1,248 | 692 |
| ජා.මූ. අරමුදලේ ණය | 1,248 | 692 |
| සමීපස්ථ ණය පහසුකම | 1,248 | 692 |
| තැන්පතු භාරගන්නා ආයතන | **8,133** | **9,156** |
| කෙටි කාලීන | **4,747** | **5,762** |
| මුදල් සහ තැන්පතු (ඊ) | 1,587 | 1,946 |
| වාණිජ බැංකු | 1,587 | 1,946 |
| ණය | 3,159 | 3,816 |
| වාණිජ බැංකු | 3,159 | 3,816 |
| දිගු කාලීන | **3,386** | **3,393** |
| ණය සුරැකුම්පත් (ඉ) | 2,263 | 2,140 |
| වාණිජ බැංකු | 1,037 | 1,112 |
| තැන්පතු භාරගන්නා අනෙකුත් ආයතන | 1,226 | 1,028 |
| ණය | 1,123 | 1,253 |
| වාණිජ බැංකු | 1,064 | 1,240 |
| තැන්පතු භාරගන්නා අනෙකුත් ආයතන | 59 | 13 |
| අනෙකුත් අංශ (උ) | **5,841** | **5,419** |
| කෙටි කාලීන | **1,674** | **1,299** |
| වෙළඳ ණය සහ අත්තිකාරම් (ඌ) | 1,674 | 1,299 |
| දිගු කාලීන | **4,167** | **4,120** |
| ණය සුරැකුම්පත් (ඉ) | 174 | 164 |
| ණය | 3,993 | 3,956 |
| පෞද්ගලික අංශය | 1,363 | 1,533 |
| රජය සතු වාණිජ ව්‍යවසායයන් සහ රාජ්‍ය සංස්ථා | 2,630 | 2,423 |
| සෘජු ආයෝජන : අන්තර් සමාගම් ණය (එ) | **2,544** | **2,719** |
| **දළ විදේශීය ණය තත්ත්වය** | **42,914** | **44,797** |
| **ද.දේ.නි. යේ ප්‍රතිශතයක් වශයෙන්** | | |
| දළ විදේශීය ණය | 53.6 | 54.4 |
| කෙටි කාලීන ණය | 9.1 | 9.2 |
| දිගු කාලීන ණය | 44.5 | 45.2 |
| **දළ විදේශීය ණයෙහි ප්‍රතිශතයක් වශයෙන්** | | |
| කෙටි කාලීන ණය | 16.9 | 16.9 |
| දිගු කාලීන ණය | 83.1 | 83.1 |
| **විශේෂිත අයිතමයන්** | | |
| **ණය සුරැකුම්පත්හි මුහුණත වටිනාකම - ආංශික වර්ගීකරණය** | **10,839** | **11,299** |
| රජය | 8,564 | 9,024 |
| භාණ්ඩාගාර බිල්පත් | 424 | 35 |
| භාණ්ඩාගාර බැඳුම්කර | 3,065 | 2,074 |
| ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර | 75 | 265 |
| ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර | 5,000 | 6,650 |
| මහ බැංකුව හැර තැන්පතු භාරගන්නා ආයතන | 2,100 | 2,100 |
| වාණිජ බැංකු | 1,000 | 1,100 |
| ලියාපදිංචි විශේෂිත බැංකු | 1,100 | 1,000 |
| අනෙකුත් අංශ | 175 | 175 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) පොත් අගය මත පදනම්ව
(ඈ) මුහුණත වටිනාකම මත පදනම්ව
(ඉ) වෙළඳපොළ මිල මත පදනම්ව
(ඊ) අනේවාසික විදේශ මුදල් හිමියන්ගේ තැන්පතු ඇතුළත් වේ.
(උ) පෞද්ගලික අංශය සහ රජය සතු වාණිජ ව්‍යවසායයන් ඇතුළත් වේ.
(ඌ) ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව සහ පෞද්ගලික අංශයේ සමාගම්හි නොපියවා ඉතිරිව ඇති වෙළඳ ණය ඇතුළත් වේ.
(එ) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි සමාගම්වල අන්තර් සමාගම් ණය සහ කොටස් හිමියන්ගේ අත්තිකාරම් ඇතුළත් වේ.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

කොටසක් නොපියවා ඉතිරිව ඇති රාජ්‍ය ණයවලින් සමන්විත වූ අතර, එය සියයට 55 ක් ලෙස ද, තැන්පතු භාර ගන්නා ආයතන, පෞද්ගලික අංශයේ ආයතන හා රජය සතු වාණිජ ව්‍යවසායයන්, ශ්‍රී ලංකා මහ බැංකුව සහ සෘජු ආයෝජන සමාගම්හි නොපියවා ඉතිරිව ඇති ණය වත්කම් ප්‍රමාණය මුළු ණය වත්කම් ප්‍රමාණයෙන් පිළිවෙළින් සියයට 20 ක්, සියයට 12 ක්, සියයට 6 ක් ලෙස සහ සියයට 6 ක් ලෙස විය.

### 5.10.2 විදේශීය ණය සේවාකරණ ගෙවීම්

**ශ්‍රී ලංකාවේ විදේශීය ණය වගකීම් මත වූ ණය සේවාකරණ ගෙවීම් 2015 වසරේ දී සැලකියයුතු ලෙස ඉහළ ගියේය.** 2014 වසරේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 2,323 ක් වූ ණය වාරික ගෙවීම් සහ එ.ජ. ඩොලර් මිලියන 1,156 ක් වූ පොලී ගෙවීම් සමඟ සැසඳීමේ දී 2015 වසරේ දී ණය වාරික ගෙවීම් සහ පොලී ගෙවීම් පිළිවෙළින් එ.ජ. ඩොලර් මිලියන 3,460 ක් සහ එ.ජ. ඩොලර් මිලියන 1,223 ක් දක්වා ඉහළ ගියේය. රජයේ විදේශීය ණය ගෙවීම් එ.ජ. ඩොලර් මිලියන 798 ක් ද ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර කල්පිරීම් එ.ජ. ඩොලර් මිලියන 500 ක් ද භාණ්ඩාගාර බිල්පත් කල්පිරීම් එ.ජ. ඩොලර් මිලියන 678 ක් ද ජා.මූ. අරමුදලේ සමීපස්ථ ණය පහසුකමට අදාළ ගෙවීම් එ.ජ. ඩොලර් මිලියන 507 ක් ද රජය සතු වාණිජ ව්‍යවසායයන් සහ තැන්පතු භාරගන්නා ආයතන විසින් විදේශීය ණය ආපසු ගෙවීම් එ.ජ. ඩොලර් මිලියන 577 ක් ද ශ්‍රී ලංකා මහ බැංකුව ඉන්දියානු සංචිත බැංකුව සමඟ ඇතිකරගත් විදේශීය විනිමය හුවමාරු ගිවිසුමට අදාළ එ.ජ. ඩොලර් මිලියන 400 ක ආපසු ගෙවීම් ද සමඟින් මුළු ණය වාරික ගෙවීම් ප්‍රමාණය ඉහළ ගියේය. ණය වාරික සහ පොලී ගෙවීම් ඉහළ යෑම සහ භාණ්ඩ අපනයනය අඩු වීම හේතුවෙන් භාණ්ඩ සහ සේවා අපනයනයෙහි ප්‍රතිශතයක් ලෙස ණය සේවාකරණ ගෙවීම් පසුගිය වසරේ වාර්තා වූ සියයට 20.8 සමඟ සැසඳීමේ දී 2015 වසරේ දී සියයට 27.7 ක් දක්වා සැලකියයුතු ලෙස ඉහළ ගියේය. අනාගතයේ දී අපේක්ෂිත ණය ගැනීමේ අවශ්‍යතා සපුරා ගැනීම සඳහා විදේශීය සෘජු ආයෝජන සහ අපනයන සේවා වැනි ණය නොවන මූල්‍ය ලැබීම් සැලකියයුතු ලෙස වැඩි නොවුනහොත් භාණ්ඩ අපනයනවල අපේක්ෂිත මධ්‍යස්ථ වර්ධනයත්, ගෝලීය පොලී අනුපාතික අපේක්ෂිත පරිදි ක්‍රමානුකූලව ඉහළ යෑමත් ණය මගින් මූල්‍යයනය කළ යුතු මූල්‍ය අවශ්‍යතාවයන් ඉහළ යෑමත් හේතුවෙන් ණය සේවාකරණ ගෙවීම් භාණ්ඩ සහ සේවාවල ප්‍රතිශතයක් ලෙස තවදුරටත් ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරෙයි.

**5.13 සංඛ්‍යා සටහන**

**විදේශීය ණය සේවාකරණ ගෙවීම් (අ)**

| ශීර්ෂය | එ.ජ.ඩොලර් මිලියන | | | | | රුපියල් මිලියන | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2011 | 2012 | 2013 | 2014 (ආ) | 2015 (ඇ) | 2011 | 2012 | 2013 | 2014 (ආ) | 2015 (ඇ) |
| **1. ණය සේවාකරණ ගෙවීම්** | **1,797** | **2,675** | **4,040** | **3,479** | **4,683** | **198,662** | **341,382** | **521,626** | **454,248** | **636,614** |
| **1.1 ණය ආපසු ගෙවීම්** | **1,090** | **1,795** | **2,982** | **2,323** | **3,460** | **120,569** | **229,049** | **384,942** | **303,347** | **470,301** |
| රජය | 884 | 1,490 | 1,555 | 1,296 | 1,976 | 97,732 | 190,088 | 200,705 | 169,150 | 268,583 |
| ව්‍යාපෘති ණය | 789 | 862 | 836 | 793 | 798 | 87,263 | 109,975 | 107,906 | 103,540 | 108,503 |
| ණය සුරැකුම්පත් | 95 | 628 | 719 | 503 | 1,178 | 10,469 | 80,114 | 92,799 | 65,610 | 160,081 |
| මහ බැංකුව | 11 | 57 | 653 | 719 | 907 | 1,245 | 7,268 | 84,285 | 93,917 | 123,229 |
| ජාත්‍යන්තර මූල්‍ය අරමුදල | 11 | 57 | 453 | 719 | 507 | 1,245 | 7,268 | 58,463 | 93,917 | 68,854 |
| විනිමය හුවමාරු ගිවිසුම් සහ වෙනත් ණය වගකීම් | - | - | 200 | - | 400 | - | - | 25,822 | - | 54,375 |
| පෞද්ගලික අංශය සහ තැන්පතු භාර ගන්නා ආයතන | 195 | 248 | 774 | 309 | 577 | 21,592 | 31,692 | 99,952 | 40,280 | 78,489 |
| විදේශීය ණය | 195 | 248 | 774 | 309 | 577 | 21,592 | 31,692 | 99,952 | 40,280 | 78,489 |
| ණය සුරැකුම්පත් | - | - | - | - | - | - | - | - | - | - |
| **1.2 පොලී ගෙවීම්** | **706** | **880** | **1,059** | **1,156** | **1,223** | **78,093** | **112,333** | **136,685** | **150,901** | **166,313** |
| රජය | 591 | 702 | 832 | 876 | 867 | 65,292 | 89,547 | 107,357 | 114,368 | 117,843 |
| ව්‍යාපෘති ණය | 363 | 294 | 255 | 260 | 266 | 40,149 | 37,464 | 32,982 | 33,883 | 36,150 |
| ණය සුරැකුම්පත් | 227 | 408 | 576 | 616 | 601 | 25,143 | 52,083 | 74,376 | 80,485 | 81,693 |
| මහ බැංකුව | 10 | 43 | 35 | 20 | 13 | 1,082 | 5,512 | 4,507 | 2,546 | 1,714 |
| ජාත්‍යන්තර මූල්‍ය අරමුදල | 10 | 36 | 33 | 20 | 10 | 1,082 | 4,593 | 4,313 | 2,546 | 1,402 |
| අනෙකුත් | - | 7 | 2 | - | 2 | - | 919 | 194 | - | 311 |
| පෞද්ගලික අංශය සහ තැන්පතු භාර ගන්නා ආයතන | 106 | 135 | 192 | 260 | 344 | 11,719 | 17,274 | 24,820 | 33,986 | 46,757 |
| විදේශීය ණය | 106 | 135 | 145 | 118 | 185 | 11,719 | 17,274 | 18,663 | 15,470 | 25,097 |
| ණය සුරැකුම්පත් | - | - | 48 | 142 | 159 | - | - | 6,157 | 18,517 | 21,660 |
| **2. වෙළඳ භාණ්ඩ හා සේවාවන්ගේ අපනයන ඉපැයුම්** | **13,643** | **13,573** | **15,079** | **16,735** | **16,902** | | | | | |
| **3. වෙළඳ භාණ්ඩ හා සේවා අපනයන ඉපැයුම්, ආදායම් හා ජංගම සංක්‍රාම** | **19,314** | **19,754** | **21,639** | **23,936** | **24,036** | | | | | |
| **4. ණය සේවාකරණ අනුපාතිකය** | | | | | | | | | | |
| 4.1 ඉහත 2 හි ප්‍රතිශතයක් වශයෙන් | | | | | | | | | | |
| සමස්ත අනුපාතිකය | 13.2 | 19.7 | 26.8 | 20.8 | 27.7 | | | | | |
| ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ගනුදෙනු හැර | 13.0 | 19.0 | 23.6 | 16.4 | 24.7 | | | | | |
| 4.2 ඉහත 3 හි ප්‍රතිශතයක් වශයෙන් | | | | | | | | | | |
| සමස්ත අනුපාතිකය | 9.3 | 13.5 | 18.7 | 14.5 | 19.5 | | | | | |
| ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ගනුදෙනු හැර | 9.2 | 13.1 | 16.4 | 11.4 | 17.3 | | | | | |
| **5. රජයේ ණය සේවාකරණ ගෙවීම්** | | | | | | | | | | |
| 5.1 රජයේ ණය සේවාකරණ ගෙවීම් (ඈ) | 1,474 | 2,191 | 2,386 | 2,172 | 2,843 | | | | | |
| 5.2 ඉහත 1 හි ප්‍රතිශතයක් වශයෙන් | 82.1 | 81.9 | 59.1 | 62.4 | 60.7 | | | | | |

(අ) BMP6 සංස්කරණයට අදාළ සම්මත ඉදිරිපත් කිරීමට හැකිතාක් දුරට අනුගත වීම සඳහා පසුගිය වසරේ සිට විදේශීය ණය සේවාකරණ ආංශික වර්ගීකරණය වෙනස් කොට ඇත.

මූලයː ශ්‍රී ලංකා මහ බැංකුව

(ආ) සංශෝධිත
(ඇ) තාවකාලික
(ඈ) ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි ගනුදෙනු හැර

## 5.11 විනිමය අනුපාතිකයේ වෙනස්වීම්

2015 වසරේ පළමු මාස අට තුළ දී ශ්‍රී ලංකා රුපියල සාපේක්ෂව ස්ථාවර මට්ටමක පැවතිය ද, විනිමය අනුපාතිකය වඩා නම්‍යශීලීව තීරණය වීමට ඉඩහැරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ගනු ලැබූ තීරණයත් සමඟ රුපියල සැලකියයුතු ලෙස අවප්‍රමාණය විය. වසර තුළ දී අපේක්ෂිත ප්‍රමාණයට වඩා අඩු විදේශ විනිමය ඉපැයීම් සමඟ විදේශ විනිමය ගෙවීම් ඉහළ මට්ටමක පැවතීම හේතුවෙන් විනිමය අනුපාතිකය මත සැලකියයුතු පීඩනයක් ඇති විය. ඇමෙරිකා එක්සත් ජනපදයේ පොලී අනුපාතික ඉහළ යනු ඇතැයි වූ අපේක්ෂාව සහ ඉන් අනතුරුව පොලී අනුපාතික ඉහළ යෑම හමුවේ රජයේ රුපියල් සුරැකුම්පත් වෙළඳපොළ වෙතින් විදේශීය ආයෝජන ඉවත් කරගැනීම, ඉන්ධන නොවන ආනයන වියදම ඉහළ යෑම සහ විදේශීය ණය සේවාකරණ ගෙවීම් හමුවේ විදේශ විනිමය සඳහා වූ ඉල්ලුම ඉහළ යෑම මේ සඳහා මූලිකවම හේතු විය. එ.ජ. ඩොලරයට එරෙහිව ශ්‍රී ලංකා රුපියල අඛණ්ඩව අවප්‍රමාණය වීම සඳහා වූ පීඩනය, දේශීය විදේශ විනිමය වෙළඳපොළෙහි ඇති වූ

5

විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වය සහ ප්‍රතිපත්ති

**5.14 සංඛ්‍යා සටහන**

## විනිමය අනුපාතික වෙනස්වීම්

| මුදල් වර්ගය | විදේශ ව්‍යවහාර මුදල් ඒකකයකට රුපියල් අගය | | | | | | පෙර වර්ෂයට වඩා ප්‍රතිශතක වෙනස්වීම (අ) | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | වර්ෂය අග අනුපාතිකය | | | වාර්ෂික සාමාන්‍යය අනුපාතිකය | | | වර්ෂය අග | | වාර්ෂික සාමාන්‍යය | |
| | 2013 | 2014 | 2015 | 2013 | 2014 | 2015 | 2014 | 2015 | 2014 | 2015 |
| යූරෝ | 180.45 | 159.42 | 157.37 | 171.51 | 173.47 | 150.84 | 13.19 | 1.30 | -1.13 | 15.00 |
| ඉන්දියානු රුපියල් | 2.11 | 2.07 | 2.17 | 2.21 | 2.14 | 2.12 | 2.13 | -4.62 | 3.28 | 1.12 |
| ජපන් යෙන් | 1.25 | 1.10 | 1.20 | 1.32 | 1.24 | 1.12 | 13.48 | -8.20 | 7.17 | 10.08 |
| බ්‍රිතාන්‍ය පවුම් | 215.58 | 204.04 | 213.57 | 202.08 | 215.16 | 207.99 | 5.65 | -4.46 | -6.08 | 3.45 |
| එක්සත් ජනපද ඩොලර් | 130.75 | 131.05 | 144.06 | 129.11 | 130.56 | 135.94 | -0.23 | -9.03 | -1.11 | -3.96 |
| විශේෂ ගැනුම් හිමිකම් | 201.36 | 189.86 | 199.63 | 196.19 | 198.35 | 190.16 | 6.05 | -4.89 | -1.09 | 4.31 |
| **සඵල විනිමය අනුපාතික දර්ශක (ආ) (ඇ) (2010 = 100)** | **වර්ෂය අග දර්ශකය** | | | **වාර්ෂික සාමාන්‍යය දර්ශකය** | | | **පෙර වර්ෂයට වඩා ප්‍රතිශතක වෙනස්වීම** | | | |
| | | | | | | | **වර්ෂය අග දර්ශකය** | | **වාර්ෂික සාමාන්‍යය දර්ශකය** | |
| | **2013** | **2014** | **2015** | **2013** | **2014** | **2015** | **2014** | **2015** | **2014** | **2015** |
| නා.ස.වි.අ.-මුදල් වර්ග 24 පැස අනුව | 90.97 | 96.44 | 93.53 | 91.39 | 91.99 | 96.61 | 6.02 | -3.02 | 0.66 | 5.02 |
| මූ.ස.වි.අ.-මුදල් වර්ග 24 පැස අනුව | 100.30 | 106.30 | 103.90 | 100.61 | 101.94 | 106.18 | 5.97 | -2.26 | 1.32 | 4.16 |

(අ) වෙනස්වීම ගණන් බලා ඇත්තේ ශ්‍රී ලංකා රුපියලට අදාළ විදේශීය ව්‍යවහාර මුදල් වටිනාකම පදනම් කර ගෙනය. සෘණ ලකුණින් ශ්‍රී ලංකා රුපියලෙහි අගය විදේශ ව්‍යවහාර මුදල් ඒකකයට එරෙහිව අඩු වීම පෙන්නුම් කරයි.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව


(ආ) නාමික සඵල විනිමය අනුපාතිකය (නා.ස.වි.අ.) යනු වෙළඳ හවුල්කරුවන් සහ තරගකාරී රටවල් 24 ක නාමික විනිමය අනුපාතිකයන්ගේ බර තැබූ සාමාන්‍යයයි. බර ප්‍රමාණය, මුදල් පැසට ඇතුළත් එක් එක් රට සමග සිදු කරන වෙළඳාමෙහි වැදගත්කම මත පදනම් වේ. මූර්ත සඵල විනිමය අනුපාතිකය (මූ.ස.වි.අ.) ගණනය කරනුයේ පැසට ඇතුළත් මුදල් වර්ග අයත් රටවල උද්ධමන වෙනස නා.ස.වි.අ.ට ගැලපීම මගිනි. සෘණ ලකුණින් දර්ශකය අවප්‍රමාණය වීම පෙන්වයි. මූ.ස.වි.අ. කොළඹ පාරිභෝගික මිල දර්ශකය පදනම් කරගෙන ගණනය කර ඇත.

(ඇ) විනිමය අනුපාතික දර්ශකයන් අනුව අර්ථ දක්වා ඇති අතර, ඒ අනුව අනෙකුත් ව්‍යවහාර මුදල්වලට සාපේක්ෂව රුපියලෙහි අගය වැඩිවීම හෝ අඩුවීම සඵල විනිමය අනුපාතිකයන්හි අගය ඉහළයාම හෝ පහළයාම මගින් පිළිවෙළින් පිළිබිඹු කෙරෙයි.

විචලනයන් අවම කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවෙහි නිරන්තර මැදිහත් වීමේ අවශ්‍යතාවය ඇති කළේය. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ශුද්ධ පදනම මත එ.ජ. ඩොලර් බිලියන 1.9 ක් සැපයීම හේතුවෙන් වසරේ පළමු මාස අට තුළ දී එ.ජ. ඩොලරයට සාපේක්ෂව රුපියල සියයට 2.42 ක සුළු අවප්‍රමාණය වීමක් වාර්තා කළේය. කෙසේ නමුත්, 2015 සැප්තැම්බර් මස 03 වැනි දින ශ්‍රී ලංකා මහ බැංකුව දේශීය විදේශ විනිමය වෙළඳපොළට මැදිහත් වීම සීමා කිරීමට තීරණය කළ අතර, විනිමය අනුපාතිකය වෙළඳපොළ ඉල්ලුම් සැපයුම් බලවේග මත තීරණය වීමට ඉඩ සලසන ලදී. මෙහි ප්‍රතිඵලයක් ලෙස සැප්තැම්බර් මස 04 වැනි දින සිට 2015 වසර අවසානය දක්වා කාලපරිච්ඡේදය තුළ දී රුපියල එ.ජ. ඩොලරයට එරෙහිව සියයට 6.64 කින් අවප්‍රමාණය විය.

**5.13 රූප සටහන**

## විනිමය අනුපාතිකයේ වෙනස්වීම්



සමස්තයක් ලෙස, 2015 වසර අවසාන වනවිට රුපියල, එ.ජ. ඩොලරයට එරෙහිව රුපියල් 144.06 දක්වා සියයට 9.03 කින් අවප්‍රමාණය විය. එ.ජ ඩොලරයට එරෙහිව රුපියලෙහි වාර්ෂික සාමාන්‍යය විනිමය අනුපාතිකය 2014 වසරේ දී වූ රුපියල් 130.56 සිට 2015 වසරේ දී රුපියල් 135.94 දක්වා අවප්‍රමාණය විය.

**මේ අතර, විදේශ ව්‍යවහාර මුදල්වල හැසිරීම මත පදනම්ව, ශ්‍රී ලංකා රුපියල 2015 වසරේ දී අනෙකුත් ප්‍රධාන මුදල් වර්ගයන්ට එරෙහිව මිශ්‍ර ක්‍රියාකාරිත්වයක් පෙන්නුම් කළේය.** ඒ අනුව, ශ්‍රී ලංකා රුපියල ස්ටර්ලින් පවුමට එරෙහිව සියයට 4.46 කින් ද, ජපන් යෙන්වලට එරෙහිව සියයට 8.20 කින් ද, ඉන්දියානු රුපියලට එරෙහිව සියයට 4.62 කින් ද අවප්‍රමාණය වූ අතර, යුරෝවලට එරෙහිව සියයට 1.30 කින් අතිප්‍රමාණය විය. ජාත්‍යන්තර වෙළඳපොළ තුළ එ.ජ. ඩොලරයට එරෙහිව ප්‍රධාන මුදල් වර්ගවල හැසිරීමෙහි සමස්ත බලපෑම පිළිබිඹු කරමින්, ශ්‍රී ලංකා රුපියල 2015 වසරේ දී විශේෂ ගැනුම් හිමිකම් (වි.ගැ.හි)වලට එරෙහිව සියයට 4.89 කින් අවප්‍රමාණය විය.


### 5.11.1 නාමික සහ මූර්ත සඵල විනිමය අනුපාතික

**2015 වසර තුළ දී මුදල් වර්ග 5 කින් සහ මුදල් වර්ග 24 කින් සැදුම්ලත් පැස මත පදනම් වූ සඵල විනිමය අනුපාතික දර්ශක අවප්‍රමාණය විය.** 2015 වසර තුළ දී, විදේශ ව්‍යවහාර මුදල්වල විනිමය අනුපාතික වෙනස්වීම් සහ පැසෙහි ඇතුළත් බොහෝ ව්‍යවහාර මුදල්වලට එරෙහිව ශ්‍රී ලංකා රුපියල නාමිකව අවප්‍රමාණය වීම පිළිබිඹු කරමින් මුදල් වර්ග 5 කින් සහ මුදල් වර්ග 24 කින් සැදුම්ලත් පැස මත පදනම් වූ නාමික සඵල විනිමය අනුපාතික දර්ශක (2010=100) පිළිවෙළින් සියයට 4.12 කින් සහ සියයට 3.02 කින් අවප්‍රමාණය විය. නාමික විනිමය අනුපාතිකයන්හි වෙනස් වීම්වලට අමතරව රටවල් අතර උද්ධමන වෙනස්වීම් සැලකිල්ලට ගැනෙන මූර්ත සඵල විනිමය අනුපාතිකය ද මෙම කාලපරිච්ඡේදය තුළ දී අවප්‍රමාණය විය. ඒ අනුව, වසර තුළ දී මුදල් වර්ග 5 සහ මුදල් වර්ග 24 කින් සැදුම්ලත් පැස මත පදනම් වූ මූර්ත සඵල විනිමය අනුපාතික දර්ශකයන් පිළිවෙළින් සියයට 3.07 කින් සහ සියයට 2.26 කින් අවප්‍රමාණය විය. මූර්ත සඵල විනිමය අනුපාතික දර්ශකයන්හි මෙම අවප්‍රමාණය වීම සඳහා නාමික සඵල විනිමය අනුපාතික දර්ශකයන්හි අවප්‍රමාණය වීම සහ බොහෝ වෙළඳ හවුල්කාර හා තරගකාරී රටවලට සාපේක්ෂව දේශීය උද්ධමනය පහළ මට්ටමක පැවතීම හේතු විය.

### 5.11.2 දේශීය විදේශ විනිමය වෙළඳපොළ වර්ධනයන්

**2015 වසරේ දී දේශීය විදේශ විනිමය වෙළඳපොළ ගනුදෙනු ප්‍රමාණය 2014 වසරේ දී වාර්තා කළ වර්ධනය වීමට සාපේක්ෂව පහළ ගියේය.** මුළු ගනුදෙනු ප්‍රමාණයෙන් සියයට 50.5 ක් වන එතැන් වෙළඳපොළ ගනුදෙනු ප්‍රමාණය අඩු වීම මේ සඳහා මූලිකවම හේතු විය. 2015 වසර තුළ දී එතැන් වෙළඳපොළ මුළු ගනුදෙනු ප්‍රමාණය 2014 වසරේ දී වූ එ.ජ. ඩොලර් මිලියන 8,804 සමග සැසඳීමේ දී එ.ජ. ඩොලර් මිලියන 6,867 ක් දක්වා කැපී පෙනෙන ලෙස අඩු වූ අතර, විදේශ වෙළඳාම මන්දගාමී වීම සහ දේශීය විදේශ විනිමය වෙළඳපොළ වෙත සීමිත විදේශ විනිමය ප්‍රමාණයක් ලැබීම මේ සඳහා මූලිකවම හේතු විය. කෙසේ නමුත්, 2015 වසරේ දී ඉදිරි වෙළඳපොළ මුළු ගනුදෙනු ප්‍රමාණය 2014 වසරේ දී වූ එ.ජ. ඩොලර් මිලියන 6,672 ට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 6,732 දක්වා සුළු වශයෙන් වැඩි විය. සමස්තයක් ලෙස, 2015 වසරේ දී අන්තර් බැංකු මුළු විදේශ විනිමය ගනුදෙනු ප්‍රමාණය 2014 වසරේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 15,475 ට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 13,600 ක් දක්වා අඩු විය. මේ අතර, වසර තුළ දී ශ්‍රී ලංකා මහ බැංකුව ශුද්ධ සැපයුම්කරුවෙකු ලෙස දේශීය විදේශ විනිමය වෙළඳපොළ වෙත මැදිහත් විය. ඒ අනුව, 2015 වසර තුළ ශ්‍රී ලංකා මහ බැංකුව එ.ජ. ඩොලර් මිලියන 3,429 ක් වෙළඳපොළට සැපයීමෙන් සහ එ.ජ. ඩොලර් මිලියන 179 ක් අවශෝෂණය කර ගැනීමෙන් දේශීය විදේශ විනිමය වෙළඳපොළ වෙත මැදිහත් වූ අතර, වසර තුළ දී සපයන ලද ශුද්ධ විදේශ විනිමය ප්‍රමාණය එ.ජ. ඩොලර් මිලියන 3,250 ක් වේ. කෙසේ නමුත්, වසරේ අවසාන මාස හතර තුළ දී විදේශ විනිමය සැපයීම, විදේශ ආයෝජකයින් විසින් රජයේ රුපියල් සුරැකුම්පත් වෙළඳපොළ වෙතින් සිය අරමුදල්

**5.14 රූප සටහන** කාර්තුමය අන්තර් බැංකු ඉදිරි විනිමය ගනුදෙනු පරිමාවන්



ඉවත් කර ගැනීම හේතුවෙන් විදේශ විනිමය සඳහා ඇති වූ ඉල්ලුම ආවරණය කිරීම සහ තෙල් ආනයන බිල්පත් කිහිපයක් පියවීම සඳහා සීමා විය.

**2015 වසරේ දී සමස්තයක් ලෙස මාස තුන සහ මාස හය සඳහා වන ඉදිරි විනිමය ගනුදෙනු අධි මිල පොලී අනුපාතික අන්තරයට වඩා පහළ මට්ටමක පැවතුණි.** දේශීය විදේශ විනිමය වෙළඳපොළ වෙත ඉදිරි කාලයේ දී අඛණ්ඩව මූල්‍ය ප්‍රවාහ ලැබෙනු ඇතැයි යන වෙළඳපොළ අපේක්ෂාව එයින් පිළිබිඹු විය. කෙසේ වුවත්, කෙටි කාලීනව විනිමය අනුපාතිකය අවප්‍රමාණය වනු ඇතැයි යන වෙළඳපොළ අපේක්ෂාව පිළිබිඹු කරමින් 2015 වසරේ වැඩි කාලයක් පුරාවට මාසයක් සඳහා වන ඉදිරි විනිමය ගනුදෙනු අධි මිල පොලී අනුපාතික අන්තරයට වඩා ඉහළ මට්ටමක පැවතුණි. වසර තුළ දී සමස්තයක් ලෙස ධන මට්ටමක පවත්වා ගනු ලැබූ වාණිජ බැංකුවල ශුද්ධ අනාවරණ තත්ත්වය මගින් ද කෙටි කාලීනව එ.ජ. ඩොලරයට එරෙහිව රුපියල අවප්‍රමාණය වනු ඇතැයි යන අපේක්ෂාව පිළිබිඹු කෙරිණි.